# නිවනේ නිවීම

## අටවන වෙළුම



කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

# නිවනේ නිවීම

## (දෙසුම් පෙළකි)

අටවන වෙළුම - දෙවන මුද්‍රණය

*(22-24 දෙසුම්)*

**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර,
දේවාලේගම

**ISBN 955-8832-12-x**

ප්‍රකාශනය
ධර්මග්‍රන්ථ මුද්‍රණ භාරය
මහාභාරකාර දෙපාර්තමේන්තුව

## ධර්මදානයකි

මුදලට විකිණීම සපුරා තහනම් වෙයි.

ප්‍රථම මුද්‍රණය - 2000 අගෝස්තු

## පොත ලබාගත හැකි ස්ථාන

.1. පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව' කන්දේගෙදර, දේවාලේගම.

2 රෝයල් ඉන්ස්ටිටියුට්,
191, හැව්ලොක් පාර,
කොළඹ 5.

3. ඩී. ටී. වේරගල මහතා
422, වැලිපාර, තලවතුගොඩ.

4. අනුර රූපසිංහ මහතා
27, කොළඹ වීදිය, මහනුවර

5. මහා භාරකාර දෙපාර්තමේන්තුව
2, බුලර්ස් පටුමග,
කොළඹ 07.

*මුද්‍රණය*
කොලිටි ප්‍රින්ටර්ස්
17/2, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල,
නුගේගොඩ.
ටෙලි : 011-4302312

මෙම දේශනාමාලාව පැවැත්වීමට ආරාධනාකොට

අප ධෛර්යවත් කළ

මීතිරිගල නිස්සරණ වන සේනාසනාධිපතිව වැඩවිසූ

අපවත් වී වදාළ

අතිපූජනීය, මහෝපාධ්‍යාය

## මාතර ශ්‍රී ඥානාරාමාභිධාන

අප ගුරුදේවයන් වහන්සේගේ ශ්‍රී නාමයට

## 'නිවනේ නිවීම'

පූජෝපහාරයක්ම වේවා!

එතං සන්තං

එතං පණීතං

යදිදං

සබ්බ සංඛාර සමථො

සබ්බූපධිපටිනිස්සග්ගො

තණ්හක්ඛයො

විරාගො

නිරොධො

නිබ්බානං



"මෙය ශාන්තය

මෙය ප්‍රණීතය

එනම්

සියලු සංස්කාරයන්ගේ සංසිඳීම

සියලු උපධීන් අතහැර දැමීම

තණ්හාව ක්ෂය කිරීම

නොඇල්ම නම්වූ විරාගය

නැවැත්ම නම් වූ නිරෝධය

නිවීම නම් වූ නිබ්බානය"

# පටුන


| | පිටු |
|---|---|
| හැඳින්වීම | vi |
| ප්‍රකාශක නිවේදනය | x |
| අමා ගඟ | xi |
| ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය | xiii |
| ග්‍රන්ථ සංකේත නිරූපණය | xiv |
| 'නිවනේ නිවීම' - 22 | 1 |
| 'නිවනේ නිවීම' - 23 | 25 |
| 'නිවනේ නිවීම' - 24 | 49 |

# හැඳින්වීම

බුද්ධ දේශනාවෙහි දැක්වෙන ප්‍රතිපත්ති මාර්ගයේ අවසාන පරමාර්ථය වන 'නිවන' පිළිබඳව ඈත අතීතයේ පටන්ම විවිධ මතිමතාන්තර ප්‍රකාශයට පත් වී ඇත. ආර්ය අෂ්ටාංගික මාර්ගය 'සම්මා දිට්ඨි' නම් වූ 'හරි දැක්ම' පෙරටු කරගත් ප්‍රතිපදාවකි. එබැවින් ඒ මාර්ගයෙහි ගමන් කරන්නෙකුට ගමනෙහි ඉලක්කය ගැන නිරවුල් අවබෝධයක් ඇතිවිය යුතුමය. බුද්ධ වචනයට අනුකූලව එවැනි අවබෝධයකට මග හෙළි කිරීම මෙම දේශනා මාලාවේ පරමාර්ථය විය.

මීතිරිගල නිස්සරණ වන සෙනසුනෙහි ප්‍රධාන කර්මස්ථානාචාර්යයන් වහන්සේ වශයෙන් වැඩ විසූ, අපවත් වී වදාළ අතිපූජනීය මහෝපාධ්‍යාය මාතර ශ්‍රී ඤාණාරාම මාහිමිපාණන් වහන්සේ විසින් අප වෙත කරන ලද සමාරාධනය මේ දේශනා පෙළට ආසන්න නිමිත්ත විය. අපගේ ගුරුදේවයන් වහන්සේ වූ උන්වහන්සේ, මෙයට වසර කීපයකට පෙර නිස්සරණ වන යෝගාවචර සඟ පිරිසට ඉදිරිපත්වූ එක්තරා ධර්ම ගැටළුවකදී 'නිවන' පිළිබඳව දේශනා පෙළක් පැවැත්වීම ප්‍රයෝජනවත් විය හැකි බවත්, ඒ දේශනා පටිගත කරගැනීමට කටයුතු යෙදිය හැකි බවත් පවසමින් අප වෙත කරන ලද දයාන්විත ආරාධනය පිළිගැනීමට මුලදී පසුබට වීමු. යළිත් එම ආරාධනාව කළ අවස්ථාවේදී, එසේ පසුබට වීමට එක් හේතුවක් වශයෙන් අප සඳහන් කළේ 'නිවන' සම්බන්ධයෙන් දැනට ප්‍රචලිතව ඇති ඇතැම් මතිමතාන්තර කෙරෙහි අප දක්වන වෙනස් ආකල්පය නිසා ඇතිවිය හැකි ප්‍රතිචාරයය. එවිට උන්වහන්සේ වදාළේ: "ඒකට කමක් නෑ...... මා ආරාධනා කළ බව දේශනාවේදීම කියන්න" යනුවෙනි.

ඒ සා උදාර පැවරීමකින් උත්සාහවත්ව ආරම්භ කැරුණු මෙම දේශනා මාලාව දෙවසරකට වැඩි කාලයක් තිස්සේ (1988.08.12-1991.01.30) දෙපෝයකට වරක් බැගින් අප ගුරුදේවයන් වහන්සේගේ අතිපූජනීය පාදමූලයේදී නිස්සරණ වනයේ අප සබ්‍රහ්මචාරී ගරුතර යෝගාවචර සඟ පිරිස හමුවේ පවත්වන්නට යෙදුණි. ගිලන්වූ ඇතැම් අවස්ථාවලදී පවා මාහිමිපාණන් වහන්සේ යහන්ගතව දෙසුමට සවන් දුන්හ. උන්වහන්සේ බැහැර සෙනසුනෙක වැඩ විසූ එක් අවස්ථාවෙක, මාහිමිපාණන් වහන්සේ මුල'සුනෙහි නොමැතිව දේශනා පැවැත්වීම සම්බන්ධයෙන් පැනනැඟුනු ප්‍රශ්නයක් නිසා එක් දේශනා වාරයක් මඟ හැරුණි. ඒ බැව් සැළවූ විට. නොකඩවාම දේශනාමාලාව පැවැත්විය යුතු බවත්, තමන් වහන්සේට ඒ දෙසුම් පටිගත කළ පසුව වුවද ඇසිය හැකි බවත්, උන්වහන්සේ වදාළහ.

අප ගුරු දේවයන් වහන්සේගේ ඒ උදාර මුදිතා ගුණයට හා ධර්මකාමී ශාසන දයාවට නමස්කාර වේවා!

දෙසුම් 33 කින් පරිමිත මෙම දේශනා මාලාව පැවැත්වීමේදී අප අනුගමනය කළ විවරණ මාර්ගය අනුව හේතුසාධක වශයෙන් පෙළ අටුවා ආදියෙන් කොතෙකුත් උද්‍ධෘත පාඨ ගෙනහැර දැක්වීමට සිදුවිය. ඒ අනුව එක්තරා බුද්ධිගෝචර රටාවක් මෙහි දැකිය හැකි නමුදු අප පරමාර්ථය වූයේ සද්ධර්මයේ සජීව ප්‍රායෝගික පක්ෂය ඉස්මතු කර දීමමය. ඇතැම් විට හුදු බුද්ධිවාදයක අතරමං වී සිටින උගතුන් කිසියම් ධර්මප්‍රබෝධයක් තුළින් ප්‍රතිපදාව වෙතට යොමුකරවා ගැනීමට මේ විවරණ මාර්ගය උපකාරවත් විය හැකිය. කෙසේ හෝ වේවා, යමෙකුට ධර්මරසය විඳිමින්ම දෙසුමකට සවන්දිය හැකිවන අයුරින් විවිධ උපමා, උපමා කථා, නිදර්ශන ආදියෙන් දෙසුම් පෙළ පණපෙවීමට උත්සාහවත් වීමු. බුදු පියාණන් වහන්සේ වදාළ පරිදිම, "මෙහි ඇතැම් නුවණැති පුරුෂයෝ උපමාවෙකිනුදු දෙසුමෙක අරුත මැනැවින් වටහා ගනිත්".

අසන්නවුන්ගේ අවධානය නොවිසිරෙන අයුරින් මුතු ඇට පෙළක් නූලක අවුණන්නාක් මෙන් ධර්ම කාරණා සාධක සහිතව ගොනු කර දැක්වීම දේශනාවක් තුළ දී කළ හැකි පහසු කාර්යයක් නොවේ. එබැවින් එවැනි ගැටමුසු තැන්වලදී හේතුසාධක කීපයක් පමණක් දැක්වීමෙන් සෑහීමකට පත්වීමට සිදුවිය. එහිලා වඩාත් සවිස්තර විවරණ විග්‍රහ අප අතින් ලියැවී පළවූ ග්‍රන්ථ කීපයක ඇතුළත් වී ඇත.[1]

දෙසුම් පෙළ නිමකොට සත්වසරකට පසු "නිවනේ නිවීම" නමින් එළිදැක්වෙන මෙම ග්‍රන්ථයෙන් යම් ශාසනාර්ථයක් ඉටු වෙතොත් එයින් ජනිත කුශල සම්භාරය දෙසුම්පෙළට ඇරැයුම් කොට වදාළ අප ගුරුදේවයන් වහන්සේ වූ මීතිරිගල නිස්සරණ වන සේනාසනාධිපතිව වැඩවිසූ අතිපූජනීය මහෝපාධ්‍යාය මාතර ශ්‍රී ඤාණාරාම මාහිමිපාණන් වහන්සේ අනුමෝදන් වන සේක්වා! ඒ දුර්ලභ ගුරු ඇසුර ලබාගැනීමට මහපැදූ ශ්‍රී කල්‍යාණී

---

1 * 1 Concept and Reality in Early Buddhist Thought - (1971)
* 2 Samyutta Nikaya - An Anthology Part II - (Wheel No. 183/185)
* 3 Ideal Solitude - Wheel No. 188
* 4 උත්තරීතර හුදෙකලාව - (දම්සක් අංක 172/173)
* 5 The Magic of the Mind - (1974)
6 Towards Calm and Insight-Printed for free distribution by J.Alwis
* Published by Buddhist Publication Society. P.O. Box 61, Kandy
බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය, තැ.පෙ. 61. මහනුවර

යෝගාශ්‍රම සංස්ථාවේ සමුත්පාදක අතිපූජනීය පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශ මාහිමිපාණන් වහන්සේටත් අතිපූජනීය නාඋයනේ අරියධම්ම මාහිමිපාණන් වහන්සේටත් මෙම ධර්මදානමය කුශලය හිමිවේවා!

පටිගත වූ දෙසුම් 33 පිටපත් කිරීමේ භාරදූර කාර්යය මහත් පරිශ්‍රමයකින් ඉටුකළ හපුරුදෙණියේ පියදස්සන හිමියන්ටද, සමීක්ෂණ ශුද්ධි ආදියෙන් පසුව එම අත්පිටපත මුද්‍රණය සඳහා සකස් කර දුන් පූජ්‍ය උඩර්රියගම ධම්මජීව, පූජ්‍ය මහයායේ ධම්ම සුනෙත්ත යන හිමිවරුන්ටද දෙසුම් පටිගත කිරීම් පිටපත් කිරීම් ආදී කටයුතුවලට සහායවූ හැමදෙනා වහන්සේලාටද මෙම ධර්මදානමය පින පරම ශාන්ත නිර්වාණාවබෝධය පිණිසම වේවා! එමෙන්ම, අවශ්‍ය අවස්ථාවලදී කැසට් පටි සපයාදීමෙන් හා ලිපි ද්‍රව්‍ය, ඡායා පිටපත් ලබාදීමෙන් අනුග්‍රහය දැක්වූ ඩඩ්ලි ප්‍රනාන්දු මහතා ප්‍රධාන ඩී. එච්. පී. මුණවීර සහ සමාගමේ කාර්යමණ්ඩලයටද අපගේ පුණ්‍යානුමෝදනාව හිමිවේ.

අමිලවූ ධර්මය මිල කිරීමකින් නොපිරිහෙළා ධර්මකාමීන් අතට පත්කිරීම අපගේ අභිලාෂය විය. එහෙත් විශාල ග්‍රන්ථයක් බවට පත්වන මෙම දෙසුම් පෙළ එක්වරම බොහෝදෙනෙකුන් අතට පත් කිරීමේ දුෂ්කරතාව වැටහුණෙන් දෙසුම් 3 බැගින් වෙළුම් 11 ක් වශයෙන් එළි දැක්වීමට අදහස් කළෙමු. මේ අනුව යටත් පිරිසෙයින් දෙසුම් කිහිපයක් හෝ කියවීමට වැඩිදෙනෙකුට අවසථාව සැලසෙන අතරම ධර්මදානමය පුණ්‍ය කර්මයට බොහෝදෙනාගේ සහභාගිත්වයද ලැබෙනු ඇතැයි හඟිමු. එබැවින්, ග්‍රන්ථය තවමත් ශුද්ධිපත්‍ර අවස්ථාවේ පවතින නමුදු මෙසේ පළමු වෙළුම නිකුත් කිරීමට තීරණය කළෙමු. යථා කාලයේදී සම්පූර්ණ ග්‍රන්ථය පුස්තකාල මුද්‍රණයක් වශයෙන් අංග සම්පූර්ණව මුද්‍රණය කෙරෙනු ඇත. කෙසේ වෙතත්, 'නිවනේ නිවීම' වෙළුම් එකොළොසම පිළිවෙළින් එකතු කරගන්නා පාඨකයින්ගේ පහසුව තකා අවසන් වෙළුම සමග උපමා ඉඟිවැලක් හා ගාථා ඉඟිවැලක් ද සහිත 'පදයතුරක්' (අනුක්‍රමණිකාවක්) නිකුත් කිරීමට බලාපොරොත්තු වෙමු. එම පදයතුර සකස් කිරීමේදී අපට සහාය වූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් උපාලි ජයනෙත්ති මහතාට ඒ පින නිවන් දොර ඇරෙන යතුරක්ම වේවායි පතමු.

ග්‍රන්ථ මුද්‍රණයෙහිලා මුද්‍රණාලය හා අවශ්‍ය සම්බන්ධීකරණය පිළිබඳ සම්පූර්ණ වගකීම භාරගෙන විශේෂ කැපවීමකින් ග්‍රන්ථය එළිදැක්වීමට කටයුතු කරන මහාභාරකාර තැන්පත් යූ. මාපා මහතාට මෙම ධර්මදානමය කුශලය ස්වකීය ධර්ම ප්‍රාර්ථනා ඉෂ්ට කරගැනීම පිණිස හේතුවාසනා වේවා! එසේම, වෙළුම් එකොළොසකින් නිමාවන ග්‍රන්ථයෙහි බරපැන, 'බර පැනයක්' නොවනු පිණිස 'ධර්මග්‍රන්ථ මුද්‍රණ භාරය' නමින් විශේෂ

අරමුදලක් පිහිටුවීමෙන් පුරෝගාමීවූ පින්වත් ජී.ටී. බණ්ඩාර මහතාට එම ආදර්ශවත් පරිත්‍යාගයෙන් ජනිත කුශලය පරම ශාන්තවූ 'නිවනේ නිවීම' පසක් කරගැනීමට උපනිශ්‍රය වේවායි! යි පතමු. මුද්‍රණ භාරයේ තීරණාත්මක අවසාන අදියර සඳහා පූර්ණ සහයෝගය දෙන කරුණාරත්න සහ පුත්‍ර සමාගමේ කාර්‍ය මණ්ඩලයටද අපගේ පුණ්‍යානුමෝදනාව හිමි විය යුතුව ඇත.

මෙයට
සසුන් ලැදි,
**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දෙගෙදර
දේවාලේගම

**(25 41) 1997 ජුලි 1**

# ප්‍රකාශක නිවේදනය

අතිපූජ්‍ය ඤාණනන්ද ස්වාමීන් වහන්සේගේ ඉතා අගනා දෙසුම් පෙළක්, මෙසේ කොටස් වශයෙන් මුද්‍රණය කොට, බුදුදහම පිළිබඳ නිරවුල් දැනුමක් ලබා ගැනීම පිණිස උනන්දු වන අය අතට පත් කිරීමට හැකිවීම ගැන මහත් සේ සතුටු වෙමි.

පටිගත කරන ලද දේශනවලට සවන් දීමෙන් පසු, එම දේශන කෙසේ හෝ මුද්‍රණය කොට ධර්ම දානයක් ලෙස බෙදාදීමේ අවශ්‍යතාව අපහට දැනුනි. එවැනිම උද්යෝගයකින් එම කාර්යය ඉටු කර ලීමට ජී.ටී. බණ්ඩාර මහතා අපගෙන් කිසිදු පෙළඹීමක් නොමැතිව, සිය කැමැත්තෙන්ම සැදැහැසිතින් ඉදිරිපත් වීම ධර්ම ශක්තිය විදහා පෑමක් මෙන් විය.

එම මහඟු පුණ්‍යකර්මය උදෙසා ඒ මහතා විසින් මහා භාරකාර දෙපාර්තමේන්තුවේ ඒ සඳහාම වූ විශේෂ අරමුදලක් "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් පිහිටුවන ලදී.

මෙවැනි උතුම් ශාසනික කටයුත්තක් සඳහා අනුග්‍රහය දැක්වූ ජී.ටී. බණ්ඩාර මහතාටත් ග්‍රන්ථය ඉතා ඕනෑකමින් මුද්‍රණය කොට එළි දැක්වීම පිණිස කටයුතු කළ මුද්‍රණ ශිල්පී කරුණාරත්න සහ පුත්‍ර සමාගමේ රවි කරුණාරත්න මහතාටත්, ශාසන චිරස්ථිතිය සඳහා තම ධනයත්, ශ්‍රමයත් වැය කිරීමෙන් ලැබෙන ප්‍රීතිය අපමණය.

'නිවනේ නිවීම' නමින් ප්‍රකාශයට පත් කෙරෙන මෙම දේශනා මාලාවේ ඉතිරි දේශන කොටස් වශයෙන් මුද්‍රණය කිරීම පිණිස දායකවීමට කැමති භවතුන්හට, ඒ සඳහා "ශ්‍රී ලංකාවේ මහා භාරකාර තැන" නමින් චෙක්පත් හෝ මුදල් ඇණවුම්, (මුදල් ඇණවුම් නම් ටොරින්ටන් චතුරශ්‍රය උප තැපැල් කාර්යාලයෙන් මාරු කරගත හැකි පරිදි) ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාර අරමුදලට බැර කිරීම පිණිස පහත සඳහන් ලිපිනයට* එවිය හැකි බැව් කරුණාවෙන් දන්වා සිටිනු කැමැත්තෙමි.

යූ.මාපා
ශ්‍රී ලංකාවේ මහා භාරකාර තැන

මහා භාරකාර දෙපාර්තමේන්තුව
තැ.පෙ. 548
2, බුලර්ස් පටුමග
කොළඹ 07.
1997 ජුලි 1

# අමා ගඟ

මහවැලි ගඟ උතුරට හැරවීමෙන් පසු එතෙක් නිසරු මුඩු බිම් ලෙස පැවති පෙදෙස්වල සිදුවූයේ ඉමහත් වෙනසෙකි. පිපාසයට පැන්බිඳක් නොලබා සිටි ගොවීහු පෙදෙස පුරා නිහඬව ගලා යන සිසිල් දිය දහරින් පිනාගියහ. මැලවුනු ගොයම සරුව නිල්වන්ව කරලින් බරවිය. මල් පලින් ගැවසීගත් තුරු-ලිය බලා සැනසෙන පෙදෙස් වැසියෝ තුටු කඳුළු වගුළහ.

දහම් අමා ගඟ "උතුරට" හැරවීමේ වැඩ පිළිවෙළක් මෙයට තෙවසරකට පෙර ඇරඹුණි. දහම් පත-පොත තබා "එදා-වේල" සඳහා වත් විය පැහැදම් කිරීමට වත්-කමක් නැත්තෝ, නිහඬව නොමිලයේ ගලායන අමිල දහම් අමාදිය දහරින් සදහම් පිපාසය සන්සිඳුවා ගත්හ. අරිටු මිසදිටු හැර, සැදැහැයෙන් සරුව, ගුණ නුවණින් බරව පිළිවෙත් මඟට නැමී ගත්හ. ලොවී-ලොවුතුරු මල් පල නෙලා ගනිමින් හද පුරා පිරි බැතියෙන් නන් අයුරින් සොම්නස පළකළහ.

"ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් දියත් කළ මෙම ධර්මදාන වැඩපිළිවෙල සඳහා අපගෙන් වැයවුනේ පිරිසිදු ධර්මදාන සංකල්පය පමණි. අමාගඟ "උතුරට" හැරවූවෝ සසුන් ගුණ හඳුනන පරිත්‍යාගශීලී සැදැහැවත්හුමය. "නිවනේ නිවීම" පොත් පෙළ එළි දැක්වීමෙන් නොනැවතී "පහන් කණුව ධර්මදේශනා" පොත් පෙළෙහි "බරපැන" දැරීමටත්, දෙස්-විදෙස්වල දහම් පිපාසිතයින් උදෙසා අප අතින් ලියැවෙන අනිකුත් පොත-පත ඒ අයුරින්ම එළි දැක්වීමටත් ඔවුහු උත්සුක වූහ. "දෙන දේ පිරිසිදුවම දීමේ" අදහසින් අමිල වූ දහම ඊට නිසි ශෝභන මුද්‍රණයකින්ම ධර්මකාමීන් අතට පත් කිරීමට පියවර ගත්හ. මුද්‍රිත පිටපත් සංඛ්‍යාව අවසන්වනු හා සමගම "නැවත මුද්‍රණ" පළකිරීමෙන් දහම් අමා ගඟ වියළී යා නොදීමට දැඩි අදිටනකින් ඇප කැපවූහ.

"පොත් අලෙවිය" පිළිබඳව මෙකල බහුලව දක්නට ලැබෙන වාණිජ සංකල්පයට පිටුපා, තහංචිවලින් තොරව, තමන් අතට නොමිලයේම පත් කැරෙන "දහම් පඬුර" තුළින් ධර්මදාන සංකල්පයෙහි අගය වටහා ගත් බොහෝ පාඨක පින්වත්හු තමන් ලද රස අහරක්, නෑ-හිතවතුන් සමග බෙදා-හදා ගන්නාක් මෙන් නොමසුරුව අන් දහම් ලැදියනටද දී ධර්ම දානයට සහභාගී වූහ. ඉනුදු නොනැවතී, ශක්ති පමණින් "ධර්ම ග්‍රන්ථ මුද්‍රණභාරයට" උරදීමටද ඉදිරිපත්වූහ, ඇතැමෙක් ලොකු කුඩා දහම් පොත් මුද්‍රණය කරවීමේ හා නැවත-නැවත මුද්‍රණය කරවීමේ බරපැන ඉසිලීමට පවා පසුබට නොවූහ.

සම්බුදු සසුන මේ ලක් පොළොවෙහි පවතින තාක් මේ දහම් අමාගඟ ලෝ සතුන් සිත් සනහමින් නොසිඳී ගලා යේවා යනු අපගේ පැතුමයි.

**"සබ්බදානං ධම්මදානං ජිනාති"**

මෙයට,
සසුන් ලැදි
**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දෙගෙදර
දේවාලේගම

**2000 ජුනි 05 (2544 පොසොන්)**

# ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය

ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පළ කරනු ලබන "නිවනේ නිවීම" පොත් පෙළෙහි සයවැනි වෙළුම දක්වා මුද්‍රණය කිරීමේ සම්බන්ධීකරණය මැතක් වනතුරු කරන ලද්දේ ශ්‍රී ලංකාවේ මහාභාරකාර තනතුර දැරූ යූ. මාපා මහතා විසිනි. ඉතා ගැඹුරු ධර්ම කරුණු සහිත එම වටිනා දහම් පොත් පෙල එළි දැක්වීමට හැකිවූයේ ඒ මහතාගේ අප්‍රතිහත ධෛර්යය නිසාමය.

මෙම පොත් පෙලෙහි හත්වැනි වෙළුම මුද්‍රණයට සකස් වෙමින් තිබෙන අවස්ථාවේදී මාපා මහතාට ශ්‍රී ලංකා ජනරජයේ තානාපති ලෙස මියන්මාර් (බුරුමය) දේශයට යෑමට සිදුවිය. ථෙරවාදී බුදු දහම නිර්මලව පවතින එවැනි දේශයකට පත් වී යෑම හුදෙක් ඒ මහතාගේ ශාසනික සේවයේ තවත් පියවරක් ලෙස දකිමු.

මාපා මහතා විසින් එසේ නික්ම යාමට පෙර, "නිවනේ නිවීම" සෙසු කාණ්ඩ මුද්‍රණය කිරීමේ කටයුතු කිසිදු බාධාවකින් තොරව කරගෙන යාම පිණිස, අති පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන් වහන්සේගේ මෙම දේශනවල අගය දන්නා අප කීපදෙනෙක් මහාභාරකාර කාර්යාලය වෙත කැඳවා, ඒ පිළිබඳව වැඩ පිළිවෙලක් සකස් කරන ලදී. එම ක්‍රියා පිළිවෙල අනුව "නිවනේ නිවීම" දේශන මාලාව සහ ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පළකරනු ලබන "පහන් කණුව ධර්ම දේශනා" ග්‍රන්ථ එපරිද්දෙන්ම ඉදිරියේදී පළකෙරෙනු ඇත.

මෙම උතුම් ශාසනික සේවය ඉටු කිරීමට මාහට එම භාරයේ ස්ථාපක වශයෙන් මෙතැන් සිට වගකීම පැවරී තිබේ. එම මහඟු කාර්යය ඉෂ්ට කරගැනීම පිණිස ඒ පිළිබඳව උනන්දුවක් දක්වන සියලුම බැතිමත් දායක දායිකාවන්ගේ අනුග්‍රහය අපි බලාපොරොත්තු වෙමු.

මෙම ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරයට එවනු ලබන ආධාර ශ්‍රී ලංකාවේ මහා භාරකාරතැන නමින් පහත සඳහන් ලිපිනයට එවිය හැක.

තවද ආධාර දෙන පින්වතුන්ගේ පහසුව තකා දන් නුගේගොඩ සම්පත් බැංකු ශාඛාවෙහි "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් ගිණුම් අංක 000360001415 දරණ ජංගම ගිණුමක් විවෘත කර ඇති බව සලකන්න.

ජී.ටී. බණ්ඩාර,

ස්ථාපක, ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය

1999 ඔක්තෝබර් 25 වැනි දින.

රෝයල් ඉන්ස්ටිටියුට්, 191, හැව්ලොක් පාර,

කොළඹ 5.

# ග්‍රන්ථ සංකේත නිරූපණය

මහා. - මහා වග්ග පාළි
දී.නි. - දීඝ නිකාය
ම.නි. - මජ්ඣිම නිකාය
සං.නි. - සංයුත්ත නිකාය
අං.නි. - අංගුත්තර නිකාය
ඛු.නි. - ඛුද්දක නිකාය
ධ.ප. - ධම්මපද
උදා. - උදාන
ඉති. - ඉතිවුත්තක
සු.නි. - සුත්තනිපාත
ථෙර. - ථෙරගාථා
ථෙරී. - ථෙරීගාථා
මහානි. - මහා නිද්දෙස
චූ.නි. - චූල්ල නිද්දෙස
නෙත්ති - නෙත්තිප්පකරණ
සු.වි. - සුමඞ්ගලවිලාසිනී (දීඝ නිකාය අටුවාව)
ප.සූ. - පපඤ්චසූදනී (මජ්ඣිම නිකාය අටුවාව)
සා.ප. - සාරත්ථප්පකාසිනී (සංයුත්ත නිකාය අටුවාව)
මනො. - මනොරථපූරණී (අංගුත්තර නිකාය අටුවාව)
ධ.අ. - ධම්මපදට්ඨ කථා
ප.ජෝ. - පරමත්ථජෝතිකා
ජා.අ. - ජාතකට්ඨකථා
ප.දී. - පරමත්ථදීපනී
වි.ම. - විසුද්ධිමග්ග

බු.ජ. - බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා
හේ.මු. - සයිමන් හේවාවිතාරණ මුද්‍රණය

# 22 වන

# දේශනය

# 22 වන දේශනය

**"නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"**

"එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධි පටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං."

"මෙය ශාන්තය මෙය ප්‍රණීතය එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම, සියලු උපධීන් අතහැර දැමීම, තණ්හාව ක්ෂය කිරීම, නොඇල්ම නම් වූ විරාගය, නැවැත්ම නම් වූ නිරෝධය, නිවීම නම් වූ නිබ්බානය."

**අතිපූජනීය මහෝපාධ්‍යාය මාහිමිපාණන් වහන්සේ ප්‍රධාන ගරුතර යෝගාවචර මහා සංඝ රත්නයෙන් අවසරයි. නිබ්බාන යන මාතෘකාව යටතේ පවත්වනු ලබන දේශනා මාලාවේ විසිදෙවන දේශනයයි මේ.**

මේ ශාසනයේ විමුක්ත පුද්ගලයා මහා සමුද්‍රයට උපමා කරන ලද්දේ යම්කිසි ගැඹුරු අර්ථයකින් බව තේරුම් කරන්නට අපි ගියවර දේශනයේදී උත්සාහ කළා. දිය සුළියක උපමාව අපි ඒකට ඉදිරියට ගත්තා. සංසාර වට්ටයෙන් මිදීම, එහෙම නැත්නම් සංසාර වට්ටය සිඳීම, හරියට දිය සුළියක නතරවීම හා සමානයි. සාංසාරික දිය සුළිය නතරවීම හා සමානයි. සාමාන්‍යයෙන් දිය සුළිය කියල කියන්නෙ හැරෙන, පැරෙන, පාතාලයක් කේන්ද්‍රස්ථානය කරගෙන මහ මුහුද තුළ පෞද්ගලික පැවැත්මක් මවා පාන යම්කිසි විපරීත, අයථා, විතථ, තත්ත්වයක්. දිය සුළිය නිතරම දෙකක් පිළිබඳ හැඟීම ඉස්මතු කරදෙන, ද්වයතාවක් අනුව ක්‍රියාත්මක වන, විපර්යාසයක්. එය ඇතිතාක් අතනක් මෙතනක් තිබෙනව. මමෙක් පරෙක් සිටිනවා. ඇතුළත පිටත භේදයක්, අන්තො ජටා බහි ජටා අවුල් තත්ත්වයක් දිය සුළියකින් පිළිබිඹු කෙරෙනව. දිය සුළියක නතරවීම ද්වයතාවෙන් මිදුන හුදකලා 'කේවලී' තත්ත්වයක්. 'කේවලී' කියන වචනය ගැනත් අපි ගියවර සාකච්ඡා කළා. දිය සුළියක නතර වීමත් හා සමඟම, අර කලින් කියාපු ඇතුළත පිටත භේද - අන්තො ජටා බහි ජටා අවුල් ආදිය - ඒ සියල්ල නිරවුල් වෙනව. ඒ සියල්ල නිරවුල් වූ ශාන්ත තත්ත්වයක් දිය සුළියක නතරවීම. එතැනක්, මෙතැනක් කියල දක්වන්නට බැරි මහ මුහුද විතරයි ඉතුරු වෙන්නේ. මහ මුහුද යම් සේද දන් දිය සුළියත් එසේමයි. මේ, එසේ වූ බව දිය සුළියෙහිම නතරවීමයි, නිරෝධයයි, සංසිඳීමයි. මේ නතර වූ දිය සුළිය පිළිබඳ කිසියම් ආකාරයකින් පෙන්නුම් කිරීමක් කරන්න බැහැ, අර කලින් පෙන්නුවා වගේ අතන මෙතන ආදී වශයෙන්. මහ

මුහුදේ 'යථාබව' පිළිගත් 'තථාබව' එයයි. මේ තථාබව අනුව ගිය, එහෙම නැත්නම් තථ බවට පැමිණි, ඒ දිය සුළිය දන් තථාගත නමින් හැඳින්වීමට හැම අතින්ම සුදුසුයි. මේ තථාබවට තාදී කියන වචනයත් සම්බන්ධයි. ඊට සමානයි. තථාගතයන් වහන්සේ පිළිබඳව 'තාදී' යන වචනය යොදනව. 'තාදිසො' යන වචනය යොදනව. එහි තේරුම අපි සිංහල හෝ 'හිංගල' වචනයෙන් කිව්වොත් 'එහෙව්' බව. මේ තථාගත වරයාගේ එහෙව් බව, අර අෂ්ට ලෝක ධර්මයෙන් කම්පා නොවන, අකුප්පා චේතො විමුක්තියයි, නිවනයි.

තථාගතවරයා මරණින් මත්තෙහි වෙයිද නොවෙයිද ආදී චතුෂ්කෝටි ප්‍රශ්න වලට, සතරකොන් ප්‍රශ්න වලට, බුදුරජාණන් වහන්සේ පිළිතුරු නොදුන්නේ මක්නිසාද යන්න අපි ගියවර දේශනයේ දී ඉදිරිපත් කළ සූත්‍ර කොටස් වලිනුත්, බොහෝ දුරට පැහැදිලි වෙන්න ඇති. 'දිට්ඨෙව ධම්මෙ සච්චතො ථෙතතො තථාගතෙ අනුපලබ්භියමානෙ' 'දිටු දැමියෙහිදිම ඇත්ත වශයෙන්ම, ස්ථිර වශයෙන්ම තථාගත කෙනෙකුන් නොලැබෙන කල්හි' යන දේශනා පාඨයෙන් හැඟෙන ආකාරයට ජීවමානව සිටියදීත් ඇත්ත වශයෙන්ම තථාගත කෙනෙකුන් නැති නිසා මරණින් මතු තථාගතවරයාට කුමක් වේද යන ප්‍රශ්නය පවා අර්ථශූන්‍ය බව නිගමනය කරන්නට අපට සිද්ධ වුනා. ඒ වගේම 'පුබ්බෙචාහං එතරහිච දුක්ඛඤ්චෙව පඤ්ඤපෙමි දුක්ඛස්ස ච නිරොධං.' 'කලිනුත් දනුත් මම දුකක් සහ දුකෙහි නිරෝධය පමණක්ම පෙන්වාලමි.' කියන ඒ බුද්ධ වචනය අනුව, ඒ තීරණාත්මක බුද්ධ වචනය අනුව, අපට පෙනෙන්නේ බුදුරජාණන් වහන්සේ මේ ප්‍රශ්නයට උත්තර දීමේදි සත්ත්ව පුද්ගල ව්‍යවහාරය එහෙම පිටින්ම ඉවත් කරල ඒ වෙනුවට ධර්මස්වභාවය පමණක්ම, හුදු ධර්ම ස්වභාවය පමණක්ම, මතුකර දෙන චතුරාර්‍ය සත්‍ය දේශනාව උපකාර කරගෙන මේ ප්‍රශ්නය විසඳූ බවයි.

මේ සත්ත්ව පුද්ගල ව්‍යවහාරය පිළිබඳව අපට ටිකක් ගැඹුරින් සලකා බලන්න සිද්ධ වෙනව. මක්නිසාද, තථාගතවරයා නැතෙයි කීවාම බොහෝ දෙනෙකුට භීතියකුත් ඇති වෙනව. මේ කුමන අර්ථයකින්ද මේක කියන්නේ කියන එක තේරුම් ගැනීමට මේ සත්ත්ව කියන වචනයට බුදුරජාණන් වහන්සේ දී වදාළ අලුත් නිරුක්තියක්, අමුතුම නිරුක්තියක්, ගියවර රාධ සංයුක්තයෙන් උපුටා දක්වුවා. 'රූපෙ ඛො රාධ යො ඡන්දො යො රාගො යා නන්දි යා තණ්හා තත්‍ර සත්තො තත්‍ර විසත්තො තස්මා සත්තොති වුච්චති.' 'රාධ, රූපයෙහි යම් ඡන්දයක් යම් රාගයක් යම් නන්දියක් යම් තණ්හාවක් වෙයිද ඒ රූපයෙහි ඇලුනේ, වෙසෙසින්ම ඇලුනේ, එහෙයින් එබඳු ඒ ඇලුනු පුද්ගලයාට සත්ත්වයා යයි ව්‍යවහාර කරනු ලැබෙයි.' මෙතන අර 'සත්ත' කියන වචනයට සම්බන්ධ කරල, මේ අර ප්‍රාසයක් අනුව - එක සමාන

විදියට ශබ්ද වෙන නිසා, ඒ අනුව - බුදුරජාණන් වහන්සේ නිරුක්තිය දීල තියෙන්නේ.

'රූපෙ සත්තො විසත්තො' - රූපෙ සත්තො විසත්තො කියල කියන්නේ රූපයෙහි ඇලුනු - එතනත් තියනව සත්ත කියන වචනයක්. 'සත්ත' කියන වචනයට විශේෂ නිරුක්තියක් මේ බුදුරජාණන් වහන්සේ දී වදාළේ. මේ සත්ත කියන වචනයෙ නිරුක්ති ගැන කල්පනා කරල බලනව නම්, මානව ඉතිහාසයේ මුල් කාලයේ ඉඳලම මේ සත්ත කියන වචනයට විශේෂ තැනක් ලැබුන, 'සත් - අසත්' ආදි පදාර්ථ වශයෙන්. ලෝකයේ යම් කිසි නිත්‍ය දෙයක් තිබෙනවා කියන හැඟීම දෙන වචනයක් මේ සත්ත කියන වචනය. සත්ත කියන වචනයට සත්ත්ව කියල සංස්කෘතයෙන් එහෙම කියනව. තිබෙනව කියන අර්ථය හඟවන 'සන්ත්' 'සත්' යන කෘදන්ත රූප ආශ්‍රයෙන් පද දෙකක් හැදෙනව. සත්‍ය, සත්ත්ව කියල. දැන් 'සත්‍ය' කියන්නේ ඇත්ත. ඇත්ත දෙය කියන එකයි. ඒ වගේම සත්ත්ව කියන්නේ 'ඇත්තා', 'ඇති බව' කියන එකයි. ඒ වගේම සත්ත්ව කියන්නේ 'ඇත්තා' ඇති බවට ප්‍රතිචාරයක් නඟන තැන කියල ගන්න පුළුවන් අපිට. එතකොට 'සත්ත්ව' - මේ අර සත්ත්වයාගේත් සත්‍ය බවක් තියනව කියල ඒකාන්ත සත්‍යතාවක් 'සත්ත්ව' කියන වචනයට කාලාන්තරයක් තිස්සේ ආරෝපනය වෙලා තිබුන. නමුත් බුදුරජාණන් වහන්සේ මේ දී වදාළ අලුත් නිරුක්තියට අනුව සත්ත්ව කියන වචනයට ලැබෙන්නේ එක්තරා සීමිත සාපේක්ෂ වටිනාකමක් පමණයි. - **සීමිත සාපේක්ෂ වටිනා කමක් පමණයි**. දැන් අර රාධ සංයුක්තයේ ඒ පාඨයෙන් අපට හැඟෙනව ඒ රූප ආදී එක් එක් ස්කන්ධ පිළිබඳව 'ඡන්දයක්, රාගයක්, නන්දි කියල කියන සතුටු වීමක්, තණ්හාවක් ඇති තාක් - ඒ තණ්හා වශයෙන් ඇලීමක් ඇතිතාක් - සත්ත්වයෙක් ඇත. එබඳු ඇලීමක් නැතිවූ විට සත්ත්වයෙක් නැත. ඒකයි අර සීමිත සාපේක්ෂ වටිනාකමක් කිව්වේ. යම් කිසි දෙයක් තවත් දෙයක් උඩ රඳාපවතින කොටයි සාපේක්ෂක කියල කියන්නෙ. ඒක නිසාම ඒක සීමිතයි. ඒකාන්ත නොවෙයි. එතකොට කුමක් උඩද එය රඳා පවතින්නේ ? අර ඇලීම උඩයි.' රූප ආදී එක් එක් ස්කන්ධය පිළිබඳව ඇලීමක් තිබෙනතාක් සත්ත්වයෙක් ඇත. එබඳු ඇලීමක් නැතිවූ විට සත්ත්වයෙක් නැත. එතකොට මේක නම් තත්ත්වය, මෙයින් අපට තේරුම් ගන්න පුළුවනි බුදුරජාණන් වහන්සේ මේ සත්ත්ව කියන වචනයට දුන්න නිරුක්තිය අනුවම තථාගතයන් වහන්සේ සත්ත්වයෙක් නොවන්නේ මක් නිසාද කියල. අපි එදා යන්තමින් උපුටා දැක්වූවා රාධ සූත්‍රයේම එක්තරා උපමාවක්. අපට ඒක වැඩිය විස්තර කරන්න බැරි වුනා. අර කියාපු නිර්වචනයට, එහෙම නැත්තම් - විග්‍රහයට - පසුවයි බුදුරජාණන් වහන්සේ උපමාවක් ඉදිරිපත් කරන්නේ.

'සෙය්‍යථාපි රාධ කුමාරකා වා කුමාරිකා වා පංසු අගාරෙහි කීළන්ති, ආදී වශයෙන්. ඔය සෙල්ලම් ගෙවල් වලින්, වැලි ගෙවල් වලින්, සෙල්ලම් කරන දරු දැරියන් ගැන උපමාවක් බුදු පියාණන් වහන්සේ දෙන්නේ. ඒ දරු දැරියන් තුළ අර ගෙවල් පිළිබඳව ඡන්දයක්, රාගයක්, නන්දියක්, තණ්හාවක් පරිළාහ නම් වූ දැවිල්ලක්, පිපාසයක්, ආසාවක් ඇතිතාක් ඔවුන් ඒ සෙල්ලම් ගෙවල් වලට ඇතුල් වෙනවා. ඒවා සමඟ ක්‍රීඩා කරනව. ඒවා ධනය හැටියට සලකනවා. ඒවා මගේ කියා ගන්නවා. 'ආලයන්ති, කෙලායන්ති, ධනායන්ති, මමායන්ති.' නමුත් යම් කිසි අවස්ථාවක නුවණ මුහුකුරා ගිහිල්ලා තණ්හාවත් ඉවත් වූවා නම් අර සෙල්ලම් ගෙවල් පිළිබඳව, ඔවුන් මොකද කරන්නේ? 'හත්ථෙහි ච පාදෙහි ච: අත් පා වලින්, 'විකිරන්ති විධමන්ති විද්ධංසෙන්ති වික්ීලනිකං කරොන්ති' ඒවා විසුරුවා හරිනව. බිඳ දමනව. විනාස කරනව. තවත් සෙල්ලම් කරන්න බැරි තත්ත්වයකට පත්කරනව. එතකොට අපි ධර්මානුකූලව කල්පනා කරල බලනව නම් මේ උපමාවේ අර්ථය, අවිද්‍යාවත් තෘෂ්ණාවත් ඇතිතාක්, අර කුඩා දරුවන්ට අර සෙල්ලම් ගෙවල් ඇත්තයි. සත්‍යයි. සත්‍ය දේවල්. ප්‍රඥාව උදාවෙලා තෘෂ්ණාව ක්‍ෂය වුන හැටියේ ඒව අසත්‍යයි. ඒක නිසා තමයි ඔවුන් ඒව බිඳ දැම්මේ. ඔන්න ඔය වගේ තත්ත්වයක් තමයි සාමාන්‍ය අශ්‍රැතවත් පෘථග්ජනය පිළිබඳව තිබෙන්නෙ. අර රූප ආදී එක් එක් ස්කන්ධය පිළිබඳව ඇල්මක් ඇතිතාක්, ඒවායේ ඇති යථා තත්ත්වය අනිත්‍ය, දුඃඛ, අනාත්ම වශයෙන් පිරිසිඳ නොදන්නා තාක්, ඔවුන්ට ඒවා සත්‍යයි. **ඔවුන් ඒවා අල්ලගෙන ඉන්න නිසාම, ඔවුන් ඒවායින් බැඳිල**. ඒක නිසා තමයි කර්ම ආදී වශයෙන්, පින් පව් ආදී වශයෙන් - ඒ හැම එකක්ම සත්‍ය වෙන්නේ එතැන ඉඳල. එකට ඇලීම නිසාමයි හැම එකක්ම සත්‍ය වෙන්නේ. 'උපාදාන පච්චයා භවො' කියන අදහසමයි මෙතන කියැවෙන්නේ. **අල්ලා ගැනීමක් නිසාමයි පැවැත්මක් පවතින්නේ**. එතකොට මේ ඇලීම කියන වචනයේ තියෙන්නේ ඔන්න ඔය ගැඹුරු අදහසයි, තේරුමයි. නමුත් යම් කිසි අවස්ථාවක ප්‍රඥාව පහළ වෙලා අර කියාපු තෘෂ්ණාව ක්ෂය උනා නම්, ඒ අවස්ථාවේ ඒවා සියල්ලම අසත්‍යයි. සත්ත්වයෙකුත් නැහැ. සත්‍ය බවක් නැති නිසා සත්ත්වයෙකුත් නැහැ. එතකොට මේ විවරණ මාර්ගීය අපට තවදුරටත් පැහැදිලි කරදෙන හොඳ වටිනා සූත්‍රයක් තමයි නිදාන සංයුක්තයේ කච්චායන ගොත්ත සූත්‍රය. [1] ඒ සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ සම්මා දිට්ඨිය විවරණය කරපු ආකාරය වැදගත්. ඒ දීඝ සූත්‍රය අපි කලින් අවස්ථාවක දැක්වූවා. දැනට ඕන ටික අපි ගත්තොත් එලියට: 'දුක්ඛමෙව උප්පජ්ජමානං උප්පජ්ජති දුක්ඛං නිරුජ්ඣමානං නිරුජ්ඣතී ති න කංඛති න විචිකිච්ඡති, අපරප්පච්චයා ඤාණමෙවස්ස එත්ථ හොති එත්තාවතා ඛො කච්චායන සම්මාදිට්ඨි හොති'[1]

'උපදනේ දුකක්ම උපදියි, නිරුද්ධ වන්නේ දුකක්ම නිරුද්ධ වෙයි, යනුවෙන් දැනගෙන සැක නොකරයි. දෙගිඩියා පහළ කර නොගනියි. 'අපරප්පච්චයා ඤාණමෙව අස්ස එත්ථ හොති' අපරප්පච්චයා ඤාණ කියල කියන්නේ අනුන් නිසා, අනුන් කියනවට ගද්දෙන්, පිළිගන්න එකක් නොවෙයි. 'පරප්‍රත්‍ය' නැතිව 'ආත්ම ප්‍රත්‍යක්‍ෂයෙන් තමාම ප්‍රත්‍යක්ෂ වශයෙන් දැනගන්න විදියෙ ඤාණයක් ඒ ආයුෂ්මත් පුද්ගලයාට ඇති වෙනවා. 'අපරප්පච්චයා ඤාණමෙවස්ස එත්ථ හොති' මේ කාරණය පිළිබඳව, දුකත් දුක්ඛ නිරෝධයත් පමණක්මයි මෙතන තියෙන්නේ කියන කාරණය පිළිබඳව, ඥානයක් ඇති වෙනවා. 'එත්තාවතා ඛො කච්චායන සම්මා දිට්ඨි හොති' මෙපමණකින්ය කෙනෙක් සම්මා දිට්ඨි ඇත්තෙක් වන්නේ. මේකයි, සම්මා දිට්ඨිය කියන එක, මොකද, මෙතන මේ කියවෙන්නේ ලෝකෝත්තර මාර්ග සම්මා දිට්ඨි යයි. 'කම්මස්සකතා සම්මාදිට්ඨි' ය නොවෙයි. මමය මාගේය ආදී වශයෙන් කියැවෙන 'කම්මස්සකතා' සම්මා දිට්ඨිය නොවෙයි. මේක ලෝකෝත්තර සම්මා දිට්ඨියයි. ධර්මස්වභාවය හෙළිකරන සම්මා දිට්ඨියයි. එතකොට මෙන්න මේ ධර්මතාව තේරුම් නොගැනීම නිසා ඒ බුද්ධ කාලයේ සිටි මහණ බමුණන් - වෙන එකක් තබා මේ ශාසනයේ භික්ෂූන් වහන්සේලා පවා - බුදුරජාණන් වහන්සේට උච්ඡේද වාදියෙක් හැටියට චෝදනා කළා. අභූත චෝදනා එල්ල කළා. එහෙම නැත්නම්, අනිත් ප්‍රතික්‍රියාව කුමක්ද - මේක උච්ඡේදවාදයක්ය කියල බයේ ශාස්වතවාදයක් බදා ගත්ත. එතකොට බුදුපියාණන් වහන්සේ සමහර අවස්ථාවල මේ චෝදනාවලට පිළිතුරු දුන්න. අලගද්දූපම [2] සූත්‍රයේ එබඳු අවස්ථාවක් සඳහන් වෙනව.

පළමුවෙන්ම බුදු පියාණන් වහන්සේ මේ ශාසනයේ විමුක්ත පුද්ගලය හඳුන්වනව පද කීපයකින්. 'අරියො පන්නද්ධජො පන්නභාරො විසංයුත්තො' කියල. ඒ කියන්නේ අස්මිමානය ප්‍රහීන කළාට පස්සේ ඒ පුද්ගලය හඳුන්වන්නේ 'අරියො පන්නද්ධජො' මාන ධජය බිම හෙලා 'පන්නභාරො' පඤ්චස්කන්ධභාරය බිම තැබූ, 'විසංයුත්තො' භව සංයෝජන වලින් මිදුණු, බැමි වලින් මිදුණු, තැනැත්තා හැටියට හඳුන්වනව. එබඳු ඒ පුද්ගලයා පිළිබඳව ඊළඟට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව. 'එවං විමුත්ත චිත්තං ඛො භික්ඛවෙ භික්ඛුං සඉන්දා දෙවා, සපජාපතිකා,සබ්‍රහ්මකා, අන්වෙසං නාධිගච්ඡන්ති ඉදං නිස්සිතං තථාගතස්ස විඤ්ඤාණන්ති තං කිස්සහෙතු, දිට්ඨෙ වාහං භික්ඛවෙ ධම්මෙ තථාගතො අනනුවෙජ්ජොති වදාමි. එවං වාදිං ඛො මං භික්ඛවෙ එවමක්ඛායිං ඉධෙකෙ සමණබ්‍රාහ්මණා අසතා තුච්ඡා මුසා අභූතෙන, අබ්භාචික්ඛන්ති. වෙනයිකො සමණො ගොතමො සතො සත්තස්ස උච්ඡේදං විනාසං විභවං පඤ්ඤාපෙතී ති. ඒ ටිකේ තේරුම: 'මෙසේ විමුක්ත සිත්ඇති ඒ භික්ෂුව පිළිබඳව ඉන්ද්‍ර,දේව,බ්‍රහ්ම,පජාපතී සහිත දෙවිවරු

මේ විමුක්ත පුද්ගලයාගේ, මේ තථාගතවරයාගේ - මෙතන තථාගත වචනය යොදනව විමුක්ත පුද්ගලයාට අවිශේෂයෙන් පොදු වශයෙන් - තථාගතවරයාගේ සිත මෙනම් දෙයක් අරමුණු කරගෙන තියෙනවා කියල දැනගැනීමට, සොයා බලන්නාහු සොයාගත නොහැකිවෙත්. මේ කුමක් නිසාද කියල මා විස්තර කරනවා නම් 'දිට්ඨෙ වාහං භික්ඛවෙ ධම්මෙ තථාගතං අනනුවෙජ්ජොති වදාමි.' දිටු දැමියෙහිම තථාගතවරයා සොයාගත නොහැක්කෙක්, දැනගත නොහැක්කෙක්, කියන මේ නිසයි එබඳු ඒ තත්ත්වයක් තියෙන්නේ දෙවියන්ට එහෙම සොයාගන්න බැරි - මා මේ විදියට ප්‍රකාශ කරන ධර්‍මයන් පිළිබඳව මේ ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයන් මට අසත්‍ය වූ අභූත වූ චෝදනාවක් නගනව 'වෙනයිකො සමණො ගොතමො' ශ්‍රමණ ගෞතමයන් සත්ත්ව විනාශය පිණිස ධර්‍මය දේශනා කරන්නෙකි. 'වෙනයිකො සමණො ගොතමො සතො සත්තස්ස උච්ඡේදං. විනාසං විභවං පඤ්ඤාපෙති' ඇත්තාවූ සත්ත්වයෙකුගේ, සත්‍ය වශයෙන් සිටින්නා වූ සත්ත්වයෙකුගේ, උච්ඡේදය විනාශය නොපැවැත්ම පණවාලනව කියල මේ විදියට අභූත චෝදනාවක් කරනව කියල, මා නොකියන දේකට මෙහෙම චෝදනාවක් කරනව කියල, බුදුරජාණන් වහන්සේ දක්වල අවසාන වශයෙන් අර නිගමන පාඨය නැවතත් ඉදිරිපත් කරනව, අර අනුරාධ සූත්‍රයේදී කළා වගේ. **'පුබ්බෙ චාහං එතරහි ච දුක්ඛංචෙව පඤ්ඤපෙමි දුක්ඛස්සච නිරොධං'** එදත් අදත්, කලිනුත් දැනුත්, මම කරන්නේ මෙච්චරයි. දුකත් දුකෙහි නිරෝධයත් පණවාලන එක විතරයි මා කරන්නේ.'

එතකොට මෙන්න මේ විදියට මේ සූත්‍ර දේශනා කරල තිබෙන නමුත් වෙන එකක් තබා අටුවාචාරීන් වහන්සේ පවා මේකට නිසි විවරණය දෙන්න බය උන බවයි පේන්නෙ. එක්තරා විධියක පසුබට වීමක් ඇතිවයි මේ විවරණයට බහින්නෙ. ඒ බව අපට හෙළි වෙනව. මේ සූත්‍රයේ 'තථාගතස්ස' කියන වචනයට අටුවාව දෙන, ඒ පපංචසූදනී අටුවාවේ අටුවාව දෙන, බුද්ධඝෝස ස්වාමීන් වහන්සේ මෙහෙම ප්‍රකාශ කරනව. 'තථාගතස්ස කියන වචනය විවරණය කිරීමේදී ඒ ස්වාමීන් වහන්සේ මෙහෙම ප්‍රකාශ කරනව. 'තථාගතස්සා ති එත්ථ සත්තො පි තථාගතො ති අධිප්පෙතො උත්තම පුග්ගලො ඛීණාසවො'[3] මෙතන මේ තථාගත කියන වචනය යොදල තියෙන්නෙ සත්ත්වයා කියන අදහසත් මෙයින් හැඟෙනවය. ඒ වගේම උත්තම පුද්ගලවූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේ මෙයින් හැඟෙනවය කියල එතන අර්ථ දෙකක් දෙනව. ඊළඟට අර 'අනනුවෙජ්ජො' කියන වචනය තේරීමේදී 'අනනුවෙජ්ජො ති' - අර්ථ දෙකක් දෙනව ඒ වචනයටත් - 'අසංවිජ්ජමානොවා අවින්දෙය්‍යොවා. 'තථාගතොති හි සත්තෙ ගහිතෙ අසංවිජ්ජමානොති අත්ථො වට්ටති, ඛීණාසවෙ ගහිතෙ අවින්දෙය්‍යොති අත්ථො වට්ටති., ඊළඟට තේරුම් කරන්නේ කොහොමද, අනනුවෙජ්ජො කියන එකේ

අර්ථ දෙකක් තිබෙනවය, තථාගත කියන පදය සත්ත්වයා කියන අදහසින් සඳහන් වන තැන් වලදී 'අසංවිජ්ජමානො' කියන අර්ථය ගැලපෙනවය 'අසංවිජ්ජමානො' කියල කියන්නේ 'අසංවිජ්ජ' විද්‍යමාන නොවන, 'දක්නට නොලැබෙන,' කොහෙත්ම නැති කියන එකයි. කලින් අපි අර අනුපලබ්භියමානෙ කියල කිව්ව වගේ කොහෙත්ම නැති. එතකොට ඒක එක අර්ථයක්. අනික් අර්ථය, 'අවිඤ්ඤෙය්‍ය' කියන එක තෝරන්නෙ 'සොයාගත නොහැකි' 'දනගත නොහැකි.' ඒ කියන්නෙ ඉන්නව නමුත් දැනගන්න බැහැ. ඔන්න ඔය විදියෙ අර්ථ දෙකක්. එතකොට තථාගත ශබ්දයෙන් සත්ත්වයා හැඳින්වෙන තැන්වලදී අපි ගන්න ඕනෑ විද්‍යමාන නොවන කොහෙත්ම නැති කියන එකය. තථාගතයන් වහන්සේ හැඳින්වෙන තැන් වලදී 'සොයාගත නොහැකි' - ඉන්නවා නමුත් සොයාගත නොහැකි - කියල ඔය විධියට අර්ථ දෙකක්. එක වචනය දෙතැනක දෙයාකාරයකින් තෝරා ගැනීම වටී කියල අටුවාචාරීන් වහන්සේගේ මතය ඉදිරිපත් කරනව. ඊළඟට තව දුරටත් ඒක තහවුරු කරගන්න බුද්ධ වචනයක ස්වරූපයෙන් ශ්‍රී මුඛයට ආරෝපනය කරනව අටුවාචාරීන් වහන්සේ මෙන්න මෙහෙම විවරණයක්. 'භික්ඛවෙ අහං ධරමරණංවෙ ඛීණාසවං විඤ්ඤාණවසෙන ඉන්ද්‍රාදීහි  අවිඤ්ඤෙය්‍යං වදාමි. නහි සඉන්ද්‍රා දෙවා සබ්‍රහ්මකා සපජාපතිකා අනෙවසනෙතාපි ඛීණාසවස්ස විපස්සනාචිත්තං වා මග්ගචිත්තං වා ඵලචිත්තං වා ඉදං නාම ආරම්මණං නිස්සාය වත්තතීති ජානිතුං සක්කොන්ති. තෙ අප්පටිසන්ධිකස්ස  පරිනිබ්බුතස්ස කිං ජානිස්සන්ති.' ඔන්න ඕකයි අටුවාචාරීන් වහන්සේ ඉදිරිපත් කරන තර්කය. නමුත් බුදුපියාණන් වහන්සේගේ වචනයක් හැටියටයි ඉදිරිපත් කරන්නේ. 'භික්ඛවේ' මහණෙනි, 'අහං ධරමරණංයෙව ඛීණාසවං විඤ්ඤාණ වසෙන ඉන්ද්‍රාදීහි අවිඤ්ඤෙය්‍යං වදාමි' මම ජීවමාන ක්ෂීණාශ්‍රවයන් වහන්සේ පවා විඤ්ඤාණ වශයෙන්, උන්වහන්සේගේ විඤ්ඤාණය පිළිබඳව, අර ඉන්ද්‍රාදී දෙවිවරුන් විසින් සොයාගත නොහැක්කෙකැයි කියමි. මක් නිසාද? ඉන්ද්‍ර, දේව, බ්‍රහ්ම, ප්‍රජාපතී ආදී දෙවිවරු සොයා බලන්නාහු නමුත් මෙනම් දෙයක් ආශ්‍රය කරගෙන තථාගතවරයාගේ විඤ්ඤාණය තිබෙයි කියල දැනගන්නට නොහැකියි. එහෙම දනගන්නට නොහැකි නම්, අර පිළිසිඳ නොගෙන පිරිනිවන් පෑව ක්ෂීණාශ්‍රවයන් වහන්සේගේ විඤ්ඤාණය කෙහොම නම් දනගනිත්ද' කියල ඔය විදියට අටුවාවෙ තෝරන්නේ. ඒ කියන්නේ ජීවමානව සිටියදීත් දෙවියන්ට සොයාගන්න බැහැ. ඉතින් කොහොමද  පිරිනිවන් පෑවට පස්සේ සොයා ගන්නේ? ඒ කියන්නේ පිරිනිවන් පෑවට පස්සේ කොහොම නමුත් ඉන්නව, නමුත් සොයාගන්න බැරි අඩුපාඩුවයි තියෙන්නේ.

එතකොට මෙන්න මේ විවරණ මාර්ගයෙන් අපට පෙනෙනව අර භාෂාව්‍යවහාරය පිළිබඳ ඉතාමත් ම ගැඹුරු අංශයක් තේරුම් නොගැනීම

නිසයි අටුවාචාරීන් වහන්සේ මේ තරම් පසුබට වීමකින් මේ විදියට දෙගිඩියාවකින් මේ වගෙ විවරණයක් ඉදිරිපත් කරන්නෙ. බුදු රජාණන් වහන්සේ කෙලින්ම ප්‍රකාශ කළ ඒ ප්‍රකාශනය බලසම්පන්න වැඩියි. සමහර විට ශ්‍රද්ධාව නිසා වෙන්න පුළුවනි. නමුත් ධර්මානුකූල නැහැ. සම්මා දිට්ඨිය එතැන නැහැ. එතකොට මෙතනින් අපට හැඟෙන්නෙ මෙතන - අපි විග්‍රහ කරල බලනව නම්, මේ සූත්‍ර කොටස ආශ්‍රයෙන් - බුදුරජාණන් වහන්සේ පළමුවෙන්ම ප්‍රකාශ කළා අස්මි මානය ප්‍රහීන කිරීමෙන් අර විමුක්ත භික්ෂුව පිළිබඳව විශේෂ වෙනසක් සිදු උනා කියල. අස්මිමානය - අර මානධ්වජය බිම හෙලූ, පඤ්චස්කන්ධ භාරය අත හැරිය, භව සංයෝජන වලින් මිදුණු, ඒ තථාගත වරයා - ඒ විමුක්ත භික්ෂුව - පිළිබඳව හඳුන්වන්නට බැරි, එහෙම නැත්තම් සොයාගන්නට බැරි, තත්ත්වයක් ඇති වෙන්නෙ මක්නිසාද? අපි කලිනුත් ප්‍රකාශ කළා අර මුළු මහත් ව්‍යාකරණ රටාවටම මූලික වන්නේ 'අස්මි' කියන වචනයයි. අස්මි කූඤ්ඤයයි. 'උත්තම පුරුෂය' ඇති උනාට පස්සෙ තමයි ඊට එහා ප්‍රථම පුරුෂයක් මධ්‍යම පුරුෂයක් ඇති වෙන්නෙ. ඔය විදියට ව්‍යාකරණ රටාවට 'අස්මි' කියන එක මුලයි. එතකොට ඒ මූලික කූඤ්ඤයම උගුල්ලල දැම්මට පස්සේ අර කලින් දිය සුළියක් පිළිබඳව හඳුන්වපු අවස්ථාවේ සඳහන් කළ කාරණයමයි මෙතනදීත් මේ විමුක්ත භික්ෂුව පිළිබඳව කියන්න තියෙන්නේ. ඡායතාව අනුව ගිය වට්ටයක් නැහැ. දෙකක් නැහැ වටරවුමෙ කරකැවෙන්න. එහෙම වටරවුමෙ කරකැවීමක් නැති නිසාමයි ඒ පිළිබඳව පැනවීමක් කරන්ට බැරි. **'වට්ටං තෙසං නත්ථි පඤ්ඤාපනාය'** කියල අපි කලින් සඳහන් කළ පාඨයෙනුත් කියවෙන්නෙ. රහතත් වහන්සේලා පිළිබඳව, පැනවීමට වට්ටයක් නැත. වටරවුමේ කරකැවීමක් නැත. එතකොට මෙන්න මේ තත්ත්වය නිසා ඒ තථාගතයන් වහන්සේ දිටුදැම්යෙහිම, ජීවමානව සිටියදීම, අර සත්ත්ව තත්ත්වයෙන් තොරයි. සත්ත්වයෙක් නොවෙයි. සත්ත්වයෙක් නොවෙයි කියන එකයි එතනින් හැඟෙන්නෙ. අර සාමාන්‍ය ව්‍යවහාර මාත්‍ර වශයෙන් එහෙම ප්‍රකාශ කරන්නට සිද්ධ වෙනව. නමුත් ඇත්ත වශයෙන් අරකයි. මක් නිසාද, **ඒ ප්‍රශ්නය අසන පුද්ගලයා අර සත්ත්ව කියන වචනය වැරදි අර්ථයෙන් තේරුම් ගත්තු බව හොඳට හෙළිවෙන අවස්ථාව තමයි තථාගත වරයා මරණින් මත්තෙහි ඉන්නවාද නැද්ද කියල ප්‍රශ්න කිරීමම**. එයින් හැඟෙන්නෙ තථාගත වරයෙක් ඉන්නව කියන එකයි. ඉන්නව නම් මැරුණට පස්සෙ එක්කො නැතිවෙන්න ඕන, එහෙම නැත්තම් දිගටම ඉන්න ඕන. ඔන්න ඔය විදියෙ අර ව්‍යාකරණය පිළිබඳ - භාෂා ව්‍යවහාරය පිළිබඳ - ඉතාම ගැඹුරු අංශයක් මේක යටින් තිබෙනව.

මේ අටුවාව අර විදියට ප්‍රකාශ කරනව. දෙවියන්ට බ්‍රහ්මයන්ට සොයා ගන්ට බැහැයි තථාගතයන් වහන්සේ කියල. ඊළඟට ඒ වගේම තව කාරණයක් තමයි මේ විදියට හඳුන්වන්නට බැරිවීමට හේතුව. අර තණ්හා මාන දිට්ඨි ප්‍රපංච, ප්‍රහීන කිරීමමයි. තණ්හා මාන දිට්ඨි වශයෙන්, ඒ කියන්නෙ සත්ත්ව පුද්ගල ව්‍යවහාරය අර්ථවත් කරන, ඇලුම් බැඳුම්, පැටලුම් කිසිවක් - තණ්හා වශයෙන් ඇලීමක්, මාන වශයෙන් බැඳීමක්, දිට්ඨි වශයෙන් පටලැවීමක් - අර විමුක්ත පුද්ගලයා තුළ නැහැ. අන්න ඒක නිසා තමයි අර විධියට හඳුන්වන්න බැරි. එතකොට ඒ දෙවියන්ට බ්‍රහ්මයන්ට සොයා ගන්න බැහැයි කියල මේ විදියට මේ සූත්‍රයේ සඳහන් වුනත් තවත් අමුතු විධියෙ සූත්‍ර කොටසක් අපට හමුවෙනව දීඝ නිකායේ බ්‍රහ්මජාල සූත්‍රයෙ. [4] බුදු රජාණන් වහන්සේම තමන් වහන්සේ ගැන මෙහෙම ප්‍රකාශයක් කරනව ඒ බ්‍රහ්මජාල සූත්‍රයේ අවසානයේදී. අර සියලු දෘෂ්ටි, බ්‍රහ්ම ජාලයට - බඹ දැලට - අහු කරල ඒවා නිෂ්ප්‍රභා කළාට පස්සෙ බුදු පියාණන් වහන්සේ මෙහෙම ප්‍රකාශ කරනව: 'උච්ඡින්න භවනෙත්තිකො භික්ඛවෙ තථාගතස්ස කායො තිට්ඨති. යාවස්ස කායො ඨස්සති තාව නං දක්ඛින්ති දෙවමනුස්සා. කායස්සභෙදා උද්ධං ජීවිත පරියාදානා න නං දක්ඛින්ති දෙවමනුස්සා. සෙය්‍යථාපි භික්ඛවෙ අම්බපිණ්ඩියා වණ්ටච්ඡින්නාය යානි කානිචි අම්බානි වණ්ට පටිබද්ධානි සබ්බානි තානි තදන්වයානි භවන්ති එවමෙව ඛො භික්ඛවෙ. උච්ඡින්න භවනෙත්තිකො තථාගතස්ස කායො තිට්ඨති, යාවස්ස කායො ඨස්සති තාව නං දක්ඛින්ති දෙවමනුස්සා, කායස්ස භෙදා උද්ධං ජීවිත පරියාදානා න නං දක්ඛින්ති දෙවමනුස්සා[1]' මහණෙනි තථාගතයන් වහන්සේගේ කය, සිඳින ලද භවනෙත්ති ඇතිව තිබෙයි. භවනෙත්ති කියල කියන්නෙ තණ්හාව. එතකොට භව නෙත්ති සිඳින ලදුව තථාගතයන් වහන්සේගේ කය - ඔහේ තිබේ. කය තිබේ. 'යාවස්ස කායො ඨස්සති තාව නං දක්ඛින්ති දෙව මනුස්සා' උන් වහන්සේ ගේ කය ඇති තාක්, යම් තාක්, කල් කය තිබෙනවා ද, ඒතාක් දිව්‍ය මනුෂ්‍යයෝ උන් වහන්සේව දකිති. 'කායස්ස භෙදා උද්ධං ජීවිතපරියාදානා න නං දක්ඛින්ති දෙවමනුස්සා' කය බිඳී යාමෙන් පසුව ජීවිතය කෙළවර වීමෙන් මත්තෙහි' න නං දක්ඛින්ති දෙවමනුස්සා' - දිව්‍යමනුෂ්‍යයෝ උන්වහන්සේව නොදකිත්. ඊළඟට උපමාව දෙනව 'සෙය්‍යථාපි භික්ඛවෙ අම්බ පිණ්ඩියා වණ්ටච්ඡින්නාය යානිකානිචි අම්බානි වණ්ට පටිබද්ධානි සබ්බානි තානි තදන්වයානි භවන්ති' යම් සේ මහණෙනි 'අම්බපිණ්ඩියා වණ්ටච්ඡින්නාය' නටුව සිඳ ලූ අඹ වල්ලක 'යානි කානිචි අම්බානි වණ්ටපටිබද්ධානි' යම්තාක් අඹගෙඩි ඒ අඹ වල්ලේ නටුවට සම්බන්ධ වී තිබෙනවාද, 'සබ්බානි තානි තදන්වයානි භවන්ති' ඒවාත් අර නටුව කපනකොට අඹවල්ලේ ඒ අඹටික අනුවම යනව. ඒ කියන්නෙ ඒවත්

සිදලූ තත්ත්වයට පත් වෙනව. එසේම 'උච්ඡින්න භවනෙත්තිකො' තථාගතයන් වහන්සේගේ කය තිබෙන්නේ සිඳින ලද භවනෙත්තිය ඇතිවයි. භවනෙත්තිය සිඳින ලදුවයි තියෙන්නෙ කියල මේ විධියට උපමාවක් බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කරනව. ඉතින් මෙතන කියවෙන හැටියට දිව්‍ය බ්‍රහ්මාදීන් දකිනව තථාගතයන් වහන්සේ ජීවමානව සිටින කොට, නමුත් මේක අපි තේරුම් ගත යුත්තේ අර කලින් දැක්වූ උපමා කීපය අනුවයි. අර මුලින් සිඳින ලද ගස, උගුල්ලා කෙලින් තබන ලද තල්ගස පිළිබඳ උපමා. ඒ බුදු පියාණන්ගේ, ඒ විමුක්ත පුද්ගලයාගේ, එක් එක් ස්කන්ධය පිළිබඳව සඳහන් වෙන්නෙ - රූපාදී ස්කන්ධයන් - 'උච්ඡින්න මූලො,' 'තාලාවත්ථු කතො' - ඔය විදියට. එතකොට අන්න අර දැන් තල්ගහක් එහෙම උගුල්ලල තියෙනකොට, ඈතදී කෙනෙක්, ඕන කෙනෙක් - හිතන්නෙ මේක මේ වැඩෙන තල් ගහක් කියල. මුලින් සිඳින ලද ගහක් ඈතදී දකින කෙනෙක් හිතනව ඇත්ත වශයෙන්ම මේක ගසක් කියල. ඒ අදහසම තමයි මෙතන මේ අඹ වල්ල පිළිබඳ උපමාවෙත් තියෙන්නෙ. නටුව කපන ලද අඹ වල්ලක් වගෙයි. මේ දෙවියන් මනුෂ්‍යයන් දකිනව කියල කියල කියන්නෙ කුමක් නිසාද? දිව්‍ය මනුෂ්‍යයන් තථාගතයන් වහන්සේ දකිනවා කියල කියන්නෙ **අර ශරීරය දැකීම. කය දැකීම.**

තථාගතයන් වහන්සේ දකිනව කියල බොහොම දෙනෙක් කල්පනා කරන්නෙ අන්න කය දකිනතාක්. ඒ වගේම, මේ සූත්‍රයේ නම් සඳහන් වෙන්නෙ නැහැ. අවුරුදු 5000 කට පස්සෙ තථාගතයන් වහන්සේ ආයි අපට දකින්නට ලැබෙන බවක්.

කොහොම හෝ වේවා, දැන් මෙතනත් පෙන්නුම් කරනව යම්කිසි ගැඹුරු ධර්මයක් මේක යටින් තිබෙන බව. ධර්මාවබෝධය සඳහා ඉතාම උපකාර වෙන, සම්මාදිට්ඨිය පිරිසිදු කර ගැනීමට ඉතාමත්ම උපකාර වන කාරණයක් මේ තථාගත ප්‍රශ්නයට බුදු පියාණන් වහන්සේ **පිළිතුරු නොදීම පිළිබඳ ප්‍රශ්නයේ** ගැබ්වෙලා තිබෙන බව අපට හිතා ගන්න පුළුවන්. මේක ඉතාමත්ම පැහැදිලි වෙන වටිනා සූත්‍රයක් තමයි, සංයුක්ත නිකායේ ඛන්ධ සංයුක්තයේ එන යමක සූත්‍රය. යමක නමැති භික්ෂූන් වහන්සේ කෙනෙකුට එක්තරා පාපක දෘෂ්ටියක් කියල කියන වැරදි අදහසක් ඇතිවුනා. ඒ කියන්නෙ මිථ්‍යා දෘෂ්ටියක් වගේ වැරදි අදහසක්. ඒ යමක භික්ෂූන් වහන්සේ කල්පනා කළා: 'තථාහං භගවතො ධම්මං දෙසිතං ආජානාමි යථා ඛීණාසවො භික්ඛු කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණා.'[5] භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය අනුව ක්ෂීණාශ්‍රව භික්ෂුව කය බිඳී යාමෙන් පසු උච්ඡේද වෙයි. මරණින් මත්තෙහි නොවෙයි. යන්න බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද හැටියට මම තේරුම් ගනිමි.' කියල ඔය විධියට ඒ බුදුරජාණන් වහන්සේ දේශනා

කළේ විමුක්ත භික්ෂුව මරණින් මත්තෙහි උච්ඡේද වෙනවයි කියන අදහසෙයි කියල ඔය විදියට කියමින් ගියා අර යමක භික්ෂුව. මේක අහල, අනික් ස්වාමීන් වහන්සේලා එකතු වෙලා මේ දෘෂ්ටිය ඉවත් කරන්න බොහොම උත්සාහ කළා. "එහෙම කවදාවත් බුදුරජාණන් වහන්සේ දේශනා කළේ නෑ" කියල - ඔය විදියට, නමුත් බැරි උනා. බැරි උනාම මේ භික්ෂූන් වහන්සේලා ගිහිල්ල සාරිපුත්ත ස්වාමීන් වහන්සේට ආරාධනා කළා මෙන්න මෙහෙම අපේ මේ යමක ආයුෂ්මතුන් වහන්සේට මෙහෙම මිථ්‍යා දෘෂ්ටියක් ඇතිවෙලා තියනවා කරුණාකරල ඇවිල්ල මේක දුරු කරන්න කියල. සාරිපුත්ත ස්වාමීන් වහන්සේත් මෙතන්ට වැඩම කරල යමක ස්වාමීන් වහන්සේගෙන් මෙහෙම දෘෂ්ටියක් තියනවද කියල අහල කාරණේ ඇත්ත බව හෙළිවුනාට පස්සෙ ඔන්න ඊළඟට ප්‍රශ්නෝත්තර ක්‍රමයකින් අර මිථ්‍යා දෘෂ්ටිය ඉවත් කරන්න උත්සාහ කරනව. මොකක්ද පළමුවෙන්ම ඉදිරිපත් කළ ප්‍රශ්නෝත්තර ටික? අපි අර කලිනුත් අනුරාධ සූත්‍රයෙන් උපුටා දැක්වූ, බුදු පියාණන් වහන්සේ අනුරාධ ස්වාමීන් වහන්සේගෙන් ඇසූ ප්‍රශ්නමයි. ඒ කියන්නේ, ත්‍රිලක්ෂණය. එය අවස්ථා වශයෙන්, පියවර වශයෙන්, අපි දක්වුවා අවබෝධ කරගන්න පහසුවීම සඳහා. පළමුවෙන්ම ශාරිපුත්‍ර ස්වාමීන් වහන්සේ අහනව, මෙන්න මෙහෙම - අපි කෙටියෙන් සළකා ගත්තොත් - 'ඇවැත්ති යමක රූපය නිත්‍යද අනිත්‍යද? අනිත්‍යයි ඇවැත්නි. යමක් අනිත්‍යද එය සැපද දුක්ද? දුකයි ඇවැත්නි. යමක් අනිත්‍යද දුකද වෙනස් වන ස්වභාවය ද එය පිළිබඳව මෙය මගේය මෙය මම වෙමි මෙය මගේ ආත්මයයි කියා හිතා ගැනීම, කියා ගැනීම සුදුසුද? සුදුසු නැත, - කියල. අන්න එතකොට පළමුවෙන්ම ත්‍රිලක්ෂණය පිළිබඳ ප්‍රශ්නෝත්තර ක්‍රමයකින්, අනාත්ම ලක්ෂණය මතුකර ගත්ත. ඒක පළමු පියවර.

ඊළඟට ඒ මතුකර ගත්තු අනාත්ම ලක්ෂණය එකොළොස් ආකාරයකින් සම්මර්ශනය සඳහා යොදවනව. "එහෙම නම් ඇවැත්නි යමක, එමනිසා 'යං කිඤ්චි රූපං අතීතානාගත පච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා සබ්බං රූපං නෙතං මම නෙසො හමස්මි. න මෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං' ආදී වශයෙන් යම් රූපයක් අතීත අනාගත වර්තමාන කියන කාලත්‍රයට අයිතිද ආධ්‍යාත්මිකද, බාහිරද, රළුද, සියුම්ද, හීනද, ප්‍රණීතද, ළඟ හෝ ඈත හෝ වේද මේ කියන්නෙ හැම රූපයක්ම, රූප ස්කන්ධය සම්පූර්ණයෙන්ම, ඒ පිළිබඳව මෙය මගේ නොවෙයි මෙය මම නොවෙයි මේ මගේ ආත්මය නොවෙයි යනාදී වශයෙන් සම්මර්ශනය කරනව කියල ඒ විදියට එක් එක් ස්කන්ධය පිළිබඳව ප්‍රකාශ කරල ඒ විදියට යථාභූත වශයෙන් දැකීම නිසාම නිබ්බිදාව ඇතිකරගෙන, නිබ්බිදාවෙන් කෙනෙකු විමුක්ත වෙන, ක්ෂීණාශ්‍රව තත්ත්වයට පත්වෙන ආකාරය ඒ දෙවන

පියවර වශයෙන් අර ප්‍රශ්නෝත්තර මාර්ගයෙන් යමක ස්වාමීන් වහන්සේට ඒත්තු ගැන්වුව.

ඊළඟට තුන්වන පියවර හැටියට - ඒකත් අර බුදු රජාණන් වහන්සේ අනුරාධ ස්වාමීන් වහන්සේගෙන් ඇසූ ප්‍රශ්න වලට අදාලයි. ඒ විධියටමයි. ඊළඟට අහනව "එහෙමනම් දැන් මේ විමුක්ත භික්ෂුව පිළිබඳව, මේ තථාගතවරයා පිළිබඳව, මෙහෙම කියන්න පුළුවන්ද, යමක": 'රූපං තථාගතොති සමනුපස්සති' රූපය තථාගතවරයා හැටියට හිතනවද? නැත. එහෙනම්' රූපස්මිං තථාගතො ති - 'රූපය තුළ තථාගතයන් වහන්සේ ඉන්නවයි කියල හිතනවද? නැත.' අඤ්ඤත්‍රරූපා' - රූපයෙන් පිට තථාගතයන් වහන්සේ සිටිනවද? නැත. එහෙම නැත්නම් තථාගතයන් වහන්සේ රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ මොකවත් කිසිදෙයක් නැති කෙනෙක්ද? ' - අරූපී, අවෙදනො, අසඤ්ඤී, අසංඛාරො, අවිඤ්ඤාණො' එහෙමත් නැත.

අන්න ඊළඟට තමයි අර නිගමනාත්මක විධියට කාරණය හොඳටම ඒත්තු ගන්වන්න සාරිපුත්ත ස්වාමීන්වහන්සේ යමක ස්වාමීන් වහන්සේගෙන් අහන්නෙ මෙන්න මේ ප්‍රශ්නය. 'එත්ථ තෙ ආවුසො යමක දිට්ඨෙව ධම්මෙ සච්චතො ථෙතතො තථාගතෙ අනුපලබ්භියමානෙ කල්ලංනු තං වෙය්‍යාකරණං, තථාහං භගවතා ධම්මං. දෙසිතං ආජානාමි යථා ඛීණාසවො භික්ඛු කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණා' ඉතින් මෙහිදී මේ පිළිබඳව ඇවැත්නි, යමක, මේ කාරණයෙහි ලා, දිට්ඨ දම්යෙහිම සත්‍ය වශයෙන් ස්ථිර වශයෙන් තථාගත කෙනෙකුන් නොලැබෙන කල්හි, අර ඔබ වහන්සේ කලින් කළ විවරණය, ඒ කියන්නේ තථාගතයාණන් වහන්සේ දේශනා කළ ආකාරයට ක්ෂීණාශ්‍රව භික්ෂුව කය බිඳීමෙන් මත්තෙහි උච්ඡේද වෙයි.' කියන මතය හරිද? එතෙන්දි පිළිගන්න සිද්ධ වෙනව යමක ස්වාමීන් වහන්සේට - 'නැත ඇවැත්නි' කියල පිළිතුරු දෙනව. ඊළඟට සැරියුත් ස්වාමීන් වහන්සේ පාඩමක් උගන්වල තවදුරටත් ඒ ගෝලයාගෙන් ඒ කාරණයට ස්ථිරවම පිළිතුරු ලබාගන්නව වගේ - පාඩම් ලබාගන්නව වගේ - තවත් ප්‍රශ්නයක් අහනව. හොඳයි ඇවැත්නි යමක දැන් කවුරුවත් ඇවිල්ල, යම්කිසි ප්‍රශ්නයක් ඇසුවොත්: 'යො සො ආවුසො යමක අරහං ඛීණාසවො සො කායස්ස භෙදා පරම්මරණා කිං හොති?' ඇවැත්නි යමක මේ අර අරහත් ක්ෂීණාශ්‍රවයන් වහන්සේ කය බිඳී යාමෙන් මත්තෙහි ඒ තැනැත්තාට මොකද වෙන්නේ කියල එහෙම ඇහුවොත් ඔබ මොකක්ද දෙන පිළිතුර? ඔන්න ඊළඟට තමයි ඉතාමත් වටිනා නිගමනාත්මක පිළිතුරක් යමක ස්වාමීන් වහන්සේගෙන් ප්‍රකාශ වෙන්නෙ. **එතකොට 'මම දෙන පිළිතුර මේකයි. 'රූපං ඛො ආවුසො අනිච්චං, යදනිච්චං තං දුක්ඛං යං දුක්ඛං තං නිරුද්ධං**

**තදනුගතං' ඒ විධියටම වේදනා ආදී අනෙකුත් ස්කන්ධ පිළිබඳවත් කියනව. 'ඇවැත්නි රූපය අනිත්‍යයි. යමක් අනිත්‍යද එය දුකයි. යමක් දුකද එය නිරුද්ධ උනා එය අස්තයට ගියා.** එච්චරයි, කතාව. එතකොට ඔන්න ඕකයි මම දෙන පිළිතුර. 'තථාගත' වචනයක්, 'සත්ත්ව' වචනයක්, පුද්ගල වචනයක්, මොකක් වත් කිට්ටුවකටවත්, අහලකටවත්, අරගෙන නැහැ - මේ පිළිතුරේ. එපමණක් නොවෙයි, ඊළඟට මෙතන්දි එක්තරා ප්‍රීති වාක්‍යයක් ප්‍රකාශ කරනව යමක ස්වාමීන් වහන්සේ - ඇත්ත වශයෙන් කලින් අහපු ප්‍රශ්නයේදියි ප්‍රකාශ කරන්නේ - 'කලින් මට මෙන්න මෙහෙම මිථ්‍යා දෘෂ්ටියක් තිබුණා. අර විධියට බුදුරජාණන් වහන්සේ දේශනා කළ ආකාරයට මරණින් මත්තෙහි විමුක්ත භික්ෂුව උච්ඡේද වෙයි කියල, ඒ විදියට වැරැදි අදහසක් මට තිබුන, පාපක දෘෂ්ටියක්. ඒ අවිද්‍යාව නිසයි. නමුත් ඇවැත්නි සාරිපුත්ත ඔබ වහන්සේගේ මේ ධර්ම දේශනය අහල, ඒ පාපක දෘෂ්ටිය ඉවත් උනා. ඊළඟට තව වචන කීපයක් ප්‍රකාශ කරනව: 'ධම්මො ච මෙ අභිසමිතො' එයින් කියැවෙන්නෙ සෝවාන් මාර්ග ඵලයත් ලැබුව. එතනින් නැවතුනෙ නැහැ සාරිපුත්ත ස්වාමීන් වහන්සේ - එතකොට දන් මේ සෝවාන් වෙලත් ඉවරයි අර ප්‍රශ්නෝත්තර ටික ඉවරවෙනකොට.පාපක දෘෂ්ටියක් අරගෙන අනෙක් ස්වාමීන්වහන්සේලාටත් හික්මවන්න බැරි උනු භික්ෂුන් වහන්සේ කෙනෙක් මේ. සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරනව 'සාධු සාධු' කියල. ඒ පිළිතුරු පිළිඅරගෙන සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරනව හොඳයි මේ කාරණය තවදුරටත් පැහැදිලිවීමට මම උපමාවක් දෙන්නම් කියල. ඒ උපමාව ඉතාමත් වටිනා ගැඹුරු උපමාවක්. මෙන්න මේකයි උපමාව.

යම්කිසි ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් සිටිනව, ඒ ගෘහපතියා හෝ ගෘහපති පුත්‍රයා ධනවත්. බොහොම භෝග සම්පත් ඇති, එමෙන්ම බොහොම හොඳ ආරක්ෂා සංවිධාන ඇතිව ජීවත්වෙන කෙනෙක්. ඒ ගෘහපතියාට හෝ ගෘහපති පුත්‍රයාට යම්කිසි සතුරෙක් ඇති වෙනව. සතුරෙක් ඇති වුනාට මොකද ඒ සතුර හෙළිකරන්නේ නැහැ තමාගේ සතුරු කම. ඒ වෙනුවට මේ සතුර කරන්නෙ - කල්පනා කරනව - 'මට මේ පුද්ගලය මරන්න නම් විශ්වාසයට අරගෙනයි මරන්න ඕන' කියල බොහොම ගරු සැලකිලි ඇතුව ළං වෙලා 'උපට්ඨහෙය්‍යං භන්තෙ' මම ඔබ වහන්සේට උපස්ථාන කරන්නම් කියල පවරනව. අර ගෘහපතියත් ඒක පිළිඅරගෙන උපස්ථායකයෙක් හැටියට යොදවනව. ඒ වගේම මේ තැනැත්තා බොහොම කීකරුව 'පුබ්බුට්ඨායී පච්ඡානිපාතී කිංකාර පටිස්සාවී මනාපචාරී පියවාදී' ආදී වශයෙන් දක්වන ආකාරයට ස්වාමියාට කලින් නැඟිටිමින් පසුව නින්දට යමින්, කියන කියන වැඩ කටයුතු කරමින්, බොහොම මනාප අන්දමින් හැසිරෙමින්, ප්‍රියවචන දොඩමින්, ඔය විධියට උපස්ථාන

කරනව. එතකොට ඒක දැකල අර ස්වාමියා - අර ගෘහපතියා හෝ ගෘහපති පුත්‍රයා 'මේ මගේ හොඳ මිත්‍රයෙක්, කියල බොහොම සුහද කෙනෙක්' කියල විශ්වාසය ඇතිකරගන්නව. යම් අවස්ථාවක අර සතුරු පුද්ගලයා තේරුම් ගත්තනම් දැන් ඉතින් මට හොඳට විශ්වාසයි මේ පුද්ගලයා, මාව විශ්වාසයට අරගෙනයි තියෙන්නෙ, කියල දැනගත්ත නම්, අන්න ඒ අවස්ථාවේ දි තියුණු ආයුධයක් අරගෙන තමන්ගේ ස්වාමියා තනිව සිටින වෙලාවක් බලල, මරණව.

මේකයි උපමාව. ඊ ළඟට මේ උපමාව අනුව ශාරිපුත්‍ර ස්වාමීන් වහන්සේ ප්‍රශ්න කීපයක් නගනව යමක ස්වාමීන් වහන්සේගෙන් උත්තර ලබා ගැනීමට. 'කුමක්ද යමක සිතන්නෙ, දැන් අර සතුරු පුද්ගලය අර ගෘහපතිය හෝ ගෘහපති පුත්‍රය වෙත එළඹිල මම උපස්ථාන කරන්නම් කියල ඒ පැවසූ අවස්ථාවේ, ඒ අවස්ථාවේත් ඔහු වධකයෙක් නොවේද? වදකය නමුත් අර ගෘහපතිය දැන ගෙන සිටියෙ නැතිඑක පමණක් නොවෙයිද මෙතන කාරණය? එහෙමයි.' කියල යමක ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරනව. ඒ වගේම අර පැවරූ අවස්ථාව වගේම උපස්ථාන කරන අවස්ථාවෙත් අර පුද්ගලය සේවකයෙක් හැටියට-වදකයා වදකයම නේද? ඒකත් එහෙම බව පිළිගන්නව. ඊළඟට මැරුව අවස්ථාවෙ - ඒක අහන්නම දෙයක් නැහැ, වධකයමයි. **නමුත් වදකය බව තේරුම් ගත්තෙ නැහැ ස්වාමිය. ඔච්චරයි වෙනස.** මේ වධකයෙක් මේ උපස්ථාන කරන්නෙ, නමුත් මිත්‍රයෙක් හැටියට සුහද කෙනෙක් හැටියට හිතාගෙනයි අර විධියට උපස්ථානයේ තබා ගත්තෙ. ඔන්න එතකොට ඊළඟට උපමේය සම්බන්ධ කරනව. 'එවමෙව බො ආවුසො යමක අස්සුතවා පුථුජ්ජනො රූපං අත්තතො සමනුපස්සති' අශ්‍රැතවත් පෘථග්ජනය මේ එක් එක් ස්කන්ධය ආත්මය හැටියට සළකනවය. ඒ වගේම 'සො අනිච්චං රූපං අනිච්චං රූපන්ති යථාභූතං නප්පජානාති. දුක්ඛං රූපං දුක්ඛං රූපන්ති යථාභූතං නප්පජානාති. අනත්තං රූපං අනත්තං රූපන්ති යථාභූතං නප්පජානාති. සංඛතං රූපං සංඛතං රූපන්ති යථාභූතං නප්පජනාති. වධකං රූපං වධකං රූපන්ති යථාභූතං නප්පජානාති' ඒ වගේම අශ්‍රැතවත් පෘථග්ජනය මේ අනිත්‍ය රූපය අනිත්‍ය වශයෙන් යථාභූතව දන්නෙ නැහැ. දුක් සහිත මේ රූපය දුකක් කියල තේරුම් ගන්නෙ නැහැ. අනාත්ම එක අනාත්ම හැටියට තේරුම් ගන්නෙ නැහැ. සංඛත දෙයක් වූ මෙය සංඛත බව තේරුම් ගන්නෙ නැහැ. වධකයෙක් බඳු මේ රූපය වධකයෙක් බව තේරුම් ගන්නෙ නැහැ. එතකොට ඒකයි ඒ අශ්‍රැතවත් පෘථග්ජනයගෙ ආකල්පය. එහි ප්‍රතිඵලය ඊළඟට දක්වනව. එම නිසා ඒ අශ්‍රැතවත් පෘථග්ජනය 'සො රූපං උපෙති උපාදියති අධිට්ඨාති අත්තාමෙති. ඒ රූපයට ළංවෙනව, රූපය අල්ලගන්නව,

රූපය පිළිබඳව මේ මගේ ආත්මයයි කියල ඉටා ගන්නව. ඒ විධියට එක් එක් ස්කන්ධය පිළිබඳව වැරදි අදහසක්, වැරදි ඇල්මක් ඇති කර ගන්නව.

එම නිසා, ඒ අශ්‍රුතවත් පෘථග්ජනය ඇතිකරගත්තු ඒ මිථ්‍යා සංකල්පනා නිසා, දීඝ් කාලයක් දුකට භාජනය වෙනව. ඊළඟට ශ්‍රුතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකයා පිළිබඳව ප්‍රකාශ කරනව. ශ්‍රුතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකයා 'සො රූපං න අත්තතො සමනුපස්සති' ඔහු රූපය ආත්මය හැටියට දකින්නේ නැහැ. සළකන්නේ නැහැ. ඒ වගේම අනිච්චං රූපං අනිච්චං රූපන්ති යථාභූතං පජානාති. දුක්ඛං රූප දුක්ඛං රූපන්ති යථාභූතං පජානාති. අනත්තං රූපං අනත්තං රූපන්ති යථාභූතං පජානාති. සංඛතං රූපං සංඛතං රූපන්ති යථාභූතං පජානාති. වධකං රූපං වධකං රූපන්ති යථාභූතං පජානාති' ඒ විධියට ශ්‍රුතවත් ආර්‍ය්‍ය ශ්‍රාවකයා අනිත්‍ය රූපය අනිත්‍ය හැටියට යථාභූතව තේරුම් ගන්නව. දුක් සහිත රූපය දුක් බව තේරුම් ගන්නව. අනාත්ම බව තේරුම් ගන්නව, සංඛත බව තේරුම් ගන්නව, වධකයෙක් බව තේරුම් ගන්නව, ඒ විධියට ඒ තේරුම් ගැනීම ඒ ආර්‍ය්‍ය පුද්ගලයාට බොහෝ කලක් හිත සුව පිණිස පවතිනව.' කියල ඔන්න ඔය විදියට අර උපමා උපමේය හොඳට සන්සන්දනය කරල ශාරිපුත්‍ර ස්වාමීන් වහන්සේ කාරණය ඒත්තු ගැන්වුව යමක ස්වාමීන් වහන්සේට.

ඇත්ත වශයෙන්ම මේ එක් එක් ස්කන්ධය කලින් ඉඳලම වධකයො. නමුත් වධක බව දන්නෙ නැතිව ආත්මයය, මමය, මගේය කියල කියාගන්න තත්ත්වයක් සාමාන්‍ය ලෝකයා තුළ තිබෙන බවයි හෙළි කළේ. මේ දේශනාව අවසාන වෙනකොට යමක ස්වාමීන් වහන්සේ මෙන්න මෙහෙම මහ පුදුම ප්‍රකාශයක් කරනව. 'මෙන්න මෙහෙම දේවලුත් වෙනව ඇවැත්නි, සාරිපුත්‍ර, ඔබ වහන්සේ වැනි, සබ්‍රහ්මචාරීන්ට හිතකාමී වූ, වැඩදායක වූ, අනුකම්පක වූ හිතවතුන් සිටින අයට මෙහෙමත් දෙයක් වෙනව. කොහොම දෙයක්ද? **ඔබ වහන්සේගේ මේ දේශනාව අහල මගේ සිත ආශ්‍රවයන්ගෙන් මිදුන. රහත්වුනා. සමහරවිට ධර්මයේ සන්දිට්ඨික අකාලික එහිපස්සික ආදී ගුණ ගැන සැක කරන මේ යුගයේ මේක මහ පුදුමයක් වෙන්න පුළුවන්. මේ සූත්‍ර දේශනාව ආරම්භ කරන්නෙ අර අනික් භික්ෂූන් වහන්සේලාටත් හික්මවන්න බැරි මහා වැරදි පාපක දෘෂ්ටියක් ඇති යමක භික්ෂුවගෙන්. නමුත් ඉවර වෙන්නෙ අර්හත් බවට ප්‍රතිඥා දෙන ප්‍රීති වාක්‍ය ප්‍රකාශ කරන, යමක ස්වාමීන් වහන්සේ කෙනෙකුගෙන්.**

එතකොට ඔන්න ඔය විධියෙ තත්ත්වයක්. මෙතනින් අපට පෙනෙනව තථාගතයන් වහන්සේගේ මරණින් මතු තත්ත්වය පිළිබඳ අව්‍යාකෘත ප්‍රශ්නය යට කොයිතරම් වටිනා ධර්ම කොට්ඨාශයක් තියෙනවද කියල. මේවට සමහරු අතගහන්න බයයි. යම්කිසි භීතියක් තියනව, සමහර විට ශ්‍රද්ධාව නිසා. ප්‍රඥාව නැති ශ්‍රද්ධාව-ප්‍රඥාවෙන් අනුබලයක් නොලැබූ ශ්‍රද්ධාව-

නිසා මේ ප්‍රශ්නයට අතගහන්න පවා බයයි සමහරෙක්. නමුත් මේක තුළ තිබෙන්නෙ අර සම්මා දිට්ඨිය පිරිසිදු වන වටිනා ධර්ම කොට්ඨාශ රාශියක්. ඒක නිසා තමයි අර යමක ස්වාමීන් වහන්සේ රහත් උනේ. එතකොට මෙන්න මේ විධියට අපට තේරුම්ගන්න පුළුවනි, මේ සූත්‍රය ආශ්‍රයෙනුත්, මේ අව්‍යාකත ප්‍රශ්නවලදි බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළ මේ විසඳුම ඇත්ත වශයෙන්ම ශූන්‍යතා ප්‍රතිසංයුක්ත සූත්‍ර දේශනා කියල කියන්නෙ අර සත්ත්ව පුද්ගල කියන සාමාන්‍ය ලෝකයේ තිබෙන ව්‍යවහාර වලින් ඉවත්වෙල හුදු ධර්ම ස්වභාවයක් හැටියට චතුරාර්‍ය්‍ය සත්‍ය දේශනාවම මතුකරවන ඒ වගේම සත්ත්ව පුද්ගල ආදී කිසිවක් නැති තත්ත්ව හඟවන දේශනා. මෙන්න මේ දේශනා සාමාන්‍යයෙන් ලෝකයාට බිය ගෙන දෙන දේවල්. ඒක නිසා තමයි අර අනාගතේ බලා වදාළ බුදුපියාණන් වහන්සේ දේශනා කළේ, ප්‍රකාශ කළේ. බුද්ධ කාලයේදිත් මේව තේරුම් ගන්ට බැරිව නොයෙකුත් පටලැවිලි තිබුණුබව හෙළිවුන. ඒ වගේම විශේෂයෙන්ම අනාගතයේදී මෙබඳු මේ ශූන්‍යතා ප්‍රතිසංයුක්ත දේශනා වලට අනාගත භික්ෂූන් වහන්සේල 'න සුස්සුසිස්සන්ති න සොතං ඔදහිස්සන්ති න අඤ්ඤාචිත්තං උපට්ඨපෙස්සන්ති'[6] කියල එහෙම සඳහන් වෙනව. මේවට කන් දෙන්නෙ නැහැ. මේවට ඇහුම්කන් දෙන්න කැමති වෙන්නෙ නෑ, මේවට කන් නැමෙන්නෙ නැහැ. මේව තේරුම්ගන්න උත්සාහවත් වෙන්නෙ නැහැ කියල.

එතකොට මෙන්න මේ ධර්මයේ ගැඹුරු අංශයක් හෙළිවන මේ කාරණය ගැන අපට තව දුරටත් තේරුම් ගන්න පුළුවනි. දැන් ඔන්න මහ දෙයියමක් - මහ දෙයියමක් කියල කියන්නෙ දෙයියන්ගෙ තොවිලයක්, ඒ දෙයියන්ගෙ තොවිලයක් - ඉවරවෙන එළිවෙන යාමෙදි ඇදුරා එක්තරා විධියක ත්‍රාසජනක වැඩක් කරනව. පන්දමයි දුම්මල අහුරයි අරගෙන ගේ පුරා යමින් ඇඳ පුටු මේස යටට, අල්මාරි යටට, පොත් පෙට්ටි වලට, මල්බලි වලට, හැම එකකටම දුම්මල පාරවල් ගහනව. මහා ගිනිදැල් නගිනව. සමහර කෙනෙක් බය වෙනව මේ ඇදුර ගේ ගිනි තියන්න හදනව කියල. ඔන්න ඔය විදියටම මිනිසුන්ගේ සිත්වල තිබෙන සක්කාය දිට්ඨිය දුරුලීමට (ඇදුර අර විධියට කරන්නෙ ගේ ගිනි තියන්න නොවෙයි යක්ෂ, ප්‍රේත, භූත දෘෂ්ටි ඉවත් කිරීමටයි) **තිලොවග ඇදුරාණන් වහන්සේටත්, දෙව් මිනිසුන්ගෙ ශාස්තෘන් වූ බුදුරජාණන් වහන්සේටත්, ඔය විදියටම දුම්මල ගැහීමක් කරන්න සිද්ධ උනා. කුමකටද දුම්මල ගැහුවෙ? මේ භාෂා ව්‍යවහාරයට, භාෂාවෙ තිබෙන යම් යම් වචන වලට**. මේ භාෂාව උපයෝගී කරගෙනයි මේ ධර්මය දේශනා කළේ, නමුත් අතක්කාවචර ධර්මයක්. භාෂාවෙ ව්‍යාකරණයට තර්කයට යටවෙන්නෙ නැති, ඒවා ගැඹුරටම විග්‍රහ කරන විධියේ, මහ පුදුම ධර්මයක්', **මේක අතක්කාවචර දේශනාව**. ඒක තමයි අර

සතර කොන් ප්‍රශ්න වලින් කිට්ටු කරන්න බැරි මේ ධර්‍මයට. ඒව ඉක්මවල යනව. සත්ත්ව ප්‍රඥප්තිය ඉක්මවල ගිය රහතන්වහන්සේ, අර සංසාර වට්ටය, ප්‍රඥප්ති ආදිය ඉක්මවල ගිය. අන්න එබඳු තත්ත්වයක් - එතකොට ඒක නිසා තමයි අර දුම්මල පාරවල් ගැහුවෙ. මේ "අත්තා" කියන වචනයට සමහර විට බුදුරජාණන් වහන්සේ දුම්මල ගහල තිබෙනව. ආත්ම කියන වචනය ලෝකයා ඉතාම ප්‍රිය කරන වචනයක්. බුදුරජාණන් වහන්සේටත් ඒ වචනය යොදන්න සිදු උනා. ධම්ම පදයෙ අත්තවග්ගය කියල වෙනම වග්ගයකුත් තියෙනව. නමුත් අත්ත කියල කියන්නෙ නියත ආත්මයක් කියන ඒ අදහසින් නොවෙයි. 'තමා' කියන එකයි. සමහර කෙනෙක් ඔය ධම්ම පදයෙ 'අත්තා' කියන වචනය විග්‍රහ කරන්න ගිහිල්ල අමාරුවෙ වැටුනු අවස්ථාවලුත් තියෙනව. දැන්

**'අත්තා හි අත්තනො නාථො - කො හි නාථො පරො සියා**
**අත්තනාව සුදන්තෙන - නාථං ලභති දුල්ලභං'**

කියන එබඳු ගාථා වල බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව තමා තමාගේම ගැලවුම්කාරයාය කියල. වෙන පිට ගැලවුම් කාරයෙක් කොහිද, තමා හොඳට දමනය වුනාම හොඳ ගැලවුම්කාරයෙක් ලබා ගන්නව කියන ඒ විධියෙ අදහසක්.

එතකොට මේක දැකල සමහර, කෙනෙක් ආත්මය කියල ගන්නව. නමුත් බාල වග්ගයෙ සඳහන් වෙනව

**'පුත්තාමත්ථි ධනම්මත්ථි - ඉති බාලො විහඤ්ඤති**
**අත්තාහි අත්තනො නත්ථි - කුතො පුත්තා කුතො ධනං'**

මට පුතුන් සිටිනව ධනය තියෙනව කියල මෝඩය හිතනවයි නමුත් තමාට තමන්වත් නැත. පුතුන් හා ධනය කොයින්ද. එතකොට කලින් ප්‍රකාශ උනා. 'අත්තාහි අත්තනො නාථො' තමා තමාගේ ගැලවුම්කාරයා, මෙතන ප්‍රකාශ කරනව තමාට තමන්වත් නැත, අන්න ඒ විධියට වචන නිසා ලෝකයාට ඇති කරගතහැකි වැරදි අදහස් සමහර අවස්ථාවල බුදුරජාණන් වහන්සේට කපා හැරීමට සිදුඋනා. ඒ වගේම තමයි - අර දැන් අපි දිගින් දිගටම ඒක විග්‍රහ කළා නිරුක්ති ආදිය දක්වමින් සත්ත කියන වචනයට - ඒ වගේම තමයි තථාගත කියන වචනයට. තථාගත කියන වචනය යට අර සක්කාය දිට්ඨිය හැංගිල තියෙනව. ඒක නිසා තමයි අර වගේ ප්‍රශ්න අහන්නෙ., ඒ නිසාම තමයි තථාගත කියන වචනය පිළිබඳව මේ විධියෙ ධර්මානුකූල කාරණා පිළිබඳව ගැඹුරට තේරුම් ගන්න පවා බයවෙන්නෙ කෙනෙක්. සක්කාය දිට්ඨිය ඒව තුළ ලැගගෙන සිටිනව. තථාගත වගේම වචනයක්

තමයි ලෝක කියන වචනය. ලෝක කියන වචනයට බුදුරජාණන් වහන්සේ ගැසූ දුම්මල පාරවල් කීපයක් කලිනුත් අපට හමුවුනා. අර සළායතන ආශ්‍රයෙන් ලෝකය හැඳින්වූ තැන්. ඒ වගේම අර අව්‍යාකත වස්තුවලම තිබෙනව 'සස්සතො ලොකො අසස්සතො ලොකො, 'අන්තවා ලොකො' 'අනන්තවා ලොකො' ආදී වශයෙන් ලෝකය සදාකාලිකද සදාකාලික නොවේද, ලෝකය අන්ත සහිතද එහෙම නැත්තම් අන්තයක් නැද්ද, ආදී වශයෙන් ඇසූ ප්‍රශ්න. ඒ හැම එකකදීම ලෝකය කියල ගත්තෙ මේ අර සාමාන්‍යයෙන් සම්මුතියෙන් කියැවෙන ලෝකයක්. සම්මුතිලෝකය හැටියට චක්කවාළ ලෝක කියල ඔය අටුවාවල ඒක තෝරන්නෙ. නමුත් බුදුපියාණන් වහන්සේ ගැඹුරු වශයෙන් ඒ 'ලෝක' පදය විග්‍රහ කරල දැක්වුව. ඒ සළායතන ආශ්‍රයෙන්. ඒකට ඉතාමත් වටිනා සූත්‍රයක් සඳහන් වෙනව සංයුක්ත නිකායේ සළායතන වග්ගයේ. එක්තරා සූත්‍රයක් තියනව බුදුපියාණන් වහන්සේ මෙන්න මෙහෙම ප්‍රකාශයක් සංඝයා වහන්සේලා ඉදිරියේ කරනව. 'නාහං භික්ඛවෙ ගමනෙන ලොකස්ස අන්තං ඤාතය්‍යං දට්ඨය්‍යං පත්තය්‍යන්ති වදාමි, න ච පනාහං භික්ඛවෙ අප්පත්වා ලොකස්ස අන්තං දුක්ඛස්ස අන්තකිරියං වදාමි.' [7]මහණෙනි මම ගමන් කිරීමෙන් ලෝකයේ කෙළවරට පැමිණිය හැකි යැයි නොවදාරමි. එසේම ලෝකයේ කෙළවරට නොපැමිණ දුක් කෙළවර කිරීමක්ද නැතැයි ප්‍රකාශ කරමි. මේක බැලුවාම ප්‍රහේලිකාවක් වගේ. ගමන් කිරීමෙන් ලෝකයෙ කෙළවරට එන්නත් බැහැ. හැබැයි ලෝකයෙ කෙළවරට නොපැමිණ දුක් කෙළවර කරන්නත් බැහැ. මෙහෙම ප්‍රකාශ කරල බුදුපියාණන් වහන්සේ විහාරයට වැඩම කළා. අර කලින් සූත්‍ර වල ඔය විදියෙ ක්‍රමයක් තියනව. බොහෝ විට තමන්ගේ ශ්‍රාවකයන් වහන්සේලා ලවා මේ ධර්මය විග්‍රහ කරවන්නට එක්තරා අභ්‍යාසයක් දීමට වෙන්න ඕන. එතකොට එහෙම ප්‍රකාශ කරල පියාණන් වහන්සේ විහාරයට වැඩම කළාට පස්සෙ එහි සිටිය සංඝයා වහන්සේල එකතුවෙලා 'අනේ මේ තරම් මේ කෙටියෙන් ප්‍රකාශ කළා මහා ගැඹුරු ධර්මයක්. අපට මේක තේරෙන්නෙ නැහැ. දැන් මේකෙ අර්ථය තේරුම් කරගන්නෙ කොහොමද? කියල ආනන්ද ස්වාමීන් වහන්සේ ළඟට ගිහිල්ල ආයාචනා කරනවා. උන්වහන්සේ අර අනිකුත් සූත්‍ර වල වගේම ටිකක් අදිමදි කරල නමුත් ඉදිරිපත් වෙල ඔන්න ඊළඟට විවරණය දෙනව. අර බුදුරජාණන් වහන්සේ දේශනා කළ කෙටි පාඨයෙ විවරණය මා තේරුම් ගන්නෙ මෙහෙමයි 'යෙන ඛො ආවුසො ලොකස්මිං. ලොකසඤ්ඤී හොති, ලොකමානී අයං වුච්චති අරියස්ස විනයෙ ලොකො. කෙන නුඛො ආවුසො ලොකස්මිං. ලොකසඤ්ඤී හොති, ලොකමානී. චක්ඛුනා ආවුසො ලොකස්මිං. ලොකසඤ්ඤී හොති ලොකමානී. සොතෙන, ඝානෙන, ජිව්හාය, කායෙන, මනෙන, ලොකස්මිං ලොකසඤ්ඤී හොති ලොකමානී. යෙන ඛො ආවුසො ලොකස්මිං. ලොකසඤ්ඤී හොති ලොකමානී අයං වුච්චති අරියස්ස විනයෙ

ලොකො.' ආනන්ද ස්වාමීන් වහන්සේ දෙන විග්‍රහය මේකයි. 'ඇවැත්නි යමකින් ලෝකය පිළිබඳව එහෙම නැත්නම් ලෝකයෙහි ලෝක සංඥාවක් ලෝකමානයක්, ලෝකය කියල කියන මානයක්, මැනීමක්, ඇතිකරගනීද අන්න එය මම ලෝකය යයි හඳුන්වමි. එය ආර්‍ය විනයෙහි, මේ ආර්‍ය ව්‍යවහාරයට අනුව, ආර්‍ය ශික්‍ෂණයට අනුව, ලෝකයයි කියනු ලැබේ. කුමකින්ද ලෝකය පිළිබඳ සංඥාවක් ඇතිවෙන්නෙ. කුමකින්ද ලෝකයක් මැනෙන්නෙ? ඇස කණ නාසය දිව කය මනස, කියන ඔය හයෙන්. එතකොට මෙයින් පෙනෙනව අර ලෝකය පිළිබඳව දුන්නු විග්‍රහය හරියටම යෝනිසෝමනසිකාරය අනුව දුන්න විග්‍රහයක්. අර අව්‍යාකත ප්‍රශ්න වලදි ලෝකය හඳුන්වන්නෙ අයෝනිසෝමනසිකාරයෙන්. මේ කාලයෙත් ඔය විද්‍යාඥයින් එහෙම නොයෙකුත් ආකාරයෙන් ඔය ලෝකයෙ කෙළවර සොයන්න යන්නෙ අර අයෝනිසෝමනසිකාරයෙන් හිතාගත්තු ලෝකයක. චක්‍රවාල ලෝක ආදිවශයෙන් දක්වන අර ඒ ලෝකය.

ඊළඟට මේ ආනන්ද ස්වාමීන් වහන්සේ කළ දේශනය අර භික්ෂූන් වහන්සේලා බුදුරජාණන් වහන්සේට සැළ කළාම බුදුරජාණන් වහන්සේ සම්පූර්ණයෙන්ම සම්මත කර වදාළා. එතකොට මේක බුද්ධ දේශනයක් පමණටම සත්‍ය එකක් හැටියට පිළිගත්තු දෙයක්. මෙයින් හැඟෙන්නෙ, මේ සළායතන ආශ්‍රයෙන්මයි ලෝකයා, ලෝක සංඥාවක් ඇතිකර ගත්තෙ. ලෝකය කියල මැනීමක් ඇතිකර ගත්තෙ. ලෝක මානය කියල කියන්නෙ, දැන් මේ කාලෙ කියන ලෝක මාන්නය නොවෙයි. ලෝකයක් මැනීම. එක නිදසුනක් ගත්තොත් ලෝකයේ දිග මැනීම ආදියට භාවිතා වන මිනුම් දණ්ඩ කුමක්ද? අහල, වියත, අඩිය, රියන, බඹය මේවා මේ කය ආශ්‍රයෙන්, මේ ශරීරය ආශ්‍රය කරගෙන - ඒකම තමයි මිනුම් දණ්ඩ. ඒ වගේම ඇහැත් මිනුම් දණ්ඩ කරගෙනයි ලෝකයක් මනින්නෙ. ඔය විධියට ලෝකයේ තිබෙන ඔක්කොම මිනුම් දඬු මේ එක් එක් ආයතනය ආශ්‍රය කරගෙනයි. අන්න ඒ නිසා තමයි මේක යෝනිසෝමනසිකාරයෙන්ම කළ ලෝක විවරණයක්, ලෝකය කියන දෙය පිළිබඳ විවරණයක් වෙන්නෙ. මේක පිළිබඳ අයෝනිසෝමනසිකාරයෙන් තමයි කෙනෙක් හිතාගන්නෙ මේ එක් එක් ලෝක. ඝන සංඥාවෙන් ගත්තු අදහසක් තමයි මේ සම්මුති ලෝකය. මේ ඝන සංඥාවෙන් ගත්තු අදහස නිසාම ඒවායේ සත්‍යතාවක් නැහැ. මක්නිසාද ලෝකයේ පැවැත්ම එහෙම පිටින්ම හටගැනීම් නැතිවීම් කියන ඒ ධර්මතාවෙන් යුක්තයි. ඒ ධර්මතාව අමතක කිරීමෙන් තමයි ඝන සංඥාව ඇති වෙන්නෙ. යම්කිසි විද්‍යා ප්‍රදර්ශනයක් බැලීමට ගිය දෙදෙනෙක් ඒ ප්‍රදර්ශනයෙ තිබෙන මැජික් කේතලයක් දිහා බලාගෙන සිටිනව. මැජික් කේතලයෙන් වතුර වැක්කෙරෙනව යම්කිසි භාජනයකට. එක්කෙනෙක් බලා ඉන්නව මැජික් කේතලය හිස් වෙනකල්. තවකෙනෙක් බලාගෙන ඉන්නව

භාජනය පිරෙන කල්. මේ දෙකම සිද්ධවෙන්නෙ නැහැ. මොකද හේතුව? අර මැජික් කේතලයෙන් වැක්කෙරෙන වතුර ධාරාව තුළින් සැඟවිලා යම්කිසි බටයක් උඩට යනව. ඒක නිසා මැජික් කේතලේ හිස් වෙන්නෙත් නැහැ. අර වතුර භාජනය පිරෙන්නෙත් නැහැ. ඕකමයි ඕකට මැජික් කේතලය කියල කියන්නෙ. ඔය විධියෙ දේවල් ඔය විද්‍යා ප්‍රදර්ශන වල එහෙම තියෙනව. ඔන්න ඔය විධියෙ දෙයක් තමයි මේ ලෝකය. සංවට්ට විවට්ට වශයෙන් මේ මහා සක්වලවල් - සක්වල කියන වචනයෙන්ම තේරෙනව ඒ චක්‍රාකාරයත්. අපි ගත්තොත් ඒ පුළුල් අර්ථයකින්, සංවට්ට විවට්ට වශයෙන් ලෝකයේ ප්‍රවර්තනය චක්‍රාකාරයි. සංවට්ට විවට්ට කියන හැම එකකම අර 'වට්ට' කියන වචනය සඳහන් වෙනව, චක්‍රාකාරයි. අර උදයබ්බය කියල කිව්ව වගේම තමයි. එතකොට එක සක්වලක් විනාශ වෙලා යනව. තව සක්වලවල් - බ්‍රහ්ම විමාන ආදිය මතු වෙනව. ඔය විධියට ලෝකයේ පැවැත්ම එහෙම පිටින්ම හටගැනීම් නැතිවීම් කියන දෙක උඩයි පවතින්නෙ. ඒක චක්‍රයක්. එතකොට චක්‍රයක් නම් මේකෙ කොනක් දකින්නෙ කොහොමද? මේක සදාකාලික හෝ සදාකාලික නොවන බවක් කියන්නෙ කොහොමද? මේ ප්‍රශ්නයම වැරදියි. "ලුජ්ජති පලුජ්ජති ලොකො" කියල බුදුපියාණන් වහන්සේ දුන්න නිර්වචනය හරියටම හරි. මේක බිඳී බිඳී යන සිඳී සිඳී යන, දෙයක්. ඒ බිඳෙන බව අමතක කරල සමුදය පක්ෂයේම සිත පිහිටුවාගෙනයි සාමාන්‍ය අශ්‍රැතවත් පෘථග්ජනයා ලෝකය කියල සම්මුති ලෝකයක් හඳුනාගෙන ඉන්නෙ.

නමුත් මොහොතක් පාසා මේක ඇතිවීම නැතිවීම් දෙකෙන් පෙළෙනව. එතකොට ඒකම තමයි මේ ආශ්වාස ප්‍රශ්වාසයෙ තිබෙන්නෙ. ශරීරයෙ හැම එකේම තියෙන්නෙ අර උදයබ්බය ස්වභාවයයි. අන්න ඒක නිසා බුදුරජාණන් වහන්සේ ලෝකය පිළිබඳ අලුත් විග්‍රහයක් දුන්නා. 'ආර්ය ව්‍යවහාරයට අනුව ලෝකය විග්‍රහ කරන්නෙ මේ සළායතන ආශ්‍රය කරගෙනයි. මෙයින්ම, ඊළඟට ඒකෙන්ම, අහුවෙනව මනස-මනසත් ධර්මයනුත් මේ හැම එකක්ම අහුවෙනව මේ සළායතනයට. සළායතනයෙන් පිට කිසිවක්ම නැහැ. ඔන්න ඔය විදියෙ තත්ත්වයක් . . .

# අධෝලිපි

1. සං.නි II බු.ජ. 14-28 පිට
2. ම.නි. I බු.ජ. 10-350 පිට.
3. ප.සූ. (හේ.මු. 35) - 97 පිට
4. දී.නි. I බු.ජ. 7-80 පිට
5. සං. නි. III බු.ජ. 15-188 පිට
6. සං. නි. II බු.ජ. 14-412 පිටුව
7. සං.නි. IV බු.ජ. 16-196 පිට

# 23 වන

# දේශනය

# 23 වන දේශනය

**"නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"**

"එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධි පටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං."

" මෙය ශාන්තය මෙය ප්‍රණීතය එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම, සියලු උපධීන් අතහැර දැමීම, තණ්හාව ක්‍ෂය කිරීම, නොඇල්ම නම් වූ විරාගය, නැවැත්ම නම් වූ නිරෝධය, නිවීම නම් වූ නිබ්බානය."

**අතිපූජනීය මහෝපාධ්‍යාය මාහිමිපාණන් වහන්සේ ප්‍රධාන ගරුතර යෝගාවචර මහා සංඝ රත්නයෙන් අවසරයි. නිබ්බාන යන මාතෘකාව යටතේ පවත්වනු ලබන දේශනා මාලාවේ විසිතුන්වන දේශනයයි මේ.**

භව නිරෝධය නම් වූ නිවන, විභව දිට්ඨියක් හෝ උච්ඡේද දිට්ඨියක් හැටියට නොසැළකිය යුත්තේ තථාගතවරයා සත්ත්ව ප්‍රඥප්තිය ඉක්මවා ඇති නිසාය යන නිගමනයට තුඩු දෙන සාධක කලින් දවසේ දේශනයේදී අපි උපුටා දැක්වුව. තථාගතවරයා පිළිබඳවත් සත්ත්ව පුද්ගල යන වචන සූත්‍ර දේශනාවල යෙදිල තිබුනත්, එපමණකින්ම ශාස්වත දෘෂ්ටියට නැඹුරුවන අන්දමින් තථාගතවරයා මරණින් මත්තෙහි පවතියි කියන අදහසක් ප්‍රකාශ කිරීම ධර්මවිරෝධී බවත් අපට ඒ සූත්‍ර දේශනා වලින් පෙනී ගියා. අහංකාර මමංකාර මානානුසයන් දුරු කළ රහතන් වහන්සේ වෙන එකක් තබා 'මමය' 'මාගේය' කියන ඒ වචන පවා පාවිච්චි කරන්නේ ලෝක සමඤ්ඤා, ලෝකනිරුත්ති, ලෝක ව්‍යවහාර වලට එකඟ වීමක් වශයෙන් පමණක් බවත් අපි කලින් අවස්ථාවක සගාථක සංයුක්තයෙන් උපුටා දැක්වූ අරහං සූත්‍රයෙන් [1]පැහැදිලි උනා. ඒකේ අවශ්‍ය කොටස් දැන් ආයෙත් මතක් කර ගන්නව නම්, ඒ රහත් වූ භික්‍ෂුව පිළිබඳව මෙහෙම සඳහන් වෙනව. "අහං වදාමීතිපි සො වදෙය්‍ය, මමං වදන්තීතිපි සො වදෙය්‍ය, ලොකෙ සමඤ්ඤං කුසලො විදිත්වා වොහාර මත්තෙන සො වොහරෙය්‍ය" යම්කිසි රහත් භික්‍ෂුවක් මම කියමි යනුද කියන්නේය, මමං වදන්තීතිපි සො වදෙය්‍ය - මට කියත් යයි යනුවෙන් ද කියන්නේය. නමුත් ඒ, ලොකෙ සමඤ්ඤං කුසලො විදිත්වා - ලෝකයේ ඇති සම්මුතියක් දක්ෂ අන්දමින් තේරුම් ගෙන, වොහාර මත්තෙන සො වොහරෙය්‍ය - හුදෙක් ව්‍යවහාර මාත්‍රයක් වශයෙන් ව්‍යවහාර කරනව.

දිටුදැම්යෙහිම, ඇත්ත වශයෙන්ම තථාගත කෙනෙක් නැතැයි කියල ප්‍රකාශ කෙරෙන ඒ සූත්‍ර දේශනා වලින් පැන නඟින ශූන්‍යතා දර්ශනය අපි උපමා කළා මහ දෙයියමකදී ඇදුරා ගසන දුම්මල පාරකින් පැන නඟින ගිනි ජාලාවකට. සාමාන්‍යයෙන් කෙනෙකු තුළ භය උපදවන දෙයක්, මේ විධියේ දුම්මල ගැසීම. දුම්මල පාරවල් බුදුරජාණන් වහන්සේ උපකාර කර ගත්තේ මේ කෙලෙස් ආතුර වූ ලෝකයා සඳහා පැවැත්වූ ධර්ම යාගයේදී ලෝකයාගේ සිත්තුළ පැලපදියම් වෙලා තිබෙන සක්කාය දිට්ඨිය දුරු කිරීමටයි. මේ දුම්මල ගැසීමක් ගැන සූත්‍ර දේශනාවල නම් සඳහන් වෙන්නෙ නැහැ. නමුත් ඊට බොහෝ දුරට සමාන අදහසක් අඟවන වැදගත් වචනයක් සූත්‍ර දේශනා වල සමහරවිට දක්නට ලැබෙනව, 'විධූපෙති' කියල. දැන් 'ධූප' කියන වචනය යෙදෙනව දුම්වගී-සුවඳ දුම් ආදියටත් - මේ විධූපෙති කියන වචනය සඳහන් වෙනව, උදාන පාළියේ බොධි වග්ගයෙ එහෙම. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් පස්සේ පටිච්ච සමුප්පාද ධර්මය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් මෙනෙහි කරන අවස්ථා සඳහන් වෙන සූත්‍රයේ අගට මෙන්න මෙහෙම ගාථාවක් එනව.

**''යදා හවෙ පාතුභවන්ති ධම්මා - ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස**
**විධූපයං තිට්ඨති මාරසෙනං - සූරියොව ඔභාසයමන්තලික්ඛන්ති.[2]**

'යම් අවස්ථාවක කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව ධ්‍යාන වඩන්නාවූ බ්‍රාහ්මණයාට ඒ ධර්මයෝ පහළවෙත්ද ඒ අවස්ථාවෙහි, - "විධූපයං තිට්ඨති මාර සෙනං" - මාර සේනාව පලවා හරිමින් සිටිනව. හිරියට අහස ආලෝකවත් කරන්නාවූ සූර්යයා වගේ., තවත් සමහර සූත්‍රවල මේ විධූපෙති කියන වචනය සන්ධූපෙති කියන වචනයත් එක්ක සම්බන්ධ කරල දක්වනව. එතනත් අර 'ධූප' කියන වචනයයි තියෙන්නේ. මේ වචන දෙකේ අර්ථය ඒ තරම් ප්‍රකට නැහැ. මේ ගැන යම් යම් මතභේද තියනව. සන්ධූපෙති, විධූපෙති දෙකේම ධූප කියන වචනය තියෙනව. නමුත් සන්ධූපනය කියලා කියන්නේ, දැන් සමහර දුම් වගී අපි පාවිච්චි කරනව ආරාධනා කරන්න. තවත් සමහර - දුම්මල වගේ - දේවල් පාවිච්චි කරනව පලවා හරින්න. ඔන්න ඔය ක්‍රියා දෙකයි ඔය වචන දෙකේ අර්ථය හැටියට ගන්න තියෙන්නේ. සංයුක්ත නිකායේ බජ්ජනීය සූත්‍රයේ සඳහන් වෙනව ඒ ආර්‍ය්‍ය ශ්‍රාවකයා "විධූපෙති නො සන්ධූපෙති"[3] විධූපනය කරනව සන්ධූපනය කරන්නේ නැහැ. එතකොට මේක අමතර කාරණයක් හැටියට අපි සඳහන් කළේ. කෙසේ නමුත් මාර සේනාව පලවා හැරීම ආදී ඒ අදහස් එන්නත් එක්ක අර විධූපෙති කියන වචනය සඳහන් වෙනව.

සාමාන්‍ය ලෝකයා තථාගතවරයා හඳුනාගන්නේ අර නතර වූ දිය සුළියක් ඒ දියසුළිය මතුපිට නිදැල්ලේ පාවෙමින් තිබෙන කොළ රොඩු

අතු ඉති ආශ්‍රයෙන් හඳුනා ගන්නව වගෙයි. දිය සුළිය නතර උනාට පස්සේ තවමත් ඒ දිය සුළිය උඩින් කොළ රොඩු ආදිය කරකැවෙන කොට කෙනෙක් හිතාගන්නව එතන දිය සුළියක් තිබෙනව කියල. දිය සුළියේ කේන්ද්‍රස්ථානය ක්‍රියා විරහිත වී ඇති බව, දිය සුළිය වෙනුවට දැන් එතන තියෙන්නේ තනිකර මහමුහුද බව, කේවල මහ මුහුද බව, කෙනෙක් තේරුම් ගත්තොත්, ඒ තැනැත්තාට අර ශූන්‍යතා දර්ශනය නිසා, අර තථාගත කෙනෙක් නැතැයි කියල කියන කීම නිසා, ඇති වෙන දුඹුල් අස්ථාන භීතිය, දුරලන්නට පුළුවන් වෙනව. එතකොට දියසුළියක පටු කේන්ද්‍රස්ථානය නතර වීම, මහ මුහුදක් උරුම කර ගැනීමට සමානයි. **දිය සුළිය නතර උනාමයි මහමුහුද උරුම වෙන්නේ**. දිය සුළියට අයත් සීමිත දේවල් අතහැරීම, අසීමිත මහ මුහුදක් උරුමකර ගැනීම වගෙයි. මෙන්න මේ කියන මේ කියුම් වලින් නැගෙන ප්‍රහේලිකාව ඇත්ත වශයෙන්ම අර 'අරහත්' කියන වචනයේමත් ගැබ්වෙල තියෙනව. රහතන් වහන්සේට, බුදුරජාණන් වහන්සේට 'අරහා' 'අරහං' කියන වචන අපි පාවිච්චි කරනව, බුදුගුණ භාවනා ආදියෙහි. ඔය අරහත් කියන වචනයෙන් හැඟෙන්නේ - මූලික අර්ථය - නොයෙක් අර්ථ අටුවාචාරීන් වහන්සේල පස්සේ දක්වල තියෙනව - නමුත් ප්‍රධාන අර්ථය, අර්හත් කියන එකේ - පූජා ආදිය ලැබීමට සුදුසුකම. හැම දෙයක්ම ලැබීමට සුදුසු වීම කියන අදහසයි. මේ අර්හත් කියල කියන්නේ. **හැම දෙයක්ම අත හැරීමෙනුයි හැම දෙයක්ම ලැබීමට සුදුසුවන්නේ**. මෙතනත් තිබෙනව මහ ප්‍රහේලිකා තත්ත්වයක්.

රහත් වෙනව කියල කියන්නේ හැම දෙයක්ම අතහැරීම, තණ්හාව අතහැරීම. සම්පූර්ණයෙන්ම තණ්හාව ක්ෂය කිරීම එතකොට තණ්හාව ක්ෂය කළාට පස්සේ හැම ආශාවක්ම අතහැරියට පස්සෙයි, හැම දෙයක්ම අතහැරියට පස්සෙයි, හැම දෙයක්ම ලබන්නට සුදුසු වෙන්නෙ. ඔන්න ඔය විධියේ මහා ගැඹුරු තත්ත්වයක් තියෙනව, ඔය අරහත් කියන පදේ.

දැන් අස්මි මානය අනුව ගිය මිනීම්, මැනීම්, ක්‍රම හයක් තියෙනව. ඒකට තමයි සළායතන කියල කියන්නේ. 'අස්මි' - 'වෙමි' කියන මානය, වෙමි කියන මානය ප්‍රකට කරවන මිනුම් දඬු හයක් තියෙනව. ඒකටයි සළායතන කියල කියන්නේ. ඇස් කන් නාසාදී ඒ සළායතන වලින් කළ මිනුම්, ඇගැයුම්, ප්‍රමාණ කිරීම්, යම් අවස්ථාවක නතර උනාද, ඒ අවස්ථාවේ ඒ පුද්ගලයා අමිත බවට, අමිල බවට, අනගි බවට, අපරිමිත බවට, පත්වෙනව. අර දියසුළියත් මහමුහුදත් පිළිබඳ උපමාව වගේමයි. එතකොට මේ මිනුම් අතහැරීමයි අමිත බවට අපරිමිත බවට පත්වීමට ඇති ඒකායන මාර්ගය. මහ පුදුම දෙයක් මේක. ඒකම තමයි, දැන් දිය සුළියක් නතර උනාම, ඉබේම, ඒ දිහා බලාසිටින කෙනාගේ අවධානය යොමුවෙන්නේ මහ මුහුදේ ගැඹුරු බව, අපරිමිත බව, පෘථුල බව කියන

පැත්තටයි. ඒ වගේම දෙයක් මෙතන තියෙන්නේ. ඉතින් මේ විධියට කල්පනා කරල බලනකොට කෙනෙකුට පුළුවනි අර සාමාන්‍ය පෘථග්ජනයට අස්ථාන භීතියක් ගෙනදෙන මේ ශූන්‍යතා දර්ශනය තුළින් එක්තරා විධියක අලෞකික සුන්දරත්වයක් පවා මතුකර ගන්න. එහෙම මතුකර ගන්න ඉඩ තියෙන බවට හොඳ සාධක අපට හමු වෙනව ධම්ම පදයෙ පුප්ඵ වග්ග, අරහන්ත වග්ග, බ්‍රාහ්මණ වග්ග, බුද්ධ වග්ග ආදී වග්ග වලිනුත් සුත්ත නිපාතයෙ බොහෝ තැන් වලිනුත්. මහ පුදුම අන්දමේ අලංකාර අන්දමේ ගාථාත් අපට දකින්ට ලැබෙනව. මේකට හේතුව ධර්ම ස්වභාවයක් වශයෙන් සළකනව නම් මේ ශූන්‍යතාව - ආත්ම ආත්මීය ශූන්‍යතාව - පිළිබඳ ප්‍රඥාව පහළ වීම, ඒ ප්‍රඥාව පිහිටකර ගෙන ඒ මාර්ග ඵල අවබෝධ කරගැනීම, ඇත්ත වශයෙන් කියනව නම් සත්ත්වයාගේ සාංසාරික පැවැත්මේ පුෂ්පොත්භවය, ඵලෝත්භවය හැටියට සළකන්ට පුළුවන්. ඒ කියන්නේ මල්ඵල හටගැනීම වගෙයි. මේ අදහස් ප්‍රකාශ කෙරෙනව ධම්ම පදයෙ පුප්ඵ වග්ගයෙන් -

**"යථා සංකාරධානස්මිං - උජ්ඣිතස්මිං මහාපථෙ,**
**පදුමං තත්ථ ජායෙථ - සුචිගන්ධං මනෝරමං**
**එවං සංකාර භූතස්මිං - අන්ධභූතෙ පුථුජ්ජනෙ,**
**අතිරොචති පඤ්ඤාය - සම්මා සම්බුද්ධසාවකො."** [4]

"යම් සේ මහා මාර්ගය අසළ හැර දමන ලද කැලිකසල ගොඩක පිරිසිදු සුවඳ ඇති මනරම් පියුමක් හටගනීද, එසේම කැලිකසල ගොඩක් බඳු පුහුදුන් ලෝකයා අතර, සම්මා සම්බුදු ශ්‍රාවක තෙම ප්‍රඥාවෙන් විශිෂ්ට ලෙස බබලයි." එතකොට මේ සසර කැලිකසල ගොඩින් මතුවෙන ඒ මනරම් පියුම තමයි රහතන් වහන්සේ. මේක එතකොට බය වෙන්න දෙයක් නොවෙයි.

අපි ඒ වගේම පසුගිය දේශනයේදී උපුටා දැක්වූවා බුදුරජාණන් වහන්සේ ලෝකය පිළිබඳව දැක්වූ අලුත් නිර්වචන, අලුත් හැඳින්වීම්, පිළිබඳ සූත්‍රයක්. සංයුක්ත නිකායේ සළායතන වග්ගයෙ පළමුවන ලෝකකාමගුණ සූත්‍රයෙන් අපි උපුටා දැක්වුව පාඨ දෙකක්. එක පාඨයක් තමයි, ප්‍රහේලිකා විධියෙ කියමනක්. බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලා ඉදිරියෙ ප්‍රකාශ කළා "නාහං භික්ඛවෙ ගමනෙන ලොකස්ස අන්තං ඤාතය්‍යං දට්ඨය්‍යං පත්තය්‍යන්ති වදාමි. න ච පනාහං භික්ඛවෙ අප්පත්වා ලොකස්ස අන්තං දුක්ඛස්ස අන්තකිරියං වදාමි." "මහණෙනි මම, ගමන් කිරීමෙන් ලෝකයේ කෙළවරක් දැනගත හැකියැයි, දැකගතහැකියයි ඊට පැමිණිය හැකියැයි නොකියමි. ඒ වගේම මහණෙනි ලෝකයේ කෙළවරට නොපැමිණ දුකෙහි කෙළවරක් ඇතැයිද නොකියමි." ඉතින් මේ ප්‍රහේලිකාව විසඳ ගන්න

මේ සංසයා වහන්සේලා ආනන්ද ස්වාමීන් වහන්සේ ළඟට ගිහිල්ල ආයාචනා කළාට පස්සේ ආනන්ද ස්වාමීන් වහන්සේ දුන් පිළිතුරත් අපි එදා ප්‍රකාශ කළා. ඒ පිළිතුරේ ඇත්ත වශයෙන්ම අඩංගු වෙන්නෙ ලෝකය පිළිබඳව බුදුරජාණන් වහන්සේ අදහස් කළ අර්ථයයි. සාමාන්‍යයෙන් ලෝකය කියන අදහස නොවෙයි. එතකොට ඒ ලෝකය පිළිබඳව දුන් නිර්වචනය - ආනන්ද ස්වාමීන් වහන්සේ තේරුම් කරල දුන්න නිර්වචනය - "යෙන ඛො ආවුසො, ලොකස්මිං ලොකසඤ්ඤී හොති ලොකමානී අයං වුච්චති අරියස්ස විනයෙ ලොකො. කෙන චාවුසො ලොකස්මිං ලොකසඤ්ඤී හොති ලොකමානී. චක්ඛුනා ඛො ආවුසො ලොකස්මිං ලොකසඤ්ඤී හොති ලොකමානී. සොතෙන........ ඝානෙන......... ජිව්හාය........ කායෙන...... මනෙන....... ඛො ආවුසො ලොකස්මිං ලොකසඤ්ඤී හොති ලොකමානී. යෙන ඛො ආවුසො ලොකස්මිං ලොකසඤ්ඤී හොති ලොකමානී අයං වුච්චති අරියස්ස විනයෙ ලොකො" ඇවැත්නි, යමකින් ලෝකයෙහි ලෝකය පිළිබඳ සංඥාවක්-ලෝකය කියන හඳුනා ගැනීමක් වෙයිද-ලෝකය කියන මැනීමක් - ලෝකය කියන මානයක් ඇතිවෙයිද අන්න ඊටම ආර්යව්‍යවහාරයට අනුව ලෝකය යැයි කියනු ලැබේ. යමකින් ලෝකය මනී නම් ඒකටමයි ලෝකය කියල කියන්නේ. එතකොට ඒ කෝඩු හයයි ඔන්න එතනින් අර කියැවුනේ, මොනවයින්ද ලෝකය මනින්නේ, කුමකින්ද ලෝකය මනින්නේ, ලෝකය පිළිබඳ සඤ්ඤාවක් ඇතිකර ගන්නේ?, ඇස, කණ, නාසය, දිව, කය, සිත : ඔයින් ඇර වෙන ක්‍රමයකින් ලෝකයේ දැනගන්න බැහැ. ලෝකය ගැන ඇතිතාක් මතිමතාන්තර - ඒ හැම එකක්ම මනින්නේ මේ හයෙන්. මේක තේරුම් කිරීමට අපි පහසු නිදර්ශනයක් හැටියටයි එදා සඳහන් කළේ, අපට වෙන මිනුම් ක්‍රම නැත්නම්, ලෝක සම්මත වෙන දේවල් නැත්නම්, අපි ඇඟිලි පුරුක අඟල හැටියට ගන්නව, වියත, අඩිය, බඹය ආදී වශයෙන් අතීතයේ ඉඳලම මේ කය උපකාර කරගෙනයි ලෝකය මනින්නේ, දුර ආදිය මනින්නේ බොහෝවිට. ඒ වගේමයි අනිකුත් ඉන්ද්‍රියයන් ආශ්‍රයෙන්. **ඊටත් වඩා ඉතාමත්ම සියුම් මැනීම තමයි සිතෙන් කරන මැනීම**. මේ මනසින් කරන මැනීමේදී තමයි අර සංකල්ප ප්‍රඥප්ති ආදිය අපි උපකාර කරගන්නෙ. ඉතින් අන්න ඒව හැම එකකටම පහර වදිනව, ඒ හැම එකකටම දුම්මල පහරවල් වදිනව, බුදුරජාණන් වහන්සේගේ මේ ශූන්‍යතා දර්ශනයෙන්. ඉතින් ඔන්න ඔය විදියට මෙයින් පෙනෙනව සළායතනයම එක්තරා විධියක කෝඩු ගොඩක්. ලෝකය මැනීමට පාවිච්චි කරන කෝඩු ගොඩක්. එතකොට මේ අනුව අපට හිතාගන්න පුළුවනි. ලෝකය පිළිබඳව බුදුරජාණන් වහන්සේ ඉදිරිපත්කළ නිර්වචනයෙන් අපට පෙනීයනව ලෝකය පිළිබඳව සංඛත ස්වභාවය. **මේක සිතින් මවාගත්තු දෙයක්.** සිතින් මවාගත්ත කියලකියන්නේ ද්‍රව්‍ය පක්ෂය නැතිවෙනව නොවෙයි. නමුත් ලෝකය පිළිබඳ ප්‍රඥප්තිය -ලෝක ප්‍රඥප්තිය-ඇත්ත වශයෙන්ම මේ

කියාපු සළායතනය ආශ්‍රයෙන් ගොඩනභාගත්තු එකක්. **ලෝක ප්‍රඥප්තියේ සංඛත ස්වභාවයයි.** කලින් අවස්ථාවක අපි සඳහන් කළා, අව්‍යාකත වස්තු ගැන කථා කරන කොට, ඒ අව්‍යාකත ප්‍රශ්න දහය අතරින් මුල් ප්‍රශ්න හතරම ලෝකය පිළිබඳ ප්‍රශ්න බව. "සස්සතො ලොකො අසස්සතො ලොකො, අන්තවා ලොකො, අනන්තවා ලොකො" ලෝකය සදාකාලිකය, ලෝකය සදාකාලික නොවේය, ලෝකයෙහි කෙළවරක් ඇත. ලෝකයෙහි කෙළවරක් නැත. ඒ දෘෂ්ටිවාදීන් ලෝකය කියන ව්‍යවහාරය යෙදුවේ අන්න අර සංඛත ලෝකයටයි. අර කියාපු සළායතනයෙන් ගොඩනභාගත්තු ඒ ලෝක ප්‍රඥප්තියටයි. එතකොට මේ ලෝක ප්‍රඥප්තිය ඇත්ත වශයෙන්ම සංඛතයක් බව තේරුම් නොගැනීමට හේතුව මොකක්ද? පටිච්ච සමුප්පාද ධර්මය නොදැනීමයි. මේව සංස්කාර බව තේරුම් නොගැනීමයි. මෙතන තිබෙව මිථ්‍යාව - ඒ කියන්නේ ඒක අයෝනිසෝ මනසිකාරයෙන් ගොඩනභා ගත්තු ලෝකයක් බව තේරුම් නොගැනීම - අපි උපමා කළේ අර මැජික් කේතලයටයි. දැන් ඔය ප්‍රදර්ශන ආදියේ තියෙන මැජික් කේතලයෙන් යම්කිසි ටැංකියකට වතුර වැක්කෙරෙනව. සමහර කෙනෙක් මේකෙ රහස දන්නෙ නැති කෙනෙක් - අර මැජික් කේතලය හිස් වෙනකල් බලාගෙන ඉන්නව. තවත් කෙනෙක් අර ටැංකිය පිරෙනකල් බලාගෙන ඉන්නව.

මේ දෙන්නම දන්නෙ නැහැ අර මැජික් කේතලයෙන් වැක්කෙරෙන දිය ධාරාව ඇතුළෙන්-තුළින්- රහසින් නොපෙනීම නැවතත් ටැංකියෙන් වතුර ධාරාව අරකට ඇදිල යනබව. ඔන්න ඔය වගේ තත්ත්වයක්. ඝන සංඥාව අනුව ගිය කෙලෙස් සහිත ලෝකයා තුළ හැම දෙයක්ම අල්ලා ගැනීමේ ස්වභාවයක් තියෙනවා. තණ්හා උපාදාන ආදියට යටවුන සාමාන්‍ය පෘථග්ජන ලෝකයා තුළ, විදර්ශනා ප්‍රඥාව නැති ලෝකයා තුළ, තිබෙනව නිත්‍ය සංඥාවක්. අන්න ඒ නිසා තමයි ලෝකයේ ගෙවීයන පක්ෂය ගැන තැකීමක් නැතිව හටගැනීම් පක්ෂය - සමුදය - පමණක් සළකමින් මේක ඒකකයක් හැටියට ඝන සංඥාවෙන් අරගන්නෙ. එහෙම අරගත්තු ලෝකයක්, සදාකාලිකද නැද්ද කියන එකයි අර ප්‍රශ්න වලින් ප්‍රකාශ කෙරෙන්නේ. එහෙම නැතිනම් එබඳු ලෝකයක කෙළවරක් තියෙනවද නැද්ද කියන එකයි. මෙන්න මේ අයෝනිසෝ මනසිකාරයෙන් ගොඩනභාගත්තු අදහස් වලට මුල ඒකාන්ත අස්තිත්වයක් සහ ඒකාන්ත නාස්තිත්වයක් දැක්විය හැකියි කියන අදහසයි. ඒකාන්ත වශයෙන් යමක් ඇත, ඒකාන්ත වශයෙන් යමක් නැත කියල ඒ අන්තගාමී දෘෂ්ටි දෙක. ඒ අන්තගාමී දෘෂ්ටි දෙක ප්‍රතික්ෂේප කෙරෙන බුදුරජාණන් වහන්සේ සොයා ගත්තු ශ්‍රේෂ්ඨ පටිච්චසමුප්පාද ධර්මය අර සංයුක්ත නිකායේ නිදාන සංයුක්තයේ කච්චායනගොත්ත සූත්‍රයේ [5] සඳහන් වෙනව. අපි කලින් අවස්ථාවකත් ඒ

සූත්‍රය උපුටා දැක්වුවා වගේ මතකයි. එයින් අවශ්‍ය කොටස දැන් අපි කිව්වොත්, මෙන්න හොඳට පැහැදිලි වෙනව කාරණය. "ද්වයනිස්සිතො ඛ්වායං කච්චායන ලොකො යෙභුය්‍යෙන අත්ථිතඤ්චෙව නත්ථිතඤ්ච ලොකසමුදයං ඛො කච්චායන යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො යා ලොකෙ නත්ථිතා සා න හොති, ලොක නිරොධං ඛො කච්චායන යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො යා ලොකෙ අත්ථිතා සා න හොති" ඒ කියන්නේ: "කච්චායන මේ ලෝකය බොහෝ සෙයින්ම අන්තගාමී දෘෂ්ටි දෙකක් ඇසුරු කරගෙනයි සිටින්නේ. එනම් අස්තිත්වය හා නාස්තිත්වයයි, ඇතිබව හා නැතිබවයි. ඊළඟට ඔන්න ධර්ම න්‍යායය ඉදිරිපත් කරනව ලෝක සමුදය-ලෝකයේ හටගැනීම - යථාභූත වශයෙන්, ඇතිතතු වශයෙන්, දකින්නහුට 'ලෝකය ඒකාන්ත වශයෙන් නැත' කියන ඒ අදහස නැතිවෙල යනව. ඊළඟට ලෝක නිරෝධය යථාභූත වශයෙන් දකින පුද්ගලයාට 'ලෝකය ඇත' කියන හැඟීමත් නැතිවෙල යනව. ඔන්න දැන් අර මැජික් කේතලේ උපමාව අර්ථවත් කරගන්න පුළුවනි. අර දෙන්නම තේරුම් ගත්ත නම් මැජික් කේතලය හිස් වෙනව වගේම පිරෙනවයි කියල, ටැංකියත් පිරෙනව වගේම හිස්වෙනවයි කියල, අර විධියට බලාගෙන ඉන්නේ නැහැ. ඒ වෙනුවට බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළ පටිච්චසමුප්පාද ධර්මය වචනයත් පලාගෙන යනව, වචනය විනිවිද යනව කියල කියන්නේ ඒකයි, ඒ ප්‍රඥාව. **එය වචනයකින් දක්වන්න බැරි නිසා තමයි අවිජ්ජා පච්චයා සංඛාරා ආදී වශයෙන් ද්වාදසංග වශයෙන් ලෝකය ඇතිවෙන හැටි දැක්වුවෙ.**

දැන් සමහර අවස්ථාවල පටිච්ච සමුප්පාද සූත්‍රය අවසන් වෙන්නෙ "අයං දුක්ඛ සමුදයො, අයං දුක්ඛ නිරොධො" ආදී වශයෙන්. "එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති" කියල. තවත් සමහර අවස්ථාවල ලොක සමුදය කියලත් දක්වනව, **මේ දුක්ඛ සමුදයම තමයි ලෝක සමුදය.** එතකොට මේ සළායතනයන්ගෙන් ලෝකයක් ගොඩනැගෙනව. ඒකමයි දුක හැටියට පවතින්නෙ. මේ විධියට ගොඩනැගෙන ආකාරයයි පටිච්චසමුප්පාද ධර්මය කියන්නේ. ඒක ඉතාමත්ම සියුම් කාරණයක්. අන්න ඒ විධියේ අයෝනිසෝ මනසිකාරයෙන් ගොඩනහාගත්තු ලෝකයක් නිසා ඒක සංඛතයි. ඒක හිතින් මවා ගත්තු දෙයක් වගෙයි. මේ සංඛතයේ තිබෙන ස්වභාවයක් තමයි මේ චක්‍රාකාරය, චක්‍රයක් වගෙයි. ඇත්ත වශයෙන්ම දැන් මෙතන කාලය හා අවකාශය පිළිබඳ ප්‍රශ්න දෙකකුයි අර සස්සතො ලොකො ආදී දෘෂ්ටි වලින් හැඟෙන්නේ. සදාකාලිකද සදාකාලික නොවෙයිද කියන එක කාලය පිළිබඳවයි. ලෝකයේ කෙළවරක් ඇද්ද නැද්ද කියන එක අවකාශය, එහෙම නැත්තම් දේශය පිළිබඳවයි. කාලයත් අවකාශයත් - ඇත්ත වශයෙන්ම කාලයත් අවකාශයත් කියන දෙකේම තියෙන්නේ චක්‍රාකාර පැවැත්මක්. දැන් කාලය ගැන අපි කල්පනා කරල බලනව නම්

උදේ කාලයේ ඇත කෙළවර සවස් කාලයේ මෑත කෙළවරයි. සවස් කාලයේ ඇත කෙළවර උදේ කාලයේ මෑත කෙළවරයි. ඔය විධියටයි දවසේ චක්‍රය කරකැවෙන්නෙ. උදේ වරුව ඉවර වෙනකොට හවස් වරුව පටන් ගන්නව. සවස් වරුව ඉවර වෙනකොට උදේ වරුව පටන් ගන්නව. ඔයවිදියෙම කාල චක්‍රයක් තියෙනව එකම මොහොතක් තුළත්. ඔය විදියේ හටගැනීම් ගෙවීයෑම් වශයෙන් බැලුවත් එතනත් චක්‍රයක්. එක මොහොතක් තුළත් පවතිනව. ඊළඟට කල්පය තුළ තියෙන්නෙත් ඕකයි. ඒකටයි සංවට්ට විවට්ට කියල කල්පයේ දෙපැත්තක් තියෙන්නේ. සංවට්ට කියල කියන්නේ කල්පයක් හැකිලෙනව. යම්කිසි ලෝකධාතුවක් හැකිලෙනව. ඊළඟට විවට්ට. ඒක ආයෙත් දිග හැරෙනව. ඔන්න ඔහොම දෙයක් ලෝකයේ පැවැත්ම. ඉතින් ඒක නිසා මේකෙ කෙළවරක් තියෙනවද, අගක් මුලක් තියනවද කියල කියන්නට බැහැ. ප්‍රශ්නයම වැරදියි. **මේක චක්‍රයක කොනක් හොයන්න වගේ.** කාල්පනික වශයෙන් විසඳිය හැකි දෙයක් නොවෙයි මේක - චක්‍රාකාර පැවැත්මක් තිබෙන නිසා හටගැනීම් ගෙවීයෑම් දෙක එක මොහොතක් පාසාමත් තියෙනව. ක්‍ෂණභංගුරත්වය, මොහොතක් පාසා බිඳීයන ස්වභාවය, නොතැකීම නිසයි අර විධියට අයෝනිසෝ මනසිකාරයෙන් - සාමාන්‍ය ඇසට පෙනෙන ලෝකය විනාශ වනනිසා ඒ අනුව ලෝකය සම්පූර්ණයෙන්ම ඉවර උනා කියල හිතාගන්නව කෙනෙක්. නමුත් මේ එක ලෝක ධාතුවක් ඉවර උනාම වෙන තැනෙක පැනනඟිනව. ඔන්න ඔහොම දෙයක් විශ්වය පිළිබඳව මේ ලෝකයා ඇතිකර ගත්තු ප්‍රශ්නවල, දෘෂ්ටිවල, තියෙන්නෙ. මේ විදියෙ දෘෂ්ටි මතවාද අරගෙන තර්ක කළොත් ඒ තර්ක පවා චක්‍රාකාර තර්ක බවට පරිවර්තනය වන හැටි අංගුත්තර නිකායේ නවක නිපාතයෙ එන ලෝකායතික බ්‍රාහ්මණ සූත්‍රයෙන් [6] හොඳට පැහැදිලි වෙනව.

මේ සූත්‍රයේ සඳහන් වෙන්නෙ මෙහෙමයි, ලෝකායතික බ්‍රාහ්මණයින් දෙදෙනෙක් - ලෝකායතික බ්‍රාහ්මණයින් කියල ඒ කාලෙ ව්‍යවහාර කළේ, ලෝකායත ශාස්ත්‍රය කියල දෙයක් තිබුනා. ලෝකයේ දිග පළල ආදිය පිළිබඳව දැන් මේ කාලයේ බොහෝවිට විද්‍යාඥයින් කරන වැඩේමයි නොයෙක් ආකාරයෙන් ඒ බ්‍රාහ්මණයින් පත පොතින් තර්ක ආදියෙන් කළේ. අන්න ඒ විධියේ ඒ ශාස්ත්‍රය ඉගෙන ගන්න දෙන්නෙක් වෙන්න ඕන. ලෝකායතික බ්‍රාහ්මණයින් දෙන්නෙක් එක දවසක් දා බුදුරජාණන් වහන්සේ දකින්ට පැමිණිල මේ විධියෙ ප්‍රශ්නයක් අසනව. " භවත් ගෞතමය මේ පූරණකස්සප කියා හිටිනව තමා සර්වඥය, හැම දෙයක්ම දකිනවය, හැම දෙයක් පිළිබඳවම ඥාන දර්ශනය නිතරම එළඹ සිටිනවය, ඇවිදින විටත්, සිටින විටත්, නිදන විටත්, නිදිවරන විටත්, හැම අවස්ථාවකම මට ඥාන දර්ශනය තියෙනව කියල කියා හිටිනව. එහෙම

කියන පූරණ කස්සප මෙන්න මෙහෙම ප්‍රකාශයක් කරනව "අහං අනන්තේන ඤාණේන අනන්තං ලොකං ජානං පස්සං විහරාමි" මම අනන්ත වූ ඥානයකින් අනන්ත වූ ලෝකයක් දනිමින් දකිමින් වාසය කරනව" කියල. එහෙම ප්‍රකාශ කරල කියනව, නිගණ්ඨනාථ පුත්ත මීට විරුද්ධ අදහසක් ප්‍රකාශ කරන්නේ, කුමක්ද? "අහං අන්තවන්තේන ඤාණේන අන්තවන්තං ලොකං ජානං පස්සං විහරාමි" මම කෙළවරක් සහිත ඥානයකින් කෙළවරක් සහිත ලෝකයක් දනිමින් දකිමින් වාසය කරනව, කියල.

ඊළඟට මේ බ්‍රාහ්මණයින් අහනව බුදුරජාණන් වහන්සේගෙන්, මේ කියන මේ ඥානවාදී ආචාර්යවරුන් දෙදෙනාගෙන්, එකිනෙකාට විරුද්ධ මත ප්‍රකාශ කරන දෙදෙනාගෙන් කවුද ඇත්ත කිවුවෙ, කවුද බොරු කිවුවෙ, කියල. බුදුරජාණන් වහන්සේ "අලං බ්‍රාහ්මණා තිට්ඨතේතං" ඇති බ්‍රාහ්මණයිනි ඔය ප්‍රශ්නය පැත්තකින් තිබියේවා "ධම්මං වො දෙසිස්සාමි" මම නුඹලාට ධර්මය දේශනා කරනව කියල බුදුරජාණන් වහන්සේ මේ ප්‍රශ්නය පැත්තකින් තැබීම අර අව්‍යාකත බව අඟවන වචනයක්. අව්‍යාකත ප්‍රශ්නම හඳුන්වන වචනයක් තමයි-ඨපිත,ඨපනීය කියන එක-පැත්තකින් තැබිය යුතු ප්‍රශ්නයක්. ඒක නිසයි විවරණයක් නොකළේ. මක්නිසාද පැත්තකින් තැබුවේ. අපට හිතාගන්න පුළුවන් එතන කාරණේ, - කියල නැතත්. පූරණ කස්සප කියන්නේ මම අනන්ත වූ ඥානයකින් අනන්ත වූ ලෝකයක් දකිනව කියලනේ. එතකොට ඊට විරුද්ධ වාදියෙකුට ඉදිරිපත් වෙලා කියන්න පුළුවනි ඔබට මේ අනන්ත ලෝකයක් පෙනෙන්නේ ඔබේ ඥානය අනන්ත නිසයි. අනන්ත කියල කියන්නේ සම්පූර්ණ නැහැ. සම්පූර්ණ නම් කෙළවරක් තියෙන්න එපායැ. එතකොට අනන්ත කියන වචනය අසම්පූර්ණ අර්ථයෙන් අරගෙන අර පළමුවෙන් ඉදිරිපත් කළ මතය කඩන්න පුළුවනි. ඔබ අනන්ත ඥානයෙන් අනන්ත වූ ලෝකයක් දකින්නේ ඔබේ ඥානය අසම්පූර්ණ නිසා. ඒ වගේම අර නිගණ්ඨනාථ පුත්ත කියන්නේ මම "අන්තවන්තේන" - අන්තයක් සහිත - නුවණකින් අන්තයක් සහිත ලෝකයක් දකිනව කියලනෙ. ඒ තැනැත්තාට විරුද්ධව කියන්න පුළුවන් අර පූරණ කස්සපවාදීන්ට, ඔබ අන්තයක් සහිත ඥානයකින් ලෝකයක් දකින්නේ ඔබේ ඥානය සීමිත නිසයි කියල. ඔබේ ඥානයේ කෙළවරක් තියෙනව, ඒක නිසයි අන්ත සහිත ලෝකයක් පෙනෙන්නේ'.

එතකොට මෙතනත් තියෙන්නේ චක්‍රයක්. අන්ත අනන්ත කියන වචනවල අර්ථ දෙකක්ම තියෙනව. ඔන්න ඔය විදියේ තත්ත්වයක් නිසා වෙන්න ඕන බුදුරජාණන් වහන්සේ ඒ ප්‍රශ්න ප්‍රතික්ෂේප කළේ. ඊළඟට මම ධර්මය දේශනා කරනව කියල අර බ්‍රාහ්මණයින්ට ප්‍රකාශ කරනව උපමාවක් වශයෙන් වගේ - පුරුෂයින් හතරදෙනෙක් හතර දිසාවක ඉන්නව. ඒ හතර දෙනාටම තියෙනව ඉතාමත්ම වේගයෙන් යන්න ශක්තියක්.

කොයිතරම් වේගයක්ද කිවහොත් ඊතල වේගයක් වැනි ජවයක් තියෙනව. ඒ වගේම ඒ හතර දෙනාගේ පියවර-පිය මාරුකිරීම- ඉතාමත්ම පුළුල්. පෙරදිග මහ මුහුදෙ එක පයක්. අවරගිර මහමුහුදෙ අනික් පය. ඔන්න ඔය තරම් පුළුල් පිය මාරු කිරීමක් තියෙනව. එතකොට වේගය ඊතල වේගයයි. මේ තරම් පුළුල් පිය මාරු කිරීමක් ඇති, ඒ පුද්ගලයින් හතර දෙනා තම තමන්ට කියා ගන්නව "මම ගමන් කිරීමෙන් ලෝකයේ කෙළවරට පැමිණෙනව" කියල. එහෙම අධිෂ්ඨාන කරගෙන ඒ හතර දෙනාම ගමන ආරම්භ කරනව ආහාර පාන ගැනීම්, ශරීර කෘත්‍ය කිරීම්, නිදාගැනීම්, වෙහෙස මහන්සි ඇරීම්, ආදියට යෙදෙන කාලය හැර අනික් මුළු කාලයම අර විධියට වේගයෙන් ගමන් කරමින්, අවුරුදු 100ක් ගමන් කළත් ලෝකයේ කෙළවරට නොපැමිණ මරණයට පත්වෙනව කියල බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා. "තං කිස්ස හෙතු" මක් නිසාද? ඊළඟට බුදුරජාණන් වහන්සේ හේතුව දෙනව "නාහං බ්‍රාහමණ එවරූපාය සන්ධාවනිකාය ලොකස්ස අන්තං ඤාතය්‍ය දට්ඨය්‍යං පත්තය්‍යන්ති වදාමි. න ච පනාහං අප්පත්වා ලොකස්ස අන්තං දුක්ඛස්ස අන්තකිරියං වදාමි" ආදී වශයෙන් මක් නිසාද බ්‍රාහ්මණයිනි, මෙබඳු වූ මේ දිවීමකින් ලෝකයේ කෙළවරක් දැකිය හැකියැයි දැනගත හැකියැයි ඊට පැමිණිය හැකියැයි මම නොකියමි. ඒ වගේම ලෝකයේ කෙළවරකට නොපැමිණ දුක් කෙළවරකර ගැනීමක් ද ඇතැයි මම නොකියමි. එහෙම වදාරල ඊළඟට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව "පඤ්චිමෙ බ්‍රාහමණා කාමගුණා අරියස්ස විනයෙ ලොකොති වුච්චති" එතෙන්දී බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ මේ පඤ්චකාම ගුණය, පංචකාමයන්, ලෝකය හැටියට, මේ ආර්‍ය ව්‍යවහාරය අනුව. ඒක අර සළායතන ලෝකය යැයි කියපු එකත් එක්ක ගැටීමක් නැහැ. සළායතනය ආශ්‍රයෙන් තමයි මේ පංචකාම සම්පත්තිය කෙනෙක් විඳින්නේ. නමුත් මෙතන්දි දේශනා විලාස වශයෙන් බුදුරජාණන් වහන්සේ ආර්‍ය ව්‍යවහාරයට අනුව ලෝකය හැටියට හැඳින්වූයේ පංචකාම ගුණයමයි. එතකොට මේ පංචකාම ගුණ ලෝකය ඉක්මවන ක්‍රමයක් ඊළඟට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව ධ්‍යාන මාර්ගයෙන්. ප්‍රථම ධ්‍යානයට සමවැදුන නම් යම්කිසි කෙනෙක් අර පංචකාම ගුණ ලෝකයෙන් ඈත්වුන. නමුත් ඒ පිළිබඳව ප්‍රකාශ වෙනව - 'අයම්පි අනිස්සටො ලොකම්හා ති වදාමි පරියාපන්නො ලොකස්ස' මේ තැනැත්තත් තාම ලෝකයෙන් හරියටම නික්මුනේ නැහැ, ලෝකයටම අයිතියි කියල. ඔය විදියට ප්‍රථම ධ්‍යාන, ද්විතීය ධ්‍යාන ආදී වශයෙන් ගිහිල්ල අවසානයේ - 'පුන ච පරං බ්‍රාහමණ භික්ඛු සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිත නිරොධං උපසම්පජ්ජ විහරති පඤ්ඤායචස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති. අයං වුච්චති බ්‍රාහමණ ලොකස්ස අන්තං ආගම්ම ලොකස්ස අන්තෙ විහරති. තිණ්ණා ලොකෙ විසත්තිකං' කියන ඒ

විවරණ මාර්ගයේ අවසාන පියවර හැටියට බුදුරජාණන් වහන්සේ දක්වන්නෙ යම්කිසි භික්ෂුවක් හැම ආකාරයකින්ම නෙවසංඥානාසංඥායතනය කියන ඒ සමාධි තත්ත්වය ඉක්මවල සංඥා වේදයිත නිරෝධයට පැමිණ වාසය කරනව. ප්‍රඥාවෙන් දැකීමෙන් ඒ භික්ෂුවගේ ආශ්‍රවයන් එහෙම පිටින්ම ක්ෂය වෙනව. අන්න එබඳු භික්ෂුවක් පිළිබඳව ඊළඟට ප්‍රකාශ වෙනව, 'ලෝකයේ කෙළවරට පැමිණ ලෝකයේ කෙළවර වාසය කරනව. - විසත්තිකා නම් ඇලෙන සුළු තණ්හාවෙන් එතෙරවී' කියල. මේ සූත්‍රය අනුව ඇතැම් කෙනෙක් හිතන්න පුළුවනි ඇත්ත වශයෙන්ම සංඥා වේදයිත නිරෝධයයි මේ නිවන කියල කියන්නෙ කියල. එහෙමත් බොහොම කෙනෙක් තෝරනව. නමුත් මෙතන වැදගත් කොටස තියෙන්නේ අර 'පඤ්ඤායචස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති' කියන එකේ. සංඥාවේදයිත නිරෝධයේදී අර සියලුම සංස්කාරයන් සංසිඳිල හරියට නිදාගත්ත වගේ ඔහේ ඉන්නව. ඒ සඤ්ඤා වේදයිත නිරෝධ සමාපත්තියෙන් නැගිට්ටට පස්සෙයි ඇත්ත වශයෙන්ම අර කියාපු විධියට ප්‍රඥාවෙන් දැකල ආශ්‍රවයන් ක්ෂය වෙන්නේ.ඒ බව කෙනෙකුට සැක තියෙනවනම් බලාගන්න පුළුවනි චූලවෙදල්ල සූත්‍රයෙන්.

චූල වේදල්ල සූත්‍රයේ ධම්මදින්නා මහ තෙරණින් වහන්සේ අර විසාඛ උපාසක මහත්මයාට ප්‍රකාශ කරනව. 'සඤ්ඤා වෙදයිත නිරොධ සමාපත්තියා ඛො ආවුසො විසාඛ වුට්ඨිතං භික්ඛුං තයො ඵස්සා ඵුසන්ති. සුඤ්ඤතො ඵස්සො, අනිමිත්තො ඵස්සො, අප්පණිහිතො ඵස්සො'. සංඥා වේදයිත නිරෝධ සමාපත්තියෙන් නැගිට්ට භික්ෂුවට ස්පර්ශ තුනක් ස්පර්ශ කරනව. මොනවද ස්පර්ශ තුන. සුඤ්ඤත, අනිමිත්ත, අප්පණිහිත. අටුවාව පවා එතනදී තෝරනව. 'සුඤ්ඤතා නාම ඵල සමාපත්ති' එතකොට ඵල සමවතටයි අවදි වෙන්නේ. ඊළඟට ඒ වගේම සඳහන් වෙනව 'සඤ්ඤා වේදයිත නිරොධ සමාපත්තියා වුට්ඨිතස්ස ඛො ආවුසො විසාඛ භික්ඛුනො විවෙකනින්නං චිත්තං හොති විවෙකපොනං විවෙකපබ්භාරං' ඒ වගේම සඤ්ඤාවේදයිත නිරෝධ සමාපත්තියෙන් නැගිට්ටාවූ භික්ෂුවගේ සිත විවේකයට නැඹුරුයි, විවේකයට බරවයි තිබෙන්නේ, විවේකයට ඇලවෙලයි තිබෙන්නේ. විවේකය කියන එක තෝරන්නෙ, 'විවෙකො නාම නිබ්බානං' අටුවාවෙම කියනව විවේකය කියන්නේ නිවන. එතකොට මෙයින් තේරෙනව අපට සංඥා වේදයිත නිරෝධ සමාපත්තියෙන් නැගිට්ටට පස්සෙයි, අර ඵල සමවතේදී - අර කලින් අවස්ථාවකදී නිදසුන් දැක් වූ - ඒ ඵල සමාපත්ති අවස්ථාවේදීයි නිවන ප්‍රත්‍යක්ෂ කරන්නෙ, ඒ අවස්ථාවේදීයි මේ ලෝකයෙ කෙළවර දකින්නෙ හරියටම. ඔන්න ඔය විදියට එතකොට මෙයින් අපට පේනව බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළ ලෝක ප්‍රඥප්තිය, ලෝකයා අතර තිබූ ලෝක ප්‍රඥප්තිය පිළිබඳ ප්‍රශ්න ඉවත් කරල, ඒකට

කොහෙත්ම අයිති නැති කාරණයක් ප්‍රකාශ කිරීමක් නොවෙයි. යම්කිසි හේතුවක් පිට - අයෝනිසෝමනසිකාරයෙන් ජනිත සංකල්පයක් නිසා ඒක ඉවත් කරල යෝනිසෝමනසිකාරය අනුව ලෝකය හටගන්න නියම මිනුම් දඬුව, කෝදුවම පෙන්වලයි බුදුරජාණන් වහන්සේ මේ ප්‍රශ්නය විසඳුවේ.

මේ ලෝකාන්තයත් දුක්ඛාන්තයත්, ලෝකයෙහි කෙළවරත්, දුකෙහි කෙළවරත් පිළිබඳව සඳහන් වන සූත්‍ර අතරින් ඉතාම වැදගත් සූත්‍රයක් තමයි අංගුත්තරනිකායේ චතුක්ක නිපාතයෙත්, සංයුක්ත නිකායේ සගාථක සංයුක්තයෙත් සඳහන් වන රෝහිතස්ස සූත්‍රය.[7]

එක දවසක්දා බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වසන අවස්ථාවක රෝහිතස්ස නමැති දේව පුත්‍රය රාත්‍රියේ ඇවිල්ල බුදුරජාණන් වහන්සේගෙන් මෙන්න මෙහෙම ප්‍රශ්නයක් අහනවා: 'යත්ථ නු ඛො භන්තෙ න ජායති න ජීයති න මීයති න චවති න උපපජ්ජති සක්කා නු ඛො භන්තෙ ගමනෙන ලොකස්ස අන්තං ඤාතුං වා දට්ඨුං වා පාපුණිතුං වා' ස්වාමීනි, යම් තැනෙක කෙනෙක් නූපදියි ද නොදිරයි ද නොමියෙයි ද චුත නොවෙයි ද නැවත නූපදනේද ඒ ලෝකාන්තයට ගමන් කිරීමෙන් ඒ ලෝක අන්තය දැනගත හැකිවෙයිද, දැකිය හැකිවෙයිද, ඊට පැමිණිය හැකිවෙයිද? බුදුරජාණන් වහන්සේ ඊට දෙන පිළිතුර 'යත්ථ ඛො ආවුසො න ජායති න ජීයති න මීයති න චවති න උපපජ්ජති නාහං තං ගමනෙන ලොකස්ස අන්තං ඤාතය්‍යං දට්ඨය්‍යං පත්තය්‍යන්ති ති වදාමි' ඇවැත්නි යම් තැනක නූපදනේද නොදිරයිද, නොමියේද, චුත නොවෙයිද, නැවත නූපදනේද, එබඳු ඒ ලෝකාන්තයට ගමන් කිරීමෙන් පැමිණිය හැකියැයි මම නොකියමි.

එපමණක් කියල බුදුරජාණන් වහන්සේ නැවැත්වුවහම අර රෝහිතස්ස දේව පුත්‍රය බොහොම ප්‍රශංසා කරනව 'අච්ඡරියං භන්තෙ අබ්භුතං භන්තෙ' මේක බොහෝම ආශ්චර්යයක් අද්භූත කාරණයක් තථාගතයන් වහන්සේ දෙසූ මේ සුභාෂිතය - 'යාව සුභාසිතමිදං භගවතා' මේක බොහෝම හොඳ කියමනක් කියල-මක් නිසාද එහෙම ප්‍රශංසා කරනේනේ, තමන් ප්‍රත්‍යක්ෂයෙන්ම මේ කාරණය ඇත්ත බව තේරුම් අරගෙන තිබෙන නිසයි. ඒක ප්‍රකාශ කරනව, ඊළඟට ඒ රෝහිතස්ස දේව පුත්‍රය, 'මම අතීතයේ රෝහිතස්ස නමැති ඍෂිවරයෙක්- භොජ පුත්‍ර වූ - භොජ නමැති යම්කිසි කෙනෙකුගේ පුත්‍රයෙක් වෙන්න ඇති. මම රෝහිතස්ස නමැති ඍෂිවරයෙක්ව සිටියා. 'ඉද්ධිමා වෙහාසංගමො' බොහෝම ඍද්ධි සහිත අහසින් යාමේ ශක්තිය ඇති මගේ වේගය-කලින් අපි අර ලෝකායතික සූත්‍රයේදී සඳහන් කළ වේගයයි. ඒ කියන්නේ ඊතල වේගයයි. කෙටියෙන් කියනව නම් ඊතලයක ගමන් වේගය තියනව. ඒ වගේම මගේ පියමාරු කිරීම් පෙරදිග මුහුදත් අපරදිග මුහුදත් අතර තරම්-එතරම් පුළුල් පියමාරු කිරීමක්. ඒ

ඔක්කොම සෘද්ධි බලයෙන්. අන්න එබඳු ශක්තියක් ඇති මට නිකමට අදහසක් ආවා 'අහං ගමනෙන ලොකස්ස අන්තං පාපුණිස්සාමි' මම ගමන් කිරීමෙන් ලෝකයේ කෙළවරට පැමිණෙනව කියල. එහෙම අදහසක් ආපු නිසා මම ඒ විදියටම ගමන් කරල, අවුරුදු 100 ක්ම ගමන් කරල ලෝකයේ කෙළවරට නොපැමිණ අතරමගදීම කාලක්‍රියා කළා. අන්න ඒ නිසා භාග්‍යවතුන් වහන්සේ දේශනා කළ කාරණය සුභාෂිත වග මම පිළිගන්නව කියල ප්‍රකාශ කළා. එතකොට බුදුරජාණන් වහන්සේ තවදුරටත් ඒක තහවුරු කිරීම් වශයෙන් ඉතා වැදගත් සූත්‍ර කොටසක් ප්‍රකාශ කරනව, නැවතත් අරකම අවධාරණය කරමින්. 'න බො පනාහං ආවුසො ගමනෙන ලොකස්ස අන්තං ඤාතයාං දට්ඨයාං පත්තයාන්ති වදාමි න චාහං ආවුසො අප්පත්වා ලොකස්ස අන්තං දුක්ඛස්ස අන්තකිරියං වදාමි. අපිචාහං ආවුසො ඉමස්මිං යෙව බ්‍යාමමත්තෙ කලෙබරෙ සසඤ්ඤිම්හි සමනකෙ ලොකං ච පඤ්ඤාපෙමි ලොක සමුදයං ච ලොක නිරොධංච ලොක නිරොධගාමිනිංච පටිපදං' 'ඇවැත්නි මම ගමන් කිරීමෙන් ලෝකයේ කෙළවරක් දැකිය හැකියැයි නොකියමි. එසේම ලෝකයේ කෙළවරට නොපැමිණ දුකෙහි කෙළවරක් ඇතැයිද මම ප්‍රකාශ නොකරමි. නැවත ද ඇවැත්නි 'ඉමස්මිං යෙව බ්‍යාම මත්තෙ කලෙබරෙ සසඤ්ඤිම්හි සමනකෙ.' සංඥාවත් මනසත් සහිත බඹයක් පමණ වන මේ ශරීර කූඩුවෙහිම - 'කලෙබරෙ' කියල යොදල තිබෙනව. මෘත ශරීරය නොවෙයි එතන තියෙන්නේ - මේ ශරීර කූඩුවෙහිම ලෝකයත් පෙන්වාලමි. ලෝකයේ හටගැනීමත් පෙන්වාලමි. ලෝක නිරෝධය නම් වූ නිවනත් පෙන්වාලමි. ලෝක නිරෝධගාමිනී පටිපදාවත් පෙන්වාලමි.

ලෝකයේ ඇතිතාක් විවිධ ආගම් දෘෂ්ටිවාද හැම එකක්ම පසුබස්වන අභීත සිංහනාදයක් වැනි මේ ශ්‍රේෂ්ඨ දේශනාවේ අගය තේරුම් නොගත් ඇතැම් කෙනෙක්, මෙකල ප්‍රකාශ කරනව ඇහෙනව, මේ සූත්‍රයේ කියන හැටියට නිවන මෙතැන නැත. ලෝක නිරෝධයක් මෙතන නැත. අනික් කාරණා තුන විතරයි මේ බඹයක් පමණ ශරීරයේ තිබෙන්නේ කියල. ඒ විධියේ දුර්මතයක් ප්‍රකාශ කිරීමට හේතුව, නිවන පිළිබඳව කාලාන්තරයක් තිස්සේ ඇතිවුන නොයෙක් වැල්වටාරම් මතිමතාන්තරවල තදින් එල්බ ගැනීම නිසයි. නිවන එහෙම පිටින්ම ගූඪ, ගුප්ත දෙයක් කළා. මේ ශරීරයට, මේ පුද්ගලයගේ ජීවිතයට කෙළින්ම අදාල නොවන හැටියට, රහතන් වහන්සේලා මරණයට පත්වුනාට පස්සේ ගිහිල්ල එකතුවෙන යම්කිසි අද්භූත ගූඪ තැනක් හැටියටයි නිවන පිළිබඳව පසුකාලයකදී ඇතිවුනු මතිමතාන්තර වලින් තීරණය කෙරෙන්නෙ. අන්න ඒව දැඩිව ගත්තු නිසා වෙන්න ඇති සමහර විට මේ බුද්ධ භාෂිතයේ සංඥාවත් මනසත් සහිත මේ බඹයක් පමණ වූ සිරුරෙහි ලෝක නිරෝධයක් තියෙනව

කියන එක අර විදියට පිළිනොගන්නේ. එපමණක් නොවෙයි අටුවාව පවා -අටුවාව නම් ඒ තරම් දුරට ගිහිල්ල නැහැ. - අටුවාචාරීන් වහන්සේ ප්‍රකාශ කරනව 'තණකොළ ලී කැබලි ආදියෙහි නොවෙයි මේ චතුරාර්‍ය සත්‍යය තියෙන්නේ, මේ සතර මහා භූතයන්ගෙන් හටගත් ශරීරය තුළය කියල. ඒක හරි, අටුවාව එපමණක් ප්‍රකාශ කරල නතර කරනව. ඉතින් මේක ගැනත් ඇතැම් උගතෙක් ප්‍රකාශ කරනව ඉතාමත් වටිනා දීර්ඝ විවරණයක් කළයුතු වටිනා අවස්ථාවක් බුද්ධඝෝෂ ස්වාමීන් වහන්සේ පැහැර හැරියැයි කියල. ඒ කියමනත් සහේතුකයි. නමුත් අටුවාචාරීන් මේ තරම් වැදගත් සූත්‍රයක් ගැන එතරම්ම සැලකිල්ලක් නොදැක්වූවේ, වැඩිබර තියෙන්නේ අර විධියට පසුකාලයක ඇතිවුන මතිමතාන්තර වලට නිසයි.

එතකොට මේ සූත්‍රය ගැන අමුතු දීඝ විස්තර නැතත් මෙතෙක් නිබ්බාන පටිසංයුක්ත සූත්‍ර ගැන ප්‍රකාශ කළ කරුණුම මේ සූත්‍රයට හොඳ විවරණ. මක් නිසාද? දැන් මෙතන කියවෙනව 'සසඤ්ඤිම්හි සමනෙක,' කියල වචන දෙකක්. බඹයක් පමණ වූ මේ කලේබරය සංඥාව සහ මනස සහිතයි. ඒක අර්ථවත්වයි බුදුරජාණන් වහන්සේ එතන යොදල තියෙන්නෙ. අර කලින් සූත්‍රයේ ලෝකය හඳුන්වන කොට ආනන්ද ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කළා 'යෙන ඛො ආවුසො ලොකස්මිං ලොකසඤ්ඤී හොති ලොකමානී අයං වුච්චති අරියස්ස විනයෙ ලොකො' කියල ලෝක සංඥාවක්, ලෝකය කියල මානයක් මැනීමක්-මනසින් තමයි මේ මැනීම කෙරෙන්නේ - එතකොට අර සසඤ්ඤිම්හි සමනකෙ, සංඥාවත් මනසත් සහිත කියල කිව්වෙ අන්න අර ලෝකප්‍රඥප්තියට එකඟවෙන ආකාරයට, එපමණක් නොවෙයි අපි කලින් අවස්ථාවක විශේෂයෙන්ම ඵලසමවත ගැන-අඤ්ඤා ඵල සමාධි,අඤ්ඤා විමොක්ඛ ආදී නම් වලින් හැඳින්වෙන ඒ ඵල සමාපත්තිය -ගැන ප්‍රකාශ කෙරෙන සූත්‍ර දේශනා උපුටාදැක්වූ අවස්ථාවල් වල-මෙන්න මේ විධියට දැක්වුව. 'සියා ඛො ආවුසො තථාරූපො සමාධි පටිලාභො යථා නෙව පඨවියා පඨවිසඤ්ඤී අස්ස න වායස්මිං වායොසඤ්ඤී අස්ස....' ඒ විධියට දිගට ගිහිල්ල අවසානයේ දී ප්‍රකාශ වෙනව 'සඤ්ඤී ච පන අස්ස' ඒ කියන අර්හත්ඵල සමාධිය කොයිතරම් ආශ්චර්‍යවත් ද කියතොත් එබඳු ඒ සමාධි තත්ත්වයේ දී යම්කිසි කෙනෙක් පඨවි,ආපො,තේජො,වායො ඒ කිසිවක් පිළිබඳවත් මේ ලෝකය, පරලෝකය ආදී මේ කිසිවක් පිළිබඳවත්, දිට්ඨ,සුත,මුත,විඤ්ඤාත ආදී කිසිවක් පිළිබඳවත් සංඥාවක් නැහැ. නමුත් සූත්‍රය අගටම කියැවෙනව 'සඤ්ඤී ච පන අස්ස, නමුත් සංඥාවකුත් තියෙනව. ඊළඟට 'කිංසඤ්ඤී' කියල ඇහුවාම සැරියුත් ස්වාමීන් වහන්සේ එක්තරා අවස්ථාවක ප්‍රකාශ කළා 'භව නිරොධො නිබ්බානං භව නිරොධො නිබ්බානං' කියන සඤ්ඤාවයි ඒ අවස්ථාවෙ තියෙන්නෙ කියලා. නිබ්බාන

සංඥාවයි. ඒ වගේම අපි උපුටා දැක්වූ තවත් සමහර සූත්‍රයක සඳහන් වෙනව 'සියා නු ඛො ආනන්ද තථාරූපො සමාධි පටිලාභො යත්‍ර න චක්ඛුං මනසිකරෙය්‍ය න සොතං මනසිකරෙය්‍ය න ඝානං මනසිකරෙය්‍ය' ආදී වශයෙන් ගිහිල්ල අවසාන වෙන්නෙ 'මනසි ච පන කරෙය්‍ය' ඒ සමාධි තත්ත්වයේදී ඇස මෙනෙහි කරන්නෙත් නැහැ. කණ මෙනෙහි කරන්නෙත් නැහැ, නැහැය මෙනෙහි කරන්නෙත් නැහැ - ඔය විධියට කිසිවක් මෙනෙහි කරන්නෙත් නැහැ. දිට්ඨ, සුත, මුත ආදී කිසිවක්, ඇසූ දුටු දෙයක් මෙනෙහි කරන්නෙත් නැහැ. නමුත් මෙනෙහි කිරීමකුත් කරනව. 'කුමක්ද මෙනෙහි කිරීම' කියල ඇහුව ප්‍රශ්නයට පිළිතුරු දෙන්නේ 'එතං සන්තං එතං පණීතං යදිදං සබ්බ සංඛාර සමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං.' නිබ්බානය පිළිබඳ මෙනෙහි කිරීමයි එතන. එතකොට 'සංඥාව' 'මෙනෙහි කිරීම' කියන වචනත් යෙදෙනව අර ඵල සමාපත්ති අවස්ථාවේදී. එතකොට නිවන කියන එක හරියට අර වේලිච්ච කොටයක් වගේ ඉන්න අවස්ථාවක් නොවෙයි. මෙන්න මේ තත්ත්වය දැකීමක්. නිරෝධයෙන් ලෝකයෙන් එතෙර වීමක්. ඒනිසා තමයි අර සසඤ්ඤිම්හි සමනකෙ කියන වචන යොදල තියෙන්නේ. සංඥාවත් මනසත් සහිත මේ ශරීරය. ඒ වගේම තවත් සූත්‍රවල අපට හමුවනා බුදුරජාණන් වහන්සේ සමහර තැන්වල සළායතන නිරෝධයම නිබ්බානය හැටියට හඳුන්වනව. 'තස්මාතිහ භික්ඛවෙ සෙ ආයතනෙ වෙදිතබ්බෙ යත්‍ර චක්ඛුංච නිරුජ්ඣති රූප සඤ්ඤාච විරජ්ජති සොතං ච නිරුජ්ඣති සද්ද සඤ්ඤා ච විරජ්ජති......... සෙ ආයතනෙ වෙදිතබ්බෙ' ඒ විදියෙ සූත්‍රයකුත් අපි කලින් අවස්ථාවක දැක්වුව ලෝක කාම ගුණ සූත්‍රයක්[8] හැටියට. එතැන කියැවෙනව ඒ ආයතනය තේරුම් ගතයුතුයි. කෙබඳු ආයතනයක්ද, එහි ඇස නිරුද්ධ වෙනව. රූප සඤ්ඤා මැකිල යනව, කණ නිරුද්ධ වෙනව, සද්ද සඤ්ඤා මැකිල යනව. ඔන්න ඔය විධියට. ආනන්ද ස්වාමීන් වහන්සේ ඒකට දෙන විවරණය 'සළායතන නිරොධං ආවුසො භගවතා සන්ධාය භාසිතං' සළායතන නිරෝධය සඳහාය භාග්‍යවතුන් වහන්සේ මේක ප්‍රකාශ කළේ. සළායතන නිරෝධය කියල කියන්නේ නිවනයි. එතකොට ඔය හැම එකකින්ම අපට පෙනෙනව මේ සළායතනය නිසයි මේ ලෝකයක් ගොඩ නැඟුනේ. අර කියාපු මිනුම් දඬු භය නිසයි ලෝකයක් ගොඩ නැඟුනේ. **එතකොට ඒ සළායතනයෙන් ගොඩ නැගුනු ලෝකය සළායතනය නැති වීමෙන්ම නිරුද්ධ විය යුතුයි.** ඒක තමයි 'සළායතන නිරොධො නිබ්බානං' කියල කියන්නෙ. අර සියලුම මිනුම් දඬු, කෝදු, ඔක්කොම අවලංගු වන අවස්ථාවයි සළායතන නිරෝධ තත්ත්වය.

මෙන්න මේකට - මේ සළායතන නිරෝධයට - හේතුව මොකක්ද? මේ සළායතන නිරෝධය කියල කියන්නෙ ඇත්ත වශයෙන්ම ස්පර්ශායතන

නිරෝධයයි. ඎපශ්‍රීයතන කියල කියනකොට මෙතන තියනව දෙකක්. නිතරම දෙකක් පිළිබඳව. ඇසත් - 'රූපත් ඔය ආදී වශයෙන් දෙකක් පිළිබඳ ස්පර්ශය. ඔන්න ඔය විධියෙ දෙකක් පිළිබඳ ස්පර්ශය නිසා තමයි කෙනෙකුට ඒව පිළිබඳව නිත්‍ය සංඥාව ඇතිවෙන්නෙ. ඒ ස්පර්ශය මුල් කරගෙන සංඥාවල් ඇතිවෙනව. වේදනා සංඥා ආදී වශයෙන් ලෝකයක් මැවිල පෙනෙනව. ඇසට පෙනෙන ලෝකයක් තියෙනව. මනුෂ්‍යයාගේ නම් එහෙමයි. තිරිසනුන්ගේ වෙනමයි. තිරිසනුන්ට පෙනෙන සමහර දේවල් මනුෂ්‍යයින්ට පෙනෙන්නෙ නැහැ. ඒ චක්ෂුරායතනයේ ස්වභාවය නිසා. කණ පිළිබඳවත් එහෙමයි. ඒ කියාපු මීනුම්දඬු කෝඩු වලින් තමයි ලෝකයක් ගොඩ නැඟෙන්නේ. එතකොට මෙන්න මේ ස්පර්ශ ආයතනයන්ගෙන් ගොඩනැඟෙන ලෝකය එහෙම පිටින්ම ප්‍රපංච ලෝකයක්. නිවන නිෂ්ප්‍රපංච තත්ත්වයයි කියල කියන්නේ මේ ප්‍රපංචයෙන් එතෙරවීම. මේ ප්‍රපංචය කෙළවර කිරීම. ප්‍රපංචය කෙළවර කිරීමත්, සළායතනය කෙළවර කිරීමත් එකයි. ඒ බව හෙළිවන සූත්‍රයක් තියනව අංගුත්තරනිකායේ චතුක්ක නිපාතයේ[9]. මහා කොට්ඨිත ස්වාමීන් වහන්සේ සාරිපුත්ත ස්වාමීන් වහන්සේගෙන් ප්‍රශ්නයක් අහනව. මේ මහා කොට්ඨිත ස්වාමීන් වහන්සේයි සාරිපුත්ත ස්වාමීන් වහන්සේයි බොහෝ අවස්ථාවල් වල ප්‍රශ්නෝත්තර වශයෙන් සාකච්ඡා කරන්නේ අප සඳහායි.. තමන්ට ඇතිවන සැකයක් සඳහා නොවෙයි. ධර්ම කාරණා මතුකර දීම සඳහායි. සාරිපුත්ත ස්වාමීන් වහන්සේගෙන් අහනව මහා කොට්ඨිත ස්වාමීන් වහන්සේ 'ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙස විරාග නිරොධා අත්ථඤ්ඤං කිඤ්චි'. සාරිපුත්ත ස්වාමීන් වහන්සේ දෙන පිළිතුර 'මා හෙවං ආවුසො' එසේ නොකියව ඇවැත්නි. ප්‍රශ්නය මොකක්ද? ඇවැත්නි ස්පර්ශ ආයතන හයෙහි නිරුද්ධවීමෙන් පස්සේ තවත් යමක් තිබෙනවාද? කියන එකයි. ඊට සැරියුත් ස්වාමීන් වහන්සේ දෙන පිළිතුර 'මාහෙවං ආවුසො' එහෙම අහන්න එපා. ඒ ප්‍රශ්නය ගැලපෙන්නෙ නැහැ, කියන එකයි. ඊළඟට අහනව මහා කොට්ඨිත ස්වාමීන් වහන්සේ, 'ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා නත්ථඤ්ඤං කිඤ්චි.' 'හොඳයි එහෙම නම් මේ ස්පර්ශ ආයතන හය සම්පූර්ණයෙන්ම නැතිවුනාට පස්සේ කිසිවක් නැද්ද? 'මාහෙවං ආවුසො' එහෙමත් අහන්න එපා. ඊළඟට අහන තුන්වැනි ප්‍රශ්නය 'ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාග නිරොධා අත්ථි ච නත්ථි චඤ්ඤං කිඤ්චි' - ඇති සහ නැති කියන එකද තත්ත්වය. ඒකත් අහන්න එපාය කිව්ව. ඊළඟට හතර වෙනුවට 'නො අත්ථි නො නත්ථි' - අර චතුෂ්කෝටි ක්‍රමයටයි මේ සූත්‍රයෙ විවරණය කෙරෙන්නෙ. එහෙමනම් සළායතනය නිරුද්ධවීමෙන් පස්සේ යමක් ඇත්තේත් නැහැ නැත්තෙත් නැහැ. කියලද කියන්න වෙන්නෙ. ඒකටත් සැරියුත් ස්වාමීන් වහන්සේ දෙන පිළිතුර 'මාහෙවං ආවුසො' එසේ නොකියව ඇවැත්නි. එතකොට මහා කොට්ඨිත

ස්වාමීන් වහන්සේ විමසනව කොහොමද මේ දීපු පිළිතුරු මම තේරුම් කරගන්නේ කියල. මක්නිසාද මේ හැම ප්‍රශ්නයක්ම ප්‍රතික්ෂේප කළේ කියල. ඒකට හේතු වශයෙන් ඊළඟට සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරනව 'ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා අත්ථඤ්ඤං කිඤ්චි ඉති වදං අප්පපඤ්චං පපඤ්චෙති. ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා නත්ථඤ්ඤං කිඤ්චී ති ඉති වදං අප්පපඤ්චං පපඤ්චෙති.' ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙස විරාග නිරොධා අත්ථි ච නත්ථි චඤ්ඤං කිඤ්චීති ඉති වදං අප්පපඤ්චං පපඤ්චෙති. ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා නෙවත්ථි නො නත්ථඤ්ඤං කිඤ්චීති ඉති වදං අප්පපඤ්චං පපඤ්චෙති. ඒ හතර ආකාරයෙන්ම මේ ප්‍රශ්නය ඇසීමෙන් කෙරෙන්නේ 'අප්පපඤ්චං පපඤ්චෙති' ප්‍රපංච නොකටයුත්තක් පිළිබඳව ප්‍රපංච කිරීමක්, ප්‍රපංච නොකළ යුතු තැනක් පිළිබඳව ප්‍රපංච කිරීමක් වෙන නිසයි ඒ ප්‍රශ්න හතරම ප්‍රතික්ෂේප කළේ. ඊළඟට නිගමන වාක්‍යය හැටියට සාරිපුත්ත ස්වාමීන් වහන්සේ අවසාන වශයෙන් ප්‍රකාශ කරනව. 'යාවතා ආවුසො ඡන්නං ඵස්සායතනානං ගති තාවතා පපඤ්චස්ස ගති. යාවතා පපඤ්චස්ස ගති. තාවතා ඡන්නං ඵස්සායතනානං ගති. ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙසවිරාගනිරොධා පපඤ්ච නිරොධො පපඤ්ච වූපසමො' ඇවැත්නි ස්පර්ශ ආයතන හය යම්තාක් දුරට යේද - 'ගති' කියල එතන යෙදෙන්නෙ ස්පර්ශ ආයතන හයේ විෂය - එහෙම නැත්නම් ස්පර්ශ ආයතන හය යම්තාක් දුරට විහිදේද ඒ තාක් දුරටම ප්‍රපංචයත් විහිදෙයි. ඒ දෙක එකිනෙකට සම්බන්ධ බවයි පෙන්නුම් කරන්නේ. එකිනෙකට සමානයි. 'ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙස විරාග නිරොධා පපඤ්ච නිරොධො පපඤ්ච වූපසමො' ස්පර්ශ ආයතන හයේ නිරවශේෂ විරාගය සහ නිරෝධය ඇති වීමෙන් වෙන්නේ කුමක්ද? පපංච නිරෝධය, පපංච වූපසමය. පපංච නිරුද්ධ වෙනව. පපංච වූපසමය වෙනව. මේ ප්‍රපංච ගැන අපි තරමක් දුරට විග්‍රහ කරලයි තියෙන්නෙ කලිනුත්.

මෙතෙන්දී මේ අටුවාචාරීන් වහන්සේ අර 'අත්ථඤ්ඤං කිඤ්චි' කියන පදය තෝරන්නේ, අර විධියට ස්පර්ශ ආයතන හය නිරුද්ධ උනාට පස්සේ - 'තතො පරං අත්ථි කොචි අප්පමත්තකොපි කිලෙසොති පුච්ඡති, මේ ප්‍රශ්නයෙන් අහන්නේ - මහා කොට්ඨිත ස්වාමීන් වහන්සේ අහන්නේ - අර සළායතනය නිරුද්ධ උනාට පස්සේ අල්ප මාත්‍රවූ ක්ලේශයක්වත් තියෙනවද කියන එකයි කියල ඒ විදියට අටුවාචාරීන් වහන්සේ තෝරන්නේ. නමුත් මෙතන මේ කෙලෙස් පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි තියෙන්නේ. කෙලෙස් තව ඉතුරුව තියෙනවද කියන ප්‍රශ්නය නොවෙයි මෙතන අහන්නෙ. එහෙම අහනව නම් එහෙම නැතෙයි කියල කෙලින්ම පිළිතුරු

දෙන්නත් ඉඩ තිබුනා. මෙතන මේ 'අත්ථඤ්ඤං කිඤ්චි' කියල අහන්නෙ- මෙතන ප්‍රශ්නය ඇත්ත වශයෙන්ම 'කිසිවක් ඇත සහ නැත' කියන වචන පිළිබඳවයි. ඒකට 'ඇත' කියන වචනය ව්‍යවහාර කරන්න පුළුවන්ද, 'නැත' කියන වචනය ව්‍යවහාර කරන්න පුළුවන්ද, සළායතන නිරුද්ධ උනාට පස්සෙ, ඒ වගේම 'ඇත සහ නැත' - වැරදි දෙකක් එකතු කළාම හරි වෙන්නෙ නැහැනෙ. ඇතිත් වැරදියි නැතිත් වැරදියි එතකොට ඇති සහ නැති කිව්වාම ඒකත් වරදින්න ඕන. ඊළඟට ඒ දෙකම නැතෙයි කිව්වත් ඒකත් වැරදියි. ඒකයි අර සතර කොන් තර්කයම ප්‍රතික්ෂේප වෙන්නෙ. මෙතන මේ ප්‍රපංචය, එතකොට, 'ඇත' 'නැත' කියන ව්‍යවහාරයමයි. මුළු මහත් ලෝකයක් ගොඩනැගිල තිබෙන්නේ ලෝකයේ දේවල් 'ඇත' 'නැත' කියන ඒ ප්‍රඥප්තිය උඩ. මේව සංඛත බව අවබෝධකර නොගෙන අපි ඒ ඒ අවස්ථානුකූලව 'මේක ඇත' කියල කියනව. මේ ඉදිරිපිට ඇති යන්ත්‍රය, මේ හැම දෙයක්ම තියෙනව කියල කියනව. අපි ඉන්නව කියල කියනව 'වෙමි' කියල කියනව. ඇතුළෙ කෙරෙන අර ශීඝ්‍රාකාර, අර මොහොතක් පාසා සිදුවන, උදයබ්බය වලින් අපි සමුදය පක්ෂයේමයි බොහෝ දුරට ජීවත් වෙන්නෙ. මේ 'ඇත' 'නැත' කියන ප්‍රඥප්ති සම්පූර්ණයෙන්ම ගොඩනැගිල තියෙන්නෙ මේ සළායතනය උඩයි. 'ඇත' සහ 'නැත' පමණක් නොවෙයි ඒ දෙක එකතුකරල දක්වන තර්ක. එතකොට භාෂා ව්‍යවහාරයට, තර්කයට, මේ හැම එකකටම බුදුරජාණන් වහන්සේ ගහපු දුම්මල පාරවල් රාශිය අපට පෙනෙනව, මේ හැම එකකින්ම. මහ ගිනි ජාලාවක් වගෙයි. මේ විධියට මේ සූත්‍රයෙන් ප්‍රකාශ වෙන්නෙ කුමක්ද? සළායතන නිරෝධයෙන්ම ප්‍රපංච නිරෝධය වෙනව. එතකොට මේ දෘෂ්ටි සමූහයට-සමහර අවස්ථාවල අව්‍යාකත ප්‍රශ්න ආදී මිථ්‍යා දෘෂ්ටි පිළිබඳව-බුදුරජාණන් වහන්සේ යොදන වචනයක් තමයි 'දිට්ඨි පරිළාහ'. පරිළාහ කියල කියන්නෙ දාහය. උණකාරයන්ට එහෙම ඇතිවෙනවා වතුර ඉල්ලල කෑගහන අවස්ථාව. ඒකටත් පරිළාහ කියල කියනව. ඔන්න ඔය විධියෙ උණකාරයෝ ගොඩක් තමයි පෘථග්ජනයො. සාමාන්‍යයෙන් මේ ලෝකය පිළිබඳ ප්‍රශ්න මේ විධියට තර්කානුකූලව, තර්කවලින් විසඳාගන්න වෙහෙසෙන අර පූරණකස්සප, නිගණ්ඨනාථපුත්ත ආදීන් හරියට අර උණකාරයන් වගේ ගත්තු ඒ මුලු මතයම වැරදියි. ඒ මක්නිසාද? අයෝනිසෝමනසිකාරයෙන්, ඒව තුළ තිබෙන සංස්කාර තත්ත්වය අවබෝධකර නොගැනීම නිසයි ඔය ප්‍රශ්න අහන්නේ. ඉතින් ලෝකයේ කෙළවර සොයාගෙන මුළු ජීවිතයම පවා ගමන් කරනව. ඔන්න ඔහොම තත්ත්වයක් ලෝකයේ තියෙන්නෙ. ඒව තමයි ප්‍රපංච. ඇත්ත වශයෙන්ම මුළු මහත් ලෝකය පුරා පැතිර යන වචනයක් මේ ප්‍රපංච කියන වචනය. සාමාන්‍යයෙන් තෝරනව තණ්හා පපඤ්ච, මාන පපඤ්ච, දිට්ඨි පපඤ්ච කියල. එයින් පපඤ්ච කියන වචනය තේරුව වෙන්නෙ නැහැ. ඒ ප්‍රපංච

වල ප්‍රධාන කොටස් 3 ක් දැක්වීම පමණයි. පපඤ්ච කියන්නේ කුමක්ද කියල ඇහුවම කියන්නෙ 'තණ්හා පපඤ්ච, දිට්ඨි පපඤ්ච, මාන පපඤ්ච ඔයින් හැඟෙන්නෙ නැහැ පපඤ්ච කියන එක තේරුම් ගත්තද නැද්ද කියල. නමුත් මේ ප්‍රපංච වීම, මේ ප්‍රපංචය, වාග් විෂය ආශ්‍රය කරගෙන පවතින්නෙ. අපි අර කලිනුත් ප්‍රකාශ කළා 'අසමි කියන කුඤ්ඤය ගැහුවට පස්සෙ එතන ඉඳල ව්‍යාකරණය විහිදෙන හැටි. උත්තම පුරුෂයට පස්සේ ප්‍රථම පුරුෂ මධ්‍යම පුරුෂ ආදී වශයෙන්. ඊළඟට තර්ක ශාස්ත්‍රයේත් ඒ වගේම දෙයක්. මේක දෙකක්ද? මේ දෙකම එකක්ද? කියල අහන කොට ඒ ප්‍රශ්න දෙකේම තියෙනව එක්තරා මිථ්‍යාවක්. 'මේක දෙකක්ද' කියල අහන පුද්ගලය ඉස්සෙල්ල එකක් කියල අරගෙනයි අහන්නේ. ඔය විධියෙ, එහෙම පිටින්ම මේ භාෂා ව්‍යවහාර හා සම්බන්ධ මහා මිථ්‍යා ගොඩක්, පටලැවිලි ගොඩක්, උඩයි ලෝකයා සිටින්නේ. අන්න ඒව සියල්ල නිරාකරණය වන ආකාරයයි බුදුරජාණන් වහන්සේ මේ සළායතන නිරෝධයෙන් පෙන්නුම් කරන්නෙ. එතකොට මේක මේ ජීවිතයේදීම ප්‍රත්‍යක්ෂ කරගත හැකි එකක්. සඤ්ඤාවත් මනසත් සහිත මේ බඹයක් පමණ වූ ශරීරය තුළ - මේ ශරීරය තුළම - ලෝකය තියෙනව කියල බුදුරජාණන් වහන්සේ වදාළේ මේ නිසයි.

එතකොට මේ ලෝකය පිළිබඳ ප්‍රශ්නය - මේක මේ චක්‍රාකාර ප්‍රශ්නයක් බව අපි කලිනුත් ප්‍රකාශ කළා. චක්‍රයක කෙළවරක් දකින්න බැරි උනත් මේ ප්‍රශ්නය විසඳා ගන්න ක්‍රමයක් තියෙනව. එක ක්‍රමයක් තියෙනව, කුමක්ද? චක්‍රය බිඳීමෙන්. 'වට්ටුපච්ඡේද' කියන්නෙ ඒකයි. වට්ටය බිඳිනව. මේ වට්ටය බිඳින්නෙ ගමන් කිරීමෙන් නොවෙයි. මේ සන්තානයේම තිබෙන වට්ටය. ඒක තමයි අපි දිය සුළිය හැටියට හැඳින්වූයේ. විඤ්ඤාණයත් නාම රූපයත් අතර තියෙන දිය සුළියයි. ඒ දිය සුළියම තමයි අර කලින් අවස්ථාවක නිබ්බාන සූත්‍ර දක්වන අවස්ථාවේ සඳහන් කළේ.

**විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතො පභං**
**එත්ථ ආපො ච පඨවි - තෙජො වායො න ගාධති**
**එත්ථ දීඝං ච රස්සං ච - අණුං ථූලං සුභාසුභං**
**එත්ථ නාමං ච රූපංච - අසෙසං උපරුජ්ඣති**
**විඤ්ඤාණස්ස නිරොධෙන - එත්ථෙතං උපරුජ්ඣති.**[10]

නාම රූපය නැතිවෙන හැටි එතන පෙන්නුම් කරනව. 'විඤ්ඤාණං අනිදස්සනං අනන්තං සබ්බතොපභං' අනන්තවූ හැම පැත්තෙන්ම ආලෝකවත් වූ අනිදස්සන විඤ්ඤාණයෙහි ආපො, පඨවි, තෙජො, වායො කියන මහාභූත ධර්මවත් නැහැ. මේ මහාභූත ධර්මයන්ගෙන් තමයි මේ කට්ටිය මේ චක්‍රවාල ලෝකයක් හැදෙනව කියල කියන්නෙ. චක්කවාල කියන

වචනයෙත් තියෙන්නෙ චක්‍රයයි. මේ ලෝකය හැදෙන්නෙත් මේ මහාභූත ධර්ම වලින්. මේ මහාභූත ධර්මත් අර අනිදස්සන විඤ්ඤාණයේ නැහැ. එපමණක් නොවේ. 'දීඝං රස්සං අණුං ථූලං - එත්ථ දීඝං ච රස්සං ච - දිග කොට කියන මිනුම් දඬු කෝදු මුකුත් නැහැ. අණුං ථූලං සුභාසුභං - ඒ විදියේ මැනුම් කිසිවක් නැහැ. 'එත්ථ නාමංච රූපංච - නාමයත් රූපයත් මෙතන අශේෂව නිරුද්ධයි. එතකොට දක්ෂ වෛද්‍යවරයෙක් රෝගයේ විෂබීජයට පහර ගහල ඒ විෂබීජය නසල, කෙනෙක් සුවපත් කරන්නා වගේ බුදුරජාණන් වහන්සේ මේ වට්ටුපච්ඡේදය කළේ, අපේ මේ බඹයක් පමණ වූ ශරීරය තුළමයි. විඤ්ඤාණයත් නාම රූපයත් අතර නිතර කරකැවෙන වට්ටය එහෙම නැත්තම් දිය සුළිය - මේක සින්ද. විඤ්ඤාණ නිරෝධයෙන් නාම රූප නිරෝධය. නාමරූප නිරෝධයෙන් විඤ්ඤාණ නිරෝධය. ඒක තමයි අර නළකළාප සූත්‍රයෙන්[11] ප්‍රකාශ වෙන්නෙ. විඤ්ඤාණය ඉවත් කළ හැටියෙ - අර බටකෝටු මිටි දෙකක් එකකට එකක් හේත්තු කරල තියෙන කොට එකක් ඇද්දහම අනික වැටෙනව. ඒ වගේ විඤ්ඤාණය නිරෝධයෙන් නාමරූපනිරෝධය - නාම රූප නිරෝධයෙන් විඤ්ඤාණ නිරෝධය. ඔන්න ඔය විධියටයි බුදුරජාණන් වහන්සේ මේ ප්‍රශ්නය විසඳුවෙ.........

# අධෝලිපි

1. සං.නි. I බු.ජ. 13-28
2. මහා.බු.ජ. 3-4 පිටුව
3. සං.නි. III බු.ජ. 15-152 පිට
4. බු.නි. බු.ජ. 24-38 පිට
5. සං.නි. II බු.ජ. 14-28 පිට
6. අං.නි. V බු.ජ. 22-496 පිට
7. අං.නි. II බු.ජ. 19-92 පිට, සං.නි. I බු.ජ. 13-118 පිට
8. සං.නි. IV බු.ජ. 16-204 පිට
9. අං.නි. II බු.ජ 19-212
10. දී.නි. I බු.ජ. 7-538 පිට
11. සං.නි. II බු.ජ. 14-176

# 24 වන

# දේශනය

# 24 වන දේශනය

**"නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"**

" එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං."

" මෙය ශාන්තය මෙය ප්‍රණීතය එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම, සියලු උපධීන් අතහැර දැමීම, තණ්හාව ක්ෂය කිරීම, නොඇල්ම නම් වූ විරාගය, නැවැත්ම නම් වූ නිරෝධය, නිවීම නම් වූ නිබ්බානය."

**"අති පූජනීය මහෝපාධ්‍යාය මාහිම්පාණන් වහන්සේ ප්‍රධාන ගරුතර යෝගාවචර මහා සංඝ රත්නයෙන් අවසරයි. නිබ්බාන යන මාතෘකාව යටතේ පවත්වනු ලබන දේශනා මාලාවේ විසිහතර වන දේශනයයි මේ."**

ලෝකයත්, ලෝක සමුදයත්, ලෝක නිරෝධයත්, ලෝක නිරෝධ ගාමිනී පටිපදාවත්, සංඥාව සහ මනස සහිත මේ සිරුර තුළින්ම පෙන්වා දිය හැකි බව ප්‍රකාශ කෙරෙන ශ්‍රේෂ්ඨතම බුද්ධ භාෂිතයක් ගියවර දේශනයේ දී අප රෝහිතස්ස සූත්‍රයෙන් මතු කර ගත්තා. සම්මුති ලෝකයක් හඳුනා ගැනීමට, මැන ගැනීමට, උපකාරවන සළායතනයම, ආයතන හයම, ආර්ය ව්‍යවහාරයට අනුව ලෝකය නමින් හැඳින්වෙනව. ඒ නිසා ඒ සළායතන නිරෝධයම ලෝක නිරෝධය හැටියට ධර්මානුකූලව ප්‍රකාශ කරන්නට පුළුවන් වෙනව. ලෝක නිරෝධය නම් වූ මේ තත්ත්වය තමයි අර අසංඛත ධාතු නමින් හැඳින්වෙන්නෙ. මේ සංඛත ලෝකයේ කෙළවර,නිරෝධය - අසංඛත ධාතුව නමින් හැඳින්වෙනව. ඔය නිබ්බාන පටිසංයුක්ත සූත්‍රවල 'අත්ථි භික්ඛවෙ අජාතං අභූතං අකතං අසංඛතං' ආදී වශයෙන් අසංඛත තත්ත්වය අර සංඛත වූ ලෝකයේ කෙළවර වන මේ සළායතන නිරෝධයයි. එතකොට මේ කියන ලෝකාන්තය-මේ කියන ලෝකයේ කෙළවර-ගමන් කිරීමෙන් දැකිය හැකි කෙළවරක් නොවෙයි. මේ කෙළවර දැකීමට රෝහිතස්ස සෘෂිවරය අවුරුදු සියයක්ම ඊතල වේගයෙන් ගමන් කළා. නමුත් ලෝකයේ කෙළවර දකින්නට බැරි උනා. මක්නිසාද? ඒ රෝහිතස්ස ලෝකයෙ කෙළවර සොයන්ට ගමන් කළේ ලෝකයත් අර ගෙනමයි. සංඥාවත් මනසත් සහිත මේ සළායතනයම ලෝකය වන නිසා ඒ ලෝකයත් අරගෙනමයි රෝහිතස්ස සෘෂිවරය ගමන් කළේ. ඒනිසා අතර මඟදීම කළුරිය කරන්නට සිද්ධඋනා, ලෝකයේ කෙළවර නොදැකම. ගමන් කිරීමෙන් නොදැකියහැකි, නොපැමිණිය හැකි, ඒ ලෝකයේ කෙළවර බුදු

රජාණන් වහන්සේ සළායතන නිරෝධයෙන්ම පෙන්වා වදාළ. ඒ බව අපට හෙළිවෙනව අපි කලිනුත් සාකච්ඡා කළ උදාන පාළියේ පාටලි ගාමියවග්ගයේ නිබ්බාන පටිසංයුත්ත සූත්‍ර වලින්. දැන් නිදසුන් වශයෙන් කියනවනම්, අර තුන්වැනි නිබ්බාන පටිසංයුත්ත සූත්‍රයේ, 'අත්ථි භික්ඛවෙ තදායතනං' ආදි වශයෙන් ආරම්භ වන ඒ සූත්‍රයේ අග හරියේදී කියැවෙනව 'තත්‍රපාහං භික්ඛවෙ නෙව ආගතිං වදාමි න ගතිං න ඨිතිං න චුතිං න උපපත්තිං අප්පතිට්ඨං අප්පවත්තං අනාරම්මණමෙවෙතං එසෙවන්තො දුක්ඛස්ස' කියල. ඒ කියපු ආයතන නාමයෙන් හඳුන්වන පඨවි ආපො තෙජො වායො ආදී කිසිවක් නැති ඒ තත්ත්වයේ - එහි ඒමක් යාමක් හෝ නැතැයි කියමි. 'තත්‍රපාහං භික්ඛවෙ නෙව ආගතිං වදාමි න ගතිං ......' ඒමක්ද නැතැයි කියමි. යාමක්ද නැතැයි කියමි. සිටීමක්ද නැතැයි කියමි. චුතියක් උප්පත්තියක් නැතැයි කියමි. 'අප්පතිට්ඨං අප්පවත්තං අනාරම්මණං එව එතං.....' පිහිටීමක්, පැවැත්මක්, අරමුණක් නැති ඒ තත්ත්වයම දුකෙහි කෙළවරයි, කියල ඒ විධියට බුදුරජාණන් වහන්සේ එතන දැක්වුව. එතකොට මේ කියාපු මේ ගමනේ කෙළවර - **ගමන් කිරීමෙන් නොපැමිණිය හැකි ගමනේ කෙළවර**, බුදුරජාණන් වහන්සේ මෙන්න මේ විධියට සළායතන නිරෝධයෙන් දක්වා වදාළ. උදාන පාළියේ පාටලියගාමිය වග්ගයේ හතරවෙනි නිබ්බාන පටිසංයුත්ත සූත්‍රයේ සඳහන් වෙනව '**නිස්සිතස්ස හි චලිතං අනිස්සිතස්ස චලිතං නත්ථි. චලිතෙ අසති පස්සද්ධි. පස්සද්ධියා සති නති න හොති නතියා අසති ආගති ගති න හොති ආගති ගතියා අසති චුතූපපාතො න හොති චුතූපපාතෙ අසති නෙව ඉධ න හුරං න උභයමන්තරෙ. එසෙවන්තො දුක්ඛස්ස.**'

'නිස්සිතස්ස හි චලිතං ...' යමක් මත රඳා සිටින්නහුටයි සැලීමක් සෙලවීමක් ඇති වන්නෙ, ඒ නිසා යමක් මත රඳා නොසිටින්නහුට එවැනි සැලීමක් නැත. 'චලිතෙ අසති පස්සද්ධි.......' මේ සැලීමක් නැති කල්හි පස්සද්ධිය ඇත. - 'පස්සද්ධියා සති නති න හොති....' පස්සද්ධිය ඇති කල්හි නැඹුරුවීමක් නැත. නැඹුරුවීමක් නැති කල්හි 'ආගති ගති න හොති....' ඒමක් සහ යාමක් කියල දෙකක් නැත. ඒ වගේම 'ආගති ගතියා අසති චුතූපපාතො න හොති....' ඒමක් යෑමක් නැති කල්හි චුතියක් උප්පත්තියක් කියන දෙකක්ද නැත. 'චුතූපපාතෙ අසති නෙව ඉධ න හුරං න උභයමන්තරෙ. 'චුති උප්පත්ති කියල දෙකකුත් නැත්නම් මෙහිත් කියල දෙයක් නැහැ. එහිත් කියල දෙයක් නැහැ. ඒ දෙක අතර කියල තැනකුත් නැහැ. මෙයම දුකෙහි කෙළවරයි.

ඔන්න ඔය විධියට ඉතාම ගම්භීර අර්ථයකින් ලෝකයේ කෙළවර බුදුරජාණන් වහන්සේ පෙන්නුම්කර වදාළ. එය ගමනින් දැකියහැකි දෙයක් නොවෙයි, ප්‍රඥාවෙන්ම දැකියයුතු දෙයක්-ඇත්ත වශයෙන්ම එය ගමන

පිළිබඳ ප්‍රඥප්තිය සමතික්‍රමණය කිරීමෙන් - ඉක්මවීමෙන් - අර කියාපු සළායතන නිරෝධ තත්ත්වයේදී. එතකොට ලෝකයත් අරගෙනමයි අර රෝහිතස්ස ලෝකයෙ අන්තය හොයන්න ගියේ. ඒ වගේම තවත් අනුවණ ක්‍රියාවක් කළා රෝහිතස්ස - මරණයෙන් බේරීමට මරණය නැති තැනක් සොයන්න ගමන් කළා. ඒකත් ගමන් කිරීමෙන් නොදැකිය හැකි එකක් බවයි බුදුරජාණන් වහන්සේ දේශනා කළේ. මක් නිසාද **රෝහිතස්ස ගමන් කළේ මාරයාත් අරගෙනමයි. මාරයාත් සමගමයි මරණයක් නැති තැනක් සොයාගෙන ගියේ.** අපි එහෙම ප්‍රකාශ කරන්නේ - දැන් රාධ සංයුක්තයේ රාධ ස්වාමීන් වහන්සේ බුදුරජාණන් වහන්සේගෙන් මෙන්න මෙහෙම ප්‍රශ්නයක් අහනව. 'මාරො මාරො ති භන්තෙ වුච්චති කිත්තාවතා නුඛො භන්තෙ මාරොති වුච්චති, ස්වාමීනි මේ 'මාරය, මාරය' කියල කියනව. කෙතෙකින් මාරයා යයි කියනු ලැබේද? එතකොට බුදුරාජාණන් වහන්සේ ඊට දෙන පිළිතුර 'රූපෙ ඛො රාධ සති මාරො වා අස්ස මාරෙතාති වා යො වා පන මීයති. තස්මාතිහ ඛො රාධ රූපං මාරොති පස්ස, මාරෙතාති පස්ස මීයති ති පස්ස රොගොති පස්ස, ගණ්ඩොති පස්ස,සල්ලන්ති පස්ස, අඝන්ති පස්ස, අඝභූතන්ති පස්ස, යෙ නං එවං පස්සන්ති තෙ සම්මා පස්සන්ති'

'රාධ රූපය ඇති කල්හි මාරයෙක් හෝ මරන්නෙක් හෝ මැරෙන කෙනෙක් හෝ වන්නේය. එම නිසා රාධ, රූපයම මාරයා හැටියට මරන්නෙක් හැටියට මැරෙන කෙනෙක් හැටියට දකිව්. ඒ වගේම රෝගයක් හැටියට, උලක් හැටියට, ව්‍යසනයක් හැටියට, ව්‍යසනයට පත් වූ දෙයක් හැටියට, රූපස්කන්ධය දෙස බලව්. යම් කෙනෙක් මෙසේ දකිත්ද ඔවුහු මැනවින් දකිත්. ඔවුහු සම්‍යක් දර්ශනයෙන් යුක්තයහ.' ඒ විධියටම - රූපය පිළිබඳව වගේම - වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ කියන ඒ පඤ්ච උපාදානස්කන්ධයම එතකොට ධර්මානුකූලව මාරයා හැටියට එතෙන්දි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරල තිබෙනව. අන්න ඒක නිසා තමයි අපි කිව්වේ මේ රෝහිතස්ස මරණයක් නැති තැනක් සොයාගෙන ගියේ මාරයාත් සමඟයි කියල. මෙයින් අපට පෙනෙනව මේ කියන උපාදාන ස්කන්ධ මේ රූප, වේදනා, ආදිය තණ්හාවෙන් අල්ලාගෙන සිටින තාක් මාරයෙක් මරන්නෙක් මැරෙන්නෙක් සිටින බව. ඒ නිසාම ඒවා අතහැරීමෙන් මාරයා ගෙන් මිදුනු, මරණයෙන් මිදුනු, අමරණීය කෙනෙකු බවට පත්වෙනව. රහතන් වහන්සේ මෙලොවම, මෙහිදීම, අමරණීය තත්ත්වයට පත්වුනා කියල ප්‍රකාශ කළේ ඒකයි. මෙතන තියෙන ධර්මතාව කලිනුත් අපි අර ප්‍රතීත්‍යසමුත්පාද ධර්මය පිළිබඳව විස්තර කරන අවස්ථාවේ ප්‍රකාශ කළා. සුත්ත නිපාතයේ පාරායණ වග්ගයෙ භද්‍රාවුධ මාණව පුච්ඡාවෙ ගාථාවක කොටසක් අපි දැන් මතක් කර ගනිමු.

**' යං යංහි ලොකෙ උපාදියනති - තෙනෙව මාරො අනෙවති ජනතුං '**

'ලෝකයෙහි යම් යම් දෙයක් උපාදාන වශයෙන් අල්ලා ගනිත්ද එයින්ම මාරයා මිනිසකු, සත්ත්වයකු පසුපස එයි.' එතකොට මේ උපාදාන නිසාම භවය ඇති වෙනව. භවය නිසා ජාති ජරා මරණ ආදී ඒ කියාපු ප්‍රඥප්ති වශයෙන් ඇතිවන තත්ත්ව සමූහයම ඒ එක්කම ඇතිවෙනව, තණ්හාව උපාදානය නිසා. අන්න ඒ ගැඹුරු අර්ථයෙන් තමයි එතකොට මේ පඤ්චුපාදානක්ඛන්ධයම මාරයා හැටියට බුදුරජාණන් වහන්සේ දක්වා වදාළේ. එපමණක් නොවෙයි මේ සළායතනයම, මේ ආයතන හයම, මාරයාගේ පාලනය යටතෙයි තිබෙන්නේ. අපට ඒක හෙළි වෙනව මාරයාගේ වචනයෙන්ම, සංයුක්ත නිකායේ සගාථක වග්ගයේ මාර සංයුක්තයේ කස්සක සූත්‍රයෙන්. එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ නිබ්බාන පටිසංයුක්ත ධර්ම දේශනාවකින් භික්ෂූන් උත්සාහවත් කරමින් සිටින විට මාර දිව්‍ය පුත්‍රය කල්පනා කළා මේ ශ්‍රමණ ගෞතමයින් මේ විධියට ධර්මය දේශනා කරමින් ඉන්නවා. සංඝයා වහන්සේලාත් බොහෝම සාවධානව කන්දීගෙන ඉන්නව. මම යන්න ඕන මේ අයගේ නුවණැස වසාලන්න - 'විචක්ඛු කම්මාය' - කියල එහෙම හිතාගෙන 'මාරයා ගොවියකුගේ වේශයක් මවාගෙන, නඟුලක් කරගහගෙන, දිග කෙවිටක් අතින් අරගෙන අවුල් වූ කෙසින් මඩ වැකුණු පයින් යුක්තව බුදුරජාණන් වහන්සේ දේශනා කරන තැනට ඇවිල්ල මෙන්න මෙහෙම අහනව - 'අපි සමණ බලිවද්දෙ අද්දස' මහණ ගොනුන් දැක්කද? එතකොට බුදුරජාණන් වහන්සේත් තමන් මාරය හඳුන ගත්ත බව හෙළි කිරීමට 'කිං පන පාපිම තෙ බලිවද්දෙහි'. පාපිය නුඹට ගොනුන්ගෙන් ඇති වැඩේ කුමක්ද? කියල ප්‍රශ්න කළා. එතකොට මාරය දැන ගත්ත ඉතින්, දැන් හඳුනා ගත්ත කියල. ඒ අවස්ථාවේ මාරය තමන්ගේ හපන්කම ප්‍රකාශ කරනව. 'මමෙව සමණ චක්ඛු මම රූපා මම චක්ඛු සම්ඵස්ස විඤ්ඤාණායතනං කුහිං මෙ සමණ ගන්තවා මොක්ඛසි' මහණ ඇස මගේය, රූපයනුත් මගේය, ඒ වගේම චක්ඛු සම්ඵස්ස විඤ්ඤාණායතනයත් මගේය. මහණ නුඹ කොහි ගිහිල්ල මගෙන් බේරෙන්නද? ඔය විධියටම අනෙකුත් ආයතන පිළිබඳවත් ප්‍රකාශ කරනව මාරය. 'මමෙව සමණ සොතං මම සද්දා මම සොත සම්ඵස්ස විඤ්ඤාණායතනං කුහිං මෙ සමණ ගන්ත්වා මොක්ඛසි' ආදීවශයෙන් මනායතනය දක්වාම ප්‍රකාශ කරනව. 'මමෙව සමණ මනො මම ධම්මා මම මනොසම්ඵස්සවිඤ්ඤාණායතනං කුහිං මෙ සමණ ගන්ත්වා මොක්ඛසි' ඔය විධියට මාරය ඇසුවාම බුදුරජාණන් වහන්සේ ඊට දෙන පිළිතුර, 'තවෙව පාපිම චක්ඛු තව රූපා තව චක්ඛුසම්ඵස්සවිඤ්ඤාණායතනං යත්ථ ච පාපිම නත්ථි චක්ඛු,නත්ථි රූපා,නත්ථි චක්ඛුසම්ඵස්සවිඤ්ඤාණායතනං අගති තව තත්ථ පාපිම' ඒකෙ අදහස 'ඔව් පාපිය නුඹේම තමයි මේ ඇස,

නුඹේම තමයි මේ රූපයත්, නුඹේම තමයි මේ චක්ඛුසම්ඵස්සවිඤ්ඤාණය, නමුත් පවිට යම් තැනෙක මේ ඇසත් නැද්ද, රූපයෝත් නැත්ද, චක්ඛුසම්ඵස්සවිඤ්ඤාණයත් නැද්ද, එතනට නුඹට කිට්ටු වෙන්න බැහැ. එතැන නුඹගේ අගතියයි. නුඹට යන්න බැරි තැනයි.' කියල මේ විධියට අර ආයතන හය පිළිබඳව ප්‍රකාශ කළා. ඇස්, කන්, නාසා දී සියලුම ආයතනයන් පිළිබඳව බුදුරජාණන් වහන්සේ මාරයා ඇසූ ප්‍රශ්නයට ගැලපෙන හැටියට පිළිතුරු දුන්න. මෙයින් අපට තේරෙනව - මේ සූත්‍රයෙන් - මේ මාරයට යන්න බැරි තැනකුත් තිබෙන බව. මේ බැරි තැන කුමක්ද? අර සළායතන නිරෝධ තත්ත්වයමයි. ප්‍රත්‍යක්ෂ කරගත හැකි, ආයතන නාමයෙන් සමහරවිට හඳුන්වන, අර 'අත්ථි භික්ඛවෙ තදායතනං' ආදී වශයෙන් නිබ්බානපටිසංයුත්ත සූත්‍ර වල දක්වන, සළායතන නිරෝධ තත්ත්වයයි.

ඒ සළායතන නිරෝධයම තමයි පපංච නිරෝධ, පපංච වූපසම, නිප්පපඤ්ච ආදී නම් වලින් හැඳින්වෙන්නේ. අපි කලින් අවස්ථාවක සාකච්ඡා කළ මහාකොට්ඨිත සූත්‍රයේ එහෙමත් 'ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙස විරාග නිරොධා පපංච නිරොධො පපංච වූපසමො' ආදී වශයෙන් ඒ සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කළා. ඒ ස්පර්ශ ආයතන හයේ නිරුද්ධවීමම ප්‍රපංචයේ සංසිඳීමයි. ප්‍රපංච නිරෝධයයි. ඒකමයි නිෂ්ප්‍රපංච තත්ත්වය. යාම් ඊම් ජාති ජරා මරණ ආදී සියලුම සංකල්ප තියෙන්නෙ අර ප්‍රපංචයේ. නිෂ්ප්‍රපංච තත්ත්වයේ ඒ කිසිවක් නැහැ. අන්න ඒක නිසා තමයි මේ නිෂ්ප්‍රපංච වූ තත්ත්වයට මාරයට කිට්ටු වෙන්න බැරි. එහි ඇස කණ නාසය ආදී ආයතන හෝ ඒවායේ අරමුණු කිසිවක් නැහැ. එතකොට මෙන්න මෙයින් අපට පේනව සළායතන නිරෝධයම මේ කියාපු මාරයට කිට්ටු වෙන්න බැරිතැන බව. ඒ මාරයගෙන් ලබන විමුක්ති තත්ත්වයයි, මෙලොවදීම ලැබිය හැකි තත්ත්වයක් හැටියට. මේ සළායතනය නිත්‍ය සංඥාව මත ගොඩනැඟුනක්. මේ ආයතන හයම ගොඩනැඟිල තියෙන්නෙ නිත්‍ය සංඥාව උඩයි. ඒක නිසා මේ සළායතන නිරෝධයට ළංවිය හැක්කේ, මේ සළායතන නිරෝධය ප්‍රත්‍යක්ෂ කරගත හැක්කේ - අනිත්‍ය සංඥාව පිහිට කරගෙනයි. අනිත්‍යානුපස්සනාව පිහිට කරගෙනයි.

මේ සළායතන නිරෝධයට උපකාරවන ඉතාමත්ම සියුම් අනිත්‍යානුපස්සනාවක් සංයුක්තනිකායේ සළායතන වග්ගයේ දෙවෙනි ද්වයං සූත්‍රයේ සඳහන් වෙනව. සිත පිළිබඳ ඉතාමත්ම ගැඹුරු දර්ශනයක් ගෙන එන ඒ ද්වයං සූත්‍රයේ[1] මේ විධියටයි සඳහන් වෙන්නේ. ද්වයං කියන්නේ දෙකක් කියන එකයි. ඒ විධියේ සූත්‍රත් දෙකක් තියෙනව. මේ දෙවැනි සූත්‍රය.'ද්වයං භික්ඛවෙ පටිච්ච විඤ්ඤාණං සම්භොති.කථඤ්ච භික්ඛවෙ ද්වයං පටිච්ච විඤ්ඤාණං සම්භොති. චක්ඛුං ච පටිච්ච රූපෙච උප්පජ්ජති චක්ඛු

විඤ්ඤාණං. චක්ඛු අනිච්චං විපරිණාමී අඤ්ඤථාභාවී. රූපා අනිච්චා විපරිණාමිනො අඤ්ඤථාභාවිනො.' ඉතෙථතං ද්වයං චලං චෙව වයඤ්ච අනිච්චං විපරිණාමී අඤ්ඤථාභාවී. චක්ඛුවිඤ්ඤාණං අනිච්චං විපරිණාමී අඤ්ඤථාභාවී. යොපි හෙතු යොපි පච්චයො චක්ඛුවිඤ්ඤාණස්ස උප්පාදාය, සොපි හෙතු සොපි පච්චයො අනිච්චො විපරිණාමී අඤ්ඤථාභාවී. අනිච්චං පන භික්ඛවෙ පච්චයං පටිච්ච උප්පන්නං චක්ඛුවිඤ්ඤාණං කුතො නිච්චං භවිස්සති. යා ඛො භික්ඛවෙ ඉමෙසං තිණ්ණං ධම්මානං සංගති. සන්නිපාතො සමවායො අයං වුච්චති භික්ඛවෙ චක්ඛුසම්ඵස්සො. චක්ඛු සම්ඵස්සොපි ඛො භික්ඛවෙ අනිච්චො විපරිණාමී අඤ්ඤථාභාවී. යොපි හෙතු යොපි පච්චයො චක්ඛු සම්ඵස්සස්ස උප්පාදාය සොපි හෙතු සොපි පච්චයො අනිච්චො විපරිණාමී අඤ්ඤථාභාවී. අනිච්චං ඛො පන පච්චයං පටිච්ච උප්පන්නො චක්ඛුසම්ඵස්සො කුතො නිච්චං භවිස්සති. ඵුට්ඨො වෙදෙති ඵුට්ඨො චෙතෙති ඵුට්ඨො සඤ්ජානාති. ඉතෙථතෙපි ධම්මා චලා චෙව වයා ච අනිච්චා විපරිණාමිනො අඤ්ඤථාභාවිනො.' එතකොට මෙතන මේ දිගටම අර අනිත්‍යතාව අඟවන පද රාශියක් තිබෙන බව සාමාන්‍යයෙන් ඇහුම්කන් දෙනකොට උනත් තේරෙනව. 'ද්වයං භික්ඛවෙ පටිච්ච විඤ්ඤාණං සම්භොති' මහණෙනි දෙකක් නිසා විඤ්ඤාණය හටගන්නෙ. 'චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං' ඇසත් රූපයනුත් නිසා චක්ඛුවිඤ්ඤාණය හට ගන්නව. ඊළඟට ප්‍රකාශ කරනව ඒ දෙක අතරින් 'චක්ඛු අනිච්චං විපරිණාමී අඤ්ඤථාභාවී ඇස අනිත්‍යයි වෙනස්වන සුළුයි. අන්‍යාකාරයට පත්වන සුළුයි.' රූපා අනිච්චා විපරිණාමිනො අඤ්ඤථාභාවිනො. රූපයනුත් අනිත්‍යයි වෙනස්වන සුළුයි. අන්‍යාකාරයට පත්වන සුළුයි. මෙසේ මේ දෙකම සැලෙන සුළුයි චලිත සලිත වන ස්වභාවයෙන් යුක්තයි. 'චලං'-මේ ඉතාමත් වැදගත් වචනයක්. 'වයං - ගෙවීයන ස්වභාවයෙන් යුක්තයි. ඒ වගේම අනිත්‍යයි. වෙනස්වන සුළුයි. අන්‍යාකාරයට පත්වන සුළුයි. ඊළඟට 'චක්ඛුවිඤ්ඤාණං භික්ඛවෙ අනිච්චං විපරිණාමී අඤ්ඤථාභාවී'-ඒ වගේම චක්ඛු විඤ්ඤාණයත්, අර දෙක නිසා ඇතිවන විඤ්ඤාණයත්, අනිත්‍යයි වෙනස්වන සුළුයි. අන්‍යාකාරයට පත්වන සුළුයි. 'යොපි හෙතු යොපි පච්චයො චක්ඛුවිඤ්ඤාණස්ස උප්පාදාය සොපි හෙතු සොපි පච්චයො අනිච්චො විපරිණාමී අඤ්ඤථාභාවී.' යම් හේතුවක් ප්‍රත්‍යයක් නිසා චක්ඛු විඤ්ඤාණය පහළවේද, ඒ හේතුවත් ඒ ප්‍රත්‍යයත්, අර වගේම අනිත්‍යයි. වෙනස්වන සුළුයි. අන්‍යාකාරයට පත් වන සුළුයි. ඊළඟට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව 'අනිච්චං ඛො පන භික්ඛවෙ පච්චයං පටිච්ච උප්පන්නං චක්ඛු විඤ්ඤාණං කුතො නිච්චං භවිස්සති.' අනිත්‍ය වූ ප්‍රත්‍යයක් පිහිට කරගෙන ඇති වන්නාවූ චක්ඛු විඤ්ඤාණය කෙසේනම් නිත්‍ය වන්නේද? ඊළඟට 'යා ඛො භික්ඛවෙ ඉමෙසං තිණ්ණං ධම්මානං සංගති සන්නිපාතො සමවායො, මේ කියාපු ධර්ම තුනේ, ඒ කියන්නෙ ඇසත් රූපයත් චක්ඛු

විඤ්ඤාණයත් කියන මේ තුනෙහි, එක්වීම සංගති එක්රැස්වීම, 'සන්නිපාතො' එකමුතු වීම, 'සමවායො' - එක්වීම එක්රැස්වීම එකමුතුවීම - බොහෝ දුරට සමානාර්ථවත් පද- මේ තුන එක්වුනාම ඒකට චක්ඛුඵස්සය කියල ප්‍රකාශ කරනව. ඊළඟට 'චක්ඛුසම්ඵස්සොපි භික්ඛවෙ අනිච්චො' විපරිණාමී අඤ්ඤථාභාවී' චක්ඛු සම්ඵස්සයත් ඒ වගේම අනිත්‍යයි වෙනස්වන සුළුයි. අන්‍යාකාරයට පත්වෙන සුළුයි.' 'යොපි හෙතු යොපි පච්චයො චක්ඛුසම්ඵස්සස්ස උප්පාදාය සොපි හෙතු සොපි පච්චයො අනිච්චො විපරිණාමී අඤ්ඤථාභාවී' චක්ඛු සම්ඵස්සය හටගැනීමට යම් හේතුවක් ප්‍රත්‍යයක් ඇද්ද ඒ හේතුවක් ප්‍රත්‍යයත් අර වගේම අනිත්‍යයි විපරිණාමියි, අඤ්ඤථාභාවියි. ඊළඟට අනිත්‍ය වූ හේතුවක් ප්‍රත්‍යයක් නිසා හටගන්නා චක්ඛුසම්ඵස්සය කෙසේ නම් නිත්‍යවන්නේද කියල බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව. ඊළඟට 'ඵුට්ඨො භික්ඛවෙ වෙදෙති' ස්පර්ශ කරන ලදුයේ විඳියි. 'ඵුට්ඨො චෙතෙති' ස්පර්ශ කරනු ලදුයේ චේතනාවක් ඇති කරගනී. සිතයි කියන එකයි. 'ඵුට්ඨො සඤ්ජානාති ස්පර්ශ කරනු ලදුයේ හඳුනාගනී. ඒ කියන්නෙ වේදනා, චේතනා, සඤ්ඤා කියන ධර්ම අර ස්පර්ශය නිසයි ඇති වෙන්නෙ. ඊළඟට ඉත්ථෙතෙපි ධම්මා චලා චෙව වයා ච අනිච්චා විපරිණාමිනො අඤ්ඤථාවිනො' මෙසේ මේ වේදනා, චේතනා, සඤ්ඤා කියන ධර්මයෝද අර වගේම සැළෙන සුළුයි.., ගෙවී යන සුළුයි. අනිත්‍යයි. වෙනස්වන සුළුයි. අන්‍යාකාරයට පත්වන සුළුයි. ඔන්න ඔය විධියේ අනිත්‍යානුපස්සනාව - එහෙම පිටින්ම අනිත්‍යානුපස්සනාව ඉදිරිපත් කරන සූත්‍රයක් ඒක. මෙයින් අපට පේනව බුදුරජාණන් වහන්සේ මෙතන පටිච්ච සමුප්පාදයයි මේ සළායතන ආශ්‍රයෙන් ඉදිරිපත් කරල තියෙන්නෙ. ලෝකය ගොඩනැගෙන හැටි . **ගොඩනැගෙන්නෙ, තියෙන දේවල් උඩ නොවෙයි. ඔක්කොම අනිත්‍ය දේවල්. සැලෙන සුළු, වෙනස්වන සුළු, අන්‍යාකාරයට පත්වන සුළු දේවල් උඩයි. මේ ලෝකය ගොඩනැගිල තියෙන්නේ.** මුළු මහත් ලෝක සංඥාව ගොඩනැගිල තියෙන්නෙ. ඒකෙ යටතට්ටුවයි. මේ සූත්‍රයෙන් ප්‍රකාශ කෙරෙන්නෙ. ඒ හැම එකක්ම සැලෙනසුළුයි, වෙනස්වන සුළුයි,අන්‍යාකාරයට පත්වන සුළුයි.

සාමාන්‍යයෙන් දැන් ඔය ඉන්ද්‍රිය සංවරය ගැන කියවෙන සූත්‍රවලින් එහෙම ප්‍රකාශ කෙරෙනව 'න නිමිත්තග්ගාහී නානුව්‍යඤ්ජනග්ගාහී' ආදී වශයෙන්. ඇස් කන් නාසාදියෙන් ලැබෙන අරමුණු පිළිබඳව, නිමිති ගැනීම කියන එක නිත්‍ය සංඥාව නිසා සිදුවන්නක්. එතකොට නිත්‍ය සංඥාව නිසා නිමිති ගැනීමක් වෙනව. ඒ නිමිති ගැනීම නිසාම, අර ආශ්‍රවයන් ගලාගෙන එනව. තණ්හා මාන දිට්ඨි පපංච ගොඩනැහෙනව. මෙන්න මේ විධියටයි ලෝකයක් ගොඩනැහෙන්නෙ. උපාදානස්කන්ධයක් ගොඩනැගෙන්නෙ. ඊළඟට ඒකේ අනිත් පැත්ත බැලුවොත් අපි, අනිමිත්ත

සමාධියට උපකාර වන්නා වූ අනිත්‍යානුපස්සනාවෙන් කෙරෙන්නේ අර නිමිති වලින් මිදීම. ඒ නිමිති වලින් මිදීම සම්මර්ශනය නිසා. අර ඉස්සෙල්ල තිබුනෙ පරාමර්ශනයක්. නිත්‍යසංඥාව නිසා පරාමර්ශනයක්. දැඩිකොට අල්ලා ගැනීමක්. තණ්හා මාන දිට්ඨි වශයෙන් දැඩිකොට අල්ලා ගැනීමක් ඇති වෙනව. පපංච ඇති වෙනව. පපංච සංඛාවලට යටවෙන ස්වභාවයක්. ඒ පපංච සඤ්ඤා නිසා ඇතිවෙන ලෝක නිරුත්ති, ලොක වෝහාර, ලොක පඤ්ඤත්ති වලට යටවෙන ස්වභාවයක් පුද්ගලය තුළ ඇති වෙනව. අනිත් අතට අනිත්‍ය සංඥාව නිසා කෙනෙකු අර නිමිති වලින් මිදීමට පටන් ගන්නව. ආශ්‍රවයන් ගලා ඒම වැළැක්වෙනව. අනිත්‍යානුපස්සනාවෙන් ඒ වගේම තණ්හා මාන දිට්ඨි පපංච අඩුවෙන්න පටන්ගන්නව. අන්න ඒ විධියේ ස්වභාවයක් ඇතිවෙනව. එතකොට නිමිති ගැනීම නිසා, නිත්‍ය සංඥාව නිසා, පරාමර්ශනයක්, අනිත්‍යානුපස්සනාවෙන් කෙරෙන්නෙ සම්මර්ශනයක් - විදර්ශනාවට උපකාරවන්නාවූ දෙයක්. ඔය විධියට කල්පනා කරල බැලුවොත් එතකොට මේ අනිත්‍යානුපස්සනාවෙන්ම මුළුමහත් දුක්ඛ ස්කන්ධයම නැති කරන්නට පුළුවන් බව පෙනී යනව. ඒ වගේ තවත් වටිනා සූත්‍රයක් සඳහන් වෙනව ඛන්ධ සංයුක්තයේ. ඛන්ධ සංයුක්තයේ අනිච්චතා සූත්‍රයේ[2] බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව **'අනිච්ච සඤ්ඤා භික්ඛවෙ භාවිතා බහුලීකතා සබ්බං කාම රාගං පරියාදියති. සබ්බං රූපරාගං පරියාදියති. සබ්බං භවරාගං පරියාදියති. සබ්බ අවිජ්ජං පරියාදියති. සබ්බං අසම්මානං පරියාදියති සමූහනති.'** 'මහණෙනි, අනිත්‍ය සංඥාව වඩන ලද්දේ බහුල වශයෙන් පුරුදු කරන ලද්දේ, සියලු කාමරාගය ගෙවාලයි. සියලු රූප රාගය ගෙවාලයි. සියලු භව රාගය ගෙවාලයි. සියලු අවිද්‍යාව ගෙවාලයි. සියලු අස්මිමානය ගෙවාලයි. මුලිනුපුටා දමයි.' කියල මේ විධියට අනිත්‍යානුපස්සනාවෙන් මුළුමහත් දුක්ඛස්කන්ධයෙන්ම මිදීමට මාර්ගය සැලසෙන බව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා. ඒක අපට පැහැදිලිව පෙනෙනව අර ද්වයං සූත්‍රයෙන් මේ කියාපු 'චල' ස්වභාවය - මෙතන මේ 'චල' 'වය' ආදී වචන වලින් අපට පෙනෙනව මුළු මහත් ඉන්ද්‍රිය ඥාණය ගොඩනැගිල තිබෙන්නේ එක්තරා විධියක විපල්ලාස නිසා. නොපෙනෙන අනිත්‍යතාවක් මේක යටින් තිබෙනව.

කලින් අවස්ථාවකදී - ඇත්ත වශයෙන් දේශනා ගණනාවකදීම - අපට උපමා වශයෙන් ඉදිරිපත් කරන්ට සිද්ධවුණා චලන චිත්‍රය. චලන චිත්‍රය අපිම යොදාපු උපමාවක් නොවෙයි. බුදුරජාණන් වහන්සේගේ උපමාවක් ආශ්‍රයෙන් එක්තරා විධියක නවීකරණයක් හැටියටයි ඉදිරිපත් කළේ. ඒකට අපි උපකාර කරගත්තෙ ගද්දුල සූත්‍රයේ බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලාගෙන් අහන ප්‍රශ්නයක්. 'දිට්ඨං හි වො භික්ඛවෙ චරණං නාම චිත්තං' මහණෙනි නුඹලා චරණ නම් චිත්‍රයක් දැකල තියෙනවද? 'එවං

භන්තෙ' එසේය ස්වාමීනි, ඊළඟට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව 'තම්පි බො භික්ඛවෙ චරණං නාම චිත්තං චිත්තෙනෙව චින්තිතං. තෙන පි බො භික්ඛවෙ චරණෙන චිත්තෙන චිත්තං යෙව චිත්තතරං' මහණෙනි ඒ චරණ නම් චිත්‍රයත් සිතින්ම සිතා ගන්නාලද්දක්. එමනිසා මහණෙනි ඒ චරණ නම් චිත්‍රයටත් වඩා සිතම චිත්‍රතරයි. චිත්‍රතරයි කියන්නෙ විචිත්‍රයි කියන එකයි. සිතෙහිම විචිත්‍රතාවක් තියෙනව. එතකොට ඒ කාලෙ තිබුන චරණ චිත්‍ර කොයි විදියෙ ඒවද කියල අපි දන්නෙ නැහැ. නමුත් මේ කාලෙ තියෙන චරණ චිත්‍රවල නම් ඇත්ත වශයෙන්ම අර විදියෙ අනිත්‍යවූ ඡායාරූප රාශියක අනිත්‍යතාව - ඒවා ශීඝ්‍රාකාරයෙන් පරිවර්තනය වන නිසාම ඒවායේ අනිත්‍යතාව - නොපෙනීයන ස්වභාවයක් ඇති වෙනව. ඒක නිසා අර නිත්‍ය සංඥාවක්, විපල්ලාසයක්, ඇති වෙනව. මේ විපල්ලාස නිසා තමයි ඒ චිත්‍රපට ආදියේ ආස්වාද ලබන්න පුළුවන් විදියේ තත්ත්වයක් තිබෙන්නෙ. ඒ නිත්‍ය සංඥාව නිසා නිමිති ගැනීම, ඒ එක්කම ආශ්‍රවයන් ගලාඒම, ඒ එක්කම ප්‍රපංච ඇති කරගැනීම, පපංචසඤ්ඤා සංඛා වලට යටවීම. මේව තමයි චිත්‍රපටියකින් ලබන විනෝදය. මේ හැම එකකටම උපකාර වන්නේ ඒ චිත්‍රපටියේ සකස්වීම හා සම්බන්ධ අර චලන ස්වරූපය, ඒ එක් එක් චිත්‍රයක සලිතවන ස්වභාවය, ඒවායේ ගෙවීයාම, ඒවායේ අනිත්‍ය ස්වභාවය, ඒවා වෙනස් ආකාරයකට පත්වෙනහැටි, නොපෙනී යාමයි. එතකොට ඒ කෘත්‍රිම දේවල් ආශ්‍රයෙන් අපි උපමාවක් දක්වන නමුත් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව ඇත්ත වශයෙන්ම සිත කොයිතරම් ශීඝ්‍රයෙන් කරකැවෙනවද කියතොත් ඒකට උපමාවකුත් දෙන්න බැහැ කියල.' **'උපමාපි න සුකරා යාව ලහුපරිවත්තං චිත්තං'** කියල එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව[3], උපමාවක් දෙන්න බැරි තරම් වේගයෙන් මේ සිත කරකැවෙනව කියල. ඔන්න එතකොට අර චිත්ත කියන වචනයත් - බොහෝ විට බුදුරජාණන් වහන්සේ වචනවල ප්‍රාසාර්ථය මතු කරනව. එකම වචනය අර්ථ දෙකකින් යොදනව. දැන් චිත්ත කියන එක, 'චිත්තතරං' කියන එක, චිත්‍රය ආශ්‍රයෙන්, විචිත්‍ර කියන වචනයට සම්බන්ධ කළා. ඇත්ත වශයෙන්ම ඒක සහේතුක බව පෙනෙනව අර ද්වයං සූත්‍රයෙන්. ඒ වගේම මේ කියපු චලන චිත්‍ර සමූහයෙන්, අපට ලෝක සංඥාවක් මවාපාන ලෝකයක් මැවීමට උපකාරවන, මේ නිත්‍ය සංඥාව ලැබෙන්නේ. මේ ඇසත් වෙනස්වෙනව. මොහොතක්පාසා පොපියනවා, වෙනස්වෙනව, චලනය වෙනව. ඒ වගේම රූපයනුත් වෙනස් වෙනව. නමුත් ඒවායේ වෙනස්වීම් නොපෙනෙන විදියේ නිත්‍ය සංඥාවක්, විපල්ලාසයක් 'අනිච්චෙ නිච්චසඤ්ඤා' කියන බරපතල විපර්යාසයක්-විපරීත අදහසක්-සංසාරගත සත්ත්වයා තුළ තිබෙනව. අන්න ඒක නිසා තමයි එතකොට මේ මුළු මහත් සළායතනයෙන් අපට ලෝකයක් මැවිල පේන්නෙ.

ඒ මැවිල පෙනෙන ලෝකයේ යට තට්ටුවයි බුදුරජාණන් වහන්සේ මෙතන මතු කරල තියෙන්නෙ. යටටම බැලුවාම, අන්න ද්වයතාව. 'ද්වයං භික්ඛවෙ පටිච්ච විඤ්ඤාණං සම්භොති, විඤ්ඤාණය කියල කියන්නෙ ඒකඝන, තනිකර දෙයක් නෙවෙයි, ආත්මය වගේ. බුද්ධ ධර්මය එහෙම පිටින්ම අර ආත්මවාදී දර්ශන වලින් වෙනස් වෙන්නෙ අන්න ඒක නිසාමයි. විඤ්ඤාණය කියන එක ඒකඝන තනිකර දෙයක් නොවෙයි. විඤ්ඤාණ හයක් ධර්මයේ දැක්වෙනව. චක්ඛු විඤ්ඤාණ, සොත විඤ්ඤාණ, ඝාන විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ, කාය විඤ්ඤාණ, මනො විඤ්ඤාණ වශයෙන්. ඒ හැම විඤ්ඤාණයක්ම අර කියාපු දෙකක් උඩයි ගොඩනැඟිල තියෙන්නෙ. 'චක්ඛුං ච පටිච්ච රූපෙච' කිව්ව වගේම සොතඤ්ච පටිච්ච සද්දෙ ච, ඝානඤ්ච පටිච්ච ගන්ධෙ ච ඒ ආදී වශයෙන් යටත් පිරිසෙයින් මනංච පටිච්ච ධම්මෙච. සිතත් අර වගේම සැලෙනව, මොහොතක් පාසා වෙනස් වෙනව. ඉතාම ශීඝ්‍රාකාරයෙන් අන්‍යාකාරයකට පත්වෙනව. ඊළඟට සිතට අරමුණු හැටියට ගන්න සංකල්පත් ඒ වගේ. අන්න ඒ විධියට ලෝකය එහෙම පිටින්ම ගොඩනැගිල තියෙන්නෙ මේ දෙදරන පොපියන සැලෙන මූල ධර්ම වලින්, එහෙම නැත්නම් මූල ද්‍රව්‍ය සමූහයකින්. ඒකයි බුදුරජාණන් වහන්සේ මෙතෙන්දි මතුකරල තිබෙන්නේ. එතකොට අර අනිත්‍යානුපස්සනාව යම්කිසි කෙනෙක් ඉහලම මට්ටමට දියුණු කරගෙන අර නිමිත්තෙන් පටන් ගෙන අනිමිත්ත තත්ත්වයට සිත නභාගත්ත නම්, එතනම ලෝක නිරෝධය බව අමුතුවෙන් කියන්න ඕන නැහැ. එතකොට අන්න ඒකයි මේ නිවන කියල කියන්නෙ. ප්‍රපංච නිරෝධයත් එතනයි. ප්‍රපංචයන් ගොඩනැහෙන්නෙ, පපඤ්ච සඤ්ඤා සංඛා වලට යට වෙන්නෙ, අර නිත්‍ය සංඥාව නිසා. මේවයින් දේවල් මවල පානව. අර දෙකක් අතර හටන පටන් ගන්නව. එතකොට යටින් තිබෙන්නෙ මේ ද්වයතාව, අනිත්‍ය වූ ඇසත් අනිත්‍ය වූ රූපත් නිත්‍යයි කියල සලකා ගැනීමෙන් තමයි මේ මුළු මහත් අවුලම ඇති වෙන්නෙ. ඇසත් නිත්‍යයි රූපයත් නිත්‍යයයි කියල හිතා ගන්නව. ඒ හිතා ගැනීම නිසාම ඒවායේ ක්ෂණික වෙනස් වීම්, අර 'ලහුපරිවත්තන' ස්වභාවය, නොපෙනී යනව. ඒ නිසාම තණ්හා ලාටුවෙන් අලවල ආශ්‍රවයන්ගෙන් මත්කරල ලෝකයක් මවාපානව. ඔන්න ඔකයි. අපි මේ ලෝකය කියල කියන අපට අතට අහුවෙන, ඇසට පෙනෙන ලෝකය ඔකයි.

එතකොට මෙයින් පෙනෙන්නෙ මේ ලෝකයේ නිස්සාරත්වය. මුළු මහත් සළායතනයෙන්ම ගොඩනැහෙන දේවල් ඒවායේ 'නිෂ්පාදන' වශයෙන් සැළකුවොත් - වෙනින් වචන වලින් ප්‍රකාශ කළොත් දිට්ඨ සුත මුත විඤ්ඤාත - ඒ වචන හතරට ගන්න පුළුවන් මේ සළායතනයෙන් නිෂ්පාදනය වන දේවල්. දිට්ඨ කියල කියන්නෙ දුටු දේවල්, දුටු, ඇසූ, විඳි

(මුත කියල කියන්නෙ නැහැයෙන් දිවෙන් කයෙන් විඳිනු ලබන දේවල්) ඊළඟට - විඤ්ඤාත දැනගත් දේවල්. මේ කියාපු මේ දිට්ඨ සුත මුත විඤ්ඤාත කියන හතරෙහිම හරයක් නැතිබව, අරටුවක් නැති බව, ඒවා නිස්සාර බව, මේ ද්වයං සූත්‍ර ආශ්‍රයෙන් අපට පැහැදිලි වෙනව. මෙන්න මේ නිසාම මේ සළායතන නිරෝධය ප්‍රත්‍යක්ෂ කරගත් තථාගතයන් වහන්සේට එවැනි ඒ සළායතන නිරෝධයක් ගැන කිසිසේත් හිතන්නවත් බැරි, හිතන්නත් බයවෙන, ලෝකය සමඟ අදහස් හුවමාරු කර ගැනීමේදී මහ බරපතල ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිද්ධ උනා. ඒ කියන්නෙ සළායතන නිරෝධයෙන් ලෝක නිරෝධය ප්‍රත්‍යක්ෂ කරගත්තු නිප්පපඤ්ච තත්ත්වයට පත්වුණු තථාගතයන් වහන්සේට ලෝකය, සමඟ අදහස් හුවමාරු කර ගැනීමේදී ඇත්ත මොකක්ද බොරුව මොකක්ද කියන වචන පිළිබඳව එහෙම මහත් ගැටලුවකට මුහුණපාන්න සිද්ධ උනා. ඒක ප්‍රකාශ කරන ඉතාමත්ම වටිනා ශුන්‍යතා ප්‍රතිසංයුක්ත සූත්‍රයක් තිබෙනව අංගුත්තර නිකායෙ චතුක්ක නිපාතයෙ කාලකාරාම සූත්‍රය නමින්.[4]

මේ කාලකාරාම සූත්‍රය බුදුරජාණන් වහන්සේ සාකේත නුවර කාලකාරාමයේදී සංඝයා වහන්සේලාට දේශනා කළ සූත්‍රයක්. මෙන්න මේ විධියටයි ඒ සූත්‍රයේ වැදගත් කොටස සඳහන් වෙන්නෙ.

**'යං භික්ඛවෙ සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා තමහං ජානාමි. 'යං භික්ඛවෙ සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණ බ්‍රාහ්මණියා පජාය සදෙව මනුස්සාය දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා තමහං අබ්භඤ්ඤාසිං තං තථාගතස්ස විදිතං තං තථාගතො න උපට්ඨාසි.**

**යං භික්ඛවෙ සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණ බ්‍රාහ්මණියා පජාය සදෙව මනුස්සාය දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා තමහං න ජානාමීති වදෙය්‍යං තං මම අස්ස මුසා.**

**යං භික්ඛවෙ සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණ බ්‍රාහ්මණියා පජාය සදෙව මනුස්සාය දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා තමහං ජානාමි ච නච ජානාමි ති වදෙය්‍යං තම්පස්ස තාදිසමෙව. තමහං නෙව ජානාමි න න ජානාමීති වදෙය්‍යං තං මම අස්ස කලි. ඉති ඛො භික්ඛවෙ තථාගතො දිට්ඨා දට්ඨබ්බං දිට්ඨං න මඤ්ඤති. අදිට්ඨං න මඤ්ඤති දට්ඨබ්බං න මඤ්ඤති දට්ඨාරං න මඤ්ඤති. සුතා සොතබ්බං සුතං න මඤ්ඤති, අසුතං න මඤ්ඤති සොතබ්බං න මඤ්ඤති සොතාරං න මඤ්ඤති. මුතා මොතබ්බං මුතං න මඤ්ඤති අමුතං න මඤ්ඤති මොතබ්බං න මඤ්ඤති මොතාරං න**

**මඤ්ඤති. විඤ්ඤාතා විඤ්ඤාතබ්බං විඤ්ඤාතං න මඤ්ඤති, අවිඤ්ඤාතං න මඤ්ඤති විඤ්ඤාතබ්බං න මඤ්ඤති විඤ්ඤාතාරං න මඤ්ඤති. ඉති ඛො භික්ඛවෙ තථාගතො දිට්ඨසුත මුත විඤ්ඤාතෙසු ධම්මෙසු තාදී. යෙව තාදී. තම්හා ච පන තාදිම්හා අඤ්ඤො තාදී උත්තරිතරොවා පණීතතරොවා නත්ථීති වදාමි.**

ඊළඟට ගාථා දෙකකුත් සඳහන් වෙනව:

**යං කිඤ්චි දිට්ඨං ච සුතං මුතංවා - අජ්ඣොසිතං සච්ච මුතං පරෙසං**
**න තෙසු තාදී සයසංවුතෙසු - සච්චං මුසා වා පි පරං දහෙය්‍යං**
**එතං ච සල්ලං පටිකච්ච දිස්වා - අජ්ඣොසිතා යත්ථ පජා විසත්තා**
**ජානාමි පස්සාමි තථෙව එතං - අජ්ඣොසිතං නත්ථි තථාගතානං**

බැලුවාම නම් සූත්‍රය කෙටියි, නමුත් මහා ගැඹුරු අර්ථරාශියක් අඩංගුවෙන ශූන්‍යතා ප්‍රතිසංයුක්ත සූත්‍රයක්. මේකෙ ඓතිහාසික පසුබිම වශයෙන්, ශාසනික ඉතිහාසය හා සම්බන්ධ කාරණා කීපයක් අපි කෙටියෙන් නමුත් සඳහන් කරමු මේ විවරණයට බහින්න කලින්. මේ කාලකාරාම සූත්‍රය සම්බන්ධයෙන් ඒ සූත්‍රයේ නම් අහවල් තැන මෙන්න මෙහෙම දේශනා කළැයි කියනව මිසක් වැඩි විස්තර නැහැ. නමුත් අටුවා ආදියෙන් අපට ලැබෙන විස්තර අනුව ඒක දේශනා කරන්ට යෙදුනෙ අනාථපිණ්ඩික සිටාණන්ගෙ දියණියක් වන චූලසුභද්‍රා නැමැති ඒ සොවාන් උපාසිකාව විවාහ වෙලා ගිහිච්ච තැන. තමාගේ මාමණ්ඩිය වන කාලක සිටුවරයා මිථ්‍යා දෘෂ්ටියෙන් මුදාගන්ට පුළුවන් උනා ඒ තැනැත්තියට, බුදුරජාණන් වහන්සේ පිහිට කරගෙන. ඊට පස්සෙ ඒ කාලක සිටාණන් තමාගේ උයනේ මේ කාලාරාමය තනවලා බුදුරජාණන් වහන්සේට පූජා කළා. ඒ වගේම ඒ සාකේත නුවරින් අලුතින් පැවිදිවුන සංඝයා වහන්සෙල ඒ කාලකාරාමයේ රැස්වෙලා මෙතරම් අවේලකයින්ටලැදිව සිටි කාලක සිටාණන් මිථ්‍යාදෘෂ්ටියෙන් මුදවා ගැනීමට හැකිවුනු ඒ බුද්ධ ඥානය, බුද්ධ ගුණය, ගැන කථා කරමින් ඉන්න අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ මේ දේශනාව ප්‍රකාශ කළැයි කියල දක්වන්නෙ. ඒ වගේම අටුවාව කියන හැටියට මේ දේශනාව කොයිතරම් ගැඹුරුද කියතොත් මේ දේශනාවේ ස්ථාන පහක දී - මේ දේශනාව කරගෙන යද්දි තැන් පහකදීම - මහ පොළව කම්පාවුනා කියල කියනව. ඒ වගේම සූත්‍ර දේශනාව අවසානයේ දී එය අසාගෙන සිටි 500 ක් භික්ෂූන් වහන්සේලා රහත්වුනු බවත් ප්‍රකාශ වෙනව. ඊළඟට ශාසන ඉතිහාසය සම්බන්ධයෙන් කල්පනා කරල බලනකොට ධර්මාශෝක රජ්ජුරුවන් ධර්මදූතයන් වහන්සේලා පිටත් කර හරින කොට යෝනක දේශයට වැඩම කළා මහාරක්ඛිත ස්වාමීන් වහන්සේ - යවන දේශය සාමාන්‍යයෙන් සැලකෙන්නේ ග්‍රීසිය හැටියටයි - එතකොට මේ යවන දේශයේ සිටිය ග්‍රීකයින් ඈත අතීතයේ ඉඳලම දාර්ශනික වශයෙන් ලොකු

දියුණුවක් ලබා ගත්තු - මහ දියුණු කළ මොල ඇති අය - ඔවුන්ට පළමුවෙන්ම දේශනාකොට වදාළේ මෙන්න මේ කාලාකාරාම සූත්‍රයයි කියල සඳහන් වෙනව. ඒ කාලකාරාම සූත්‍රයෙන් දේශනා කළ බණ අහල යවනයින්, එහෙම නැත්නම් ග්‍රීකයින්, 37,000 ක් මාර්ගඵල වලට පැමිණි බවත් ප්‍රකාශ වෙනව.

ඒ වගේම මේ ලංකාවේ බුද්ධශාසනය පිහිටෙව්වට පස්සේ සද්ධාතිස්ස රජතුමාගේ කාලයේදී කාල බුද්ධරක්ඛිත ස්වාමීන් වහන්සේ චේතිය පබ්බතයේදී - මිහින්තලේ සෑගිරියේදී - කළුවර පෝදා කළු තිඹිරිගස යටදී මේ කාලාකාරාම සූත්‍රයෙන් මුළු තුන් රැයම ධර්ම දේශනා කළ බවත්, ඒ ධර්ම දේශනාව සද්ධාතිස්ස රජු අහගෙන සිටිය බවත් ජනප්‍රවාදවල ඒ වගේම වංශකථා වල, අටුවා වල, එහෙමත් සඳහන් වෙනව. ඔන්න ඔය කාරණා වලින් අපට පේනව එතකොට මේක අතීතයේ ඉඳලම ගැඹුරු ශූන්‍යතා ප්‍රතිසංයුක්ත සූත්‍රයක් හැටියට සැළකුනු බව. ඒ වගේම තැන් පහකදී පොළාව කම්පාවුන බව ඒ අටුවා ප්‍රකාශ කරනව. ඒ ස්ථාන පහත් අපි මේ සූත්‍රයේ අර්ථය කියන අවස්ථාවේදී තේරුම් ගන්න පුළුවන් වෙනව. දැන් ඊළඟට අර සූත්‍රයේ සිංහල අර්ථය ළංකරගන්න බලමු. නමුත් ඒකත් එක්තරා විධියක ගැටලු සහිත තත්ත්වයක්. මක්නිසාද අර බොහෝ ගැඹුරු සූත්‍රවල සිදුවෙන්න වගේ මේ සූත්‍රයෙත් පාඨාන්තර පිළිබඳ සෑහෙන ව්‍යාකූල තත්ත්වයක් තිබෙනව. අටුවාවට පවා බොහෝවිට විසඳ ගන්න බැහැ. ඒ වගේම නොයෙකුත් මුද්‍රණවල සංස්කරණ වලත් ගැටළු සහිත තැන්, නොපැහැදිලි තැන්, රාශියක් තිබෙනව, මේ සූත්‍රය සම්බන්ධයෙන්. කෙසේ වෙතත් අර්ථානුකූලවන්ට සෑහෙන පමණ පාඨ පිරිසිදු කරගෙන අපි මේක පරිවර්තනය කරන්ට උත්සාහගත්තොත් මෙන්න මේ විධියට ප්‍රකාශ කරන්න පුළුවන්.

'මහණෙනි දෙවියන් මරුන් බඹුන් සහිත, ලෝකයා විසින් මහණ බමුණන් සහිත, දෙව් මිනිසුන් සහිත, ප්‍රජාව විසින් යමක් දක්නා ලදද, අසන ලදද, විඳින ලදද, දැනගන්නා ලදද, සිතින් ගන්නා ලදද සොයා බලන ලදද, කල්පනා කරන ලදද, ඒ හැම මම දනිමි.' අර පළමුවෙනි පාඨයෙන් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ ඒකයි. ලෝකයේ ඇතිතාක් සත්ත්වයින් විසින් 'දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං මනසා' කියන ඒ පද රාශියෙන් හැඳින්වෙන ආකාරයට සළායතනයෙන් යම්තාක් ගතහැකි දැනුම් ඇද්ද, ඒ සියල්ල මම දනිමි කියල බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව.

ඊළඟට දෙවෙනි එකෙන් ප්‍රකාශ කෙරෙන්නේ, 'මහණෙනි දෙවියන් මරුන් බඹුන් සහිත මේ ලෝකයා විසින් මහණ, බමුණන් සහිත දෙව් මිනිසුන් සහිත මේ ප්‍රජාව විසින් 'යමක් දක්නා ලදද, අසන ලදද, විඳින

ලදද, දැනගන්නා ලදද, සොයා බලන ලදද, කල්පනා කරන ලදද, ඒ සියල්ල 'තමහං අබ්භඤ්ඤාසිං' මම විශේෂ වශයෙන් දැනගතිමි. කියන එකයි. 'අභිජානාති' කියන වචනයයි. 'අභි' කියන උපසර්ග පදය මෙතෙන්ට එකතු වීමයි වෙනස තියෙන්නෙ. එය, මම දන්නව පමණක් නොවෙයි වෙසෙසා දනිමි, විශිෂ්ට වශයෙන් දැනගතිමි. ඒ වගේම 'තං තථාගතස්ස විදිතං' එය තථාගතවරයා විසින් තේරුම් ගෙන තිබේ. විදිතං කියල කියන්නෙ ඒක දැනගෙන තිබෙනව, තේරුම්ගෙන තිබෙනව. 'තං තථාගතො න උපට්ඨාසි' නමුත් තථාගත තෙම - මේ 'න උපට්ඨාසි' කියල කියන්නෙ - ඒ දැනුමෙහි එල්බ ගත්තෙ නැහැ. ඒ දැනුම අල්ල ගත්තෙ නැහැ. එහෙම නැත්තම් ඒ දැනුමට සමීපව සිටියෙ නැහැ. මේ කාලෙ දාර්ශනික ව්‍යවහාරය අනුව, ඒ දැනුම පිළිබඳව **'ස්ථාවරයක්'** ගත්තෙ නෑ. ඒ කියන්නෙ ඒවයි එල්බ ගත්තෙ නෑ කියන එකයි. පැලපදියම් උනේ නෑ. 'තථාගතො න උපට්ඨාසි'. ඊළඟට අර කියපු අර සියල්ලම 'මම නොදනිමි' කියල ප්‍රකාශ කළොත් ඒක මගේ බොරුවක් වනු ඇත. 'තං මම අස්ස මුසා' - බැලූ බැල්මට ප්‍රහේලිකා ගොඩක් වගෙයි මේ මුළු සූත්‍රයම. ඊළඟට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව - 'මම එය දනිමි සහ නොදනිමි' කියල ඒ දෙකම කිව්වොත් ඒකත් අර වගේම බොරුවක් වෙනව. ඒ වගේම මම ප්‍රකාශ කළොත් 'මම ඒව දන්නෙත් නැහැ. නොදන්නෙත් නැහැ කියල' ඒකත් මගෙ දෝෂයක් වෙනව. 'තං මම අස්ස කලි'. ඊළඟට 'ඉති ඛො භික්ඛවෙ' මෙසේ මහණෙනි තථාගතො දිට්ඨා දට්ඨබ්බං දිට්ඨං න මඤ්ඤති' දිට්ඨ කියල කියන්නෙ, දැන් දිට්ඨ සුත මුත ආදිය බොහෝ අවස්ථාවල අපට හමුවෙල තියෙනව ඔය බාහිය සූත්‍රයේ එහෙම. දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සති, සුතෙ සුත මත්තං භවිස්සති' ආදී වශයෙන්. අපි කලින් අවස්ථාවක විග්‍රහ කළා ඒවා. ඒකට සමහරවිට සිංහල වචනයක් පවා සොයන්න අමාරුයි. අර ආත්මවාදය ඉවත් කරල 'දුටුව' 'දුටු දෙය' කියල කිව්ව හැටියෙ ඒකට අහුවෙන ස්වභාවයක් තියෙනව. 'දිට්ඨ' කියල කියන එක සාමාන්‍යයෙන් දුටුදෙය කියලයි ව්‍යවහාර කරන්නෙ. නමුත් ඊටත් වඩා මෙතන ප්‍රාථමික අර්ථයක් යෙදෙන්නෙ. 'දිට්ඨා දට්ඨබ්බං දිට්ඨං න මඤ්ඤති' - මෙතන කියැවෙන්නෙ **ඒ දැකීම් මාත්‍රය** ඇත්ත වශයෙන් අර දිට්ඨෙ දිට්ඨමත්තං කියන අදහසයි මෙතන ප්‍රකාශ කෙරෙන්නෙ. 'දිට්ඨා දට්ඨබ්බං දිට්ඨං න මඤ්ඤති' තථාගත තෙම එය හුදු 'දිට්ඨයක්' මිසක් දැකිය යුත්තක් හැටියට මඤ්ඤනා කරන්නෙ නැහැ. සිතන්නෙ නැහැ. මේ මඤ්ඤනා කියන වචනයත් අපට අර බාහිය, මූලපරියාය ආදී සූත්‍ර වලින් හුරුපුරුදු වචනයක්. තණ්හා මාන දිට්ඨි වශයෙන් අර සක්කාය දිට්ඨිය අනුව මඤ්ඤනා කරන්නෙ නැහැ. එතකොට හුදු දැකීම් මාත්‍රයෙන් වෙන්වූ දැකිය යුතු දැකීමක් ඇතැයි තථාගතයන් වහන්සේ නොහඟියි. ඒ වගේම අදිට්ඨං න මඤ්ඤති - නුදුටුවක් ලෙස ද

නොහඟියි. ඊළඟට, දට්ඨබ්බං න මඤ්ඤති දැකිය යුතු යයි නොහඟියි, දැකිය යුත්තකැයි නොහඟියි. දට්ඨාරං න මඤ්ඤති - දකින්නෙක් ඇතැයි නොහඟියි. දකින කෙනෙක් ඉන්නව කියලත් මඤ්ඤනා කරන්නෙ නැහැ. ඒ වගේම සුතයක් පිළිබඳව - ඇහුදේ පිළිබඳව ප්‍රකාශ කරනව. 'සුතා සොතබ්බං සුතං න මඤ්ඤති' හුදු ඇසීම් මාත්‍රය මිසක් ඇසියයුතු ඇසුමක් ඇතැයි තථාගතයන් වහන්සේ නොහඟියි. 'අසුතං න මඤ්ඤති' නොඇසූ හැටියටත් - 'ඒක මං ඇහුවෙ නැහැ' කියල කියන්නෙත් නැහැ. අර ප්‍රඥාව නිසා ඒක මට ඇහුනෙ නැහැ කියලත් කියන්න බැරි තත්ත්වයක් තියෙනව. නොඇසුව හැටියටත් නොහඟියි. 'සොතබ්බං න මඤ්ඤති' ඇසිය යුත්තකැයි නොහඟියි. 'සොතාරං න මඤ්ඤති' අසන්නෙකු ඇතැයි ද නොහඟියි. ඒ විධියටම මුතය ගැන. මුත කියල කියන්නෙ නැහැයෙන් දිවෙන් කයෙන් ගන්න ඒ අරමුණු - 'මුතා මොතබ්බං මුතං න මඤ්ඤති' ඒ විධියෙ දැනුනු දේවල්, එහෙම නැත්තම් විඳි දේවල් පිළිබඳව කියනවනම් ඒ වින්දනයෙන් තොර විඳිය යුතු විඳීමක් ඇතැයි නොහඟියි. 'අමුතං න මඤ්ඤති' ඒ වගේම නොවිඳි බවක් ද නොහඟියි. 'මොතබ්බං න මඤ්ඤති' විඳිය යුත්තක් හැටියටද නොහඟියි. 'මොතාරං න මඤ්ඤති' විඳින කෙනෙක් ගැනද නොහඟියි. ඒ වගේම 'විඤ්ඤාතා විඤ්ඤාතබ්බං විඤ්ඤාතං න මඤ්ඤති' දැන ගැනීමෙන් තොර දැනගත යුතු දැනුමක් ඇතැයි ද නොහඟියි. දැන නොගත් බවක් ද නොහඟියි. දැනගත යුත්තෙකැයිද නොහඟියි. දැනගන්න කෙනෙක් පිළිබඳවද මඤ්ඤනාවක් ඇතිකර නොගනී. කියල ඔය විධියට ප්‍රකාශ කරල, ඊළඟට ඉති ඛො භික්ඛවෙ තථාගතො දිට්ඨ සුත මුත විඤ්ඤාතබ්බෙසු ධම්මෙසු තාදී යෙව තාදී'. මෙසේ මහණෙනි, තථාගත තෙම දිට්ඨ සුත මුත විඤ්ඤාත ආදිය පිළිබඳව තාදී සේක්ම තාදීය. මේ 'තාදී' කියන වචනයත් අපි පසුගිය දේශනා ගණනාවකම ප්‍රකාශ කළා. අපි සිංහල වචනයක් ඒකට පහසුව තකා පාවිච්චි කරනව. - ඒ 'එහෙවු බව' එහෙම නැත්තම් එසේ වූ ස්වභාවය. ඒ තාදී ගුණය රහතන්වහන්සේ පිළිබඳව ප්‍රකාශ කරනව අෂ්ට ලෝක ධර්මයෙන් කම්පා නොවන ස්ථිරසාර බව ආදී ඒ ගුණ සමුදාය, නමුත් ඒකට ප්‍රධාන හේතුව මොකක්ද, 'අතම්මයතාව'. ඒ එකක්වත් අල්ලා නොගැනීම නිසා. මේක මගේය කියල අල්ලා නොගැනීම නිසයි අර තාදී බව ලැබෙන්නේ. ඒකයි වෙනස තිබෙන්නේ. එතකොට තාදී සේක්ම තාදීය. මේ දිට්ඨ සුත මුත විඤ්ඤාත පිළිබඳව - තථාගතයන් වහන්සේ මේ හැම එකක්ම පිළිබඳවම - තාදී ගුණයෙන් යුක්තය. තාදී සේක්ම තාදීය. 'තම්හාව පන තාදිම්හා' ඒ තාදී පුද්ගලයාට වඩා උත්තරීතර වූ ප්‍රණීතතර වූ තාදී කෙනෙක් නැතැයි කියමි, කියල එහෙම ප්‍රකාශ කරල ඊළඟට ගාථා දෙකක් වදාරනවා.

**'යං කිඤ්චි දිට්ඨං ව සුතං මුතං වා - අජ්ඣොසිතං සච්චමුතං පරෙසං**
**න තෙසු තාදී සයසංවුතෙසු - සච්චං මුසා වාපි පරං දහෙය්‍යං'**

අන්‍යයන් විසින් දකින ලද, අසන ලද, විඳින ලද, 'අජ්ඣොසිතං සච්ච මුතං' ඒ වගේම එල්බ ගන්නා ලද, සත්‍යයැයි හඟිනා ලද, යමක් වේද, ඒ කිසිවක් පිළිබඳව 'න තෙසු තාදී සයසංවුතෙසු' ඒ ඔවුනොවුන්ගේ දෘෂ්ටි වල කොටුවූ ඒ දෘෂ්ටි වාද පිළිබඳව තථාගතයන් වහන්සේ 'සච්චං මුසා වාපි පරං දහෙය්‍යං' අනෙකා සත්‍යය කියනවා කියා හෝ බොරුව කියනව කියා හෝ මම නොදරමි.'

තථාගතයන් වහන්සේ ඒක ඒකාන්ත සත්‍යයක් හෝ ඒකාන්ත මුසාවක් වශයෙන් හෝ ප්‍රකාශ කරන්නෙ නැත. මක් නිසාද, **'එතඤ්ච සල්ලං පටිකච්ච දිස්වා - අජ්ඣොසිතා යත්ථ පජා විසත්තා'** ලෝකයේ සත්ත්වයා ඇමිණී සිටින, ඇලී සිටින, මේ උල - මේ දෘෂ්ටි උල - අර අන්තගාමී දෘෂ්ටි උල - කලින්ම දැකල **'ජානාමි පස්සාමි තථෙව එතං - අජ්ඣොසිතං නත්ථි තථාගතානං'** මම දනිමි, මම දකිමි, එය එසේම යැයි යන දෘෂ්ටි වශයෙන් එල්බ ගෙන ප්‍රකාශ කරන අදහසක් තථාගතවරයා තුළ නැත. 'අජ්ඣොසිතං නත්ථි තථාගතානං' දෘෂ්ටි වශයෙන් ගත්තු යමක් තථාගතයන් වහන්සේ තුළ නැත.

දැන් එතකොට මේක තව අපට පිරිසිදු කර ගන්න සිද්ධ වෙනව, මේ සූත්‍රයේ මූලික සැකිල්ල විතරයි ඇත්ත වශයෙන් අපි දුන්නෙ. යම්කිසි පරිවර්තනයක් මේකට පළමුවෙන් ආධාර කරගත යුතු නිසා. නමුත් මේක ඇතුළේ තිබෙන පද සමූහය තුළ අර්ථ රාශියක් ගැබ්වෙල තියෙනව. මූලිකව අපට හිතා ගන්න පුළුවනි. දැන් මෙතැනින් ප්‍රකාශ කරන්නෙ ප්‍රධාන වශයෙන්ම මිථ්‍යාදෘෂ්ටිකයින්, එහෙම නැත්නම් අප කියන්නෙ අන්තගාමී දෘෂ්ටිකයින්, අර අන්‍යදෘෂ්ටික තීර්ථකයින්, එහෙම නැත්නම් ශාස්වත උච්ඡෙද දෘෂ්ටිවාදීන්, ගන්නා විධියේ ආකල්පයක් නොවෙයි තථාගතයන් වහන්සේ තුළ තිබෙන්නෙ. ඊට වඩා එහෙම පිටින්ම වෙනස් ආකල්පයක්.

ඒක අපට හෙළිවෙනව මේ සූත්‍රයේ අර ප්‍රහේලිකා විධියේ මුල්කොටසින්. තථාගතයන් වහන්සේ ලොකු ප්‍රහේලිකාවකට මුහුණ දීපු ආකාරයයි මුල් පද වලින් ප්‍රකාශ වෙන්නෙ. මක්නිසාද, දෙවියන් මරුන් බඹුන් සහිත මේ ලෝකයා විසින් දෙව් මිනිසුන් සහිත ප්‍රජාව විසින්, දකින ලද, අසන ලද, විඳින ලද, කල්පනා කරල ලද, සිතින් සොයා බලන ලද, යමක් වේද, ඒ සියල්ල මම දනිමි කියල බුදුරජාණන් වහන්සේ ඉස්සෙල්ලා ප්‍රකාශ කරනව. ඊළඟට දෙවෙනි වර ප්‍රකාශ කරනව ඒ සියල්ල මම 'අබ්භඤ්ඤාසිං' -එපමණක් නොවෙයි ඒ සියල්ල මම තේරුම් ගත්තය කියලත් ප්‍රකාශ කරනව. නමුත් තේරුම් ගත්තට මොකද ඒ දිට්ඨ සුත මුත ආදිය පිළිබඳව ඇඩිච ගැනීමක් තථාගතයන් වහන්සේ තුළ නැහැ.

යම්කිසි කෙනෙක් යම්කිසි දෙයක්, අර දෘෂ්ටි වාදීන් ප්‍රකාශ කරන අන්දමට, සම්පූර්ණයෙන් තේරුම් ගත්ත නම්, එහි එල්බ ගත යුතුව තිබෙනව. නමුත් තථාගතයන් වහන්සේ මෙතන 'න උපට්ඨාසි' කියල ප්‍රකාශ කරනව. මෙතනම ලොකු ගැටළුවක්, ඒ වගේම මේ දේශනාව තුළින්ම අපට පේනව කලින් සාකච්ඡා කළ අව්‍යාකත වත්ථු පිළිබඳ ප්‍රශ්න. ඒ ප්‍රශ්න වලට තරමක සමානත්වයක් මෙතන තියෙනව. අව්‍යාකත වත්ථු නමින් අපි කලින් සාකච්ඡා කළ, 'හොති තථාගතො පරම්මරණා, න හොති තථාගතො පරම්මරණා, හොතිච න හොතිච තථාගතො පරම්මරණා, නෙව හොති න න හොති තථාගතො පරම්මරණා කියල චතුෂ්කොටික - සතර කොන් තර්ක න්‍යායයක් තිබෙනව. ඒ තර්ක න්‍යායයට තරමක සමානත්වයක් මේ සූත්‍රයේ තිබෙනව. නමුත් මෙතන අමුත්ත තියෙන්නෙ අර මුල් කොටසෙ. සාමාන්‍යයෙන් චතුෂ්කෝටික තර්කයක, සතරකොන් තර්කයක, මුල් විකල්පය ප්‍රතික්ෂේප කෙරෙනව. මුල් විකල්පය 'හොති තථාගතො පරම්මරණා' ඊළඟට 'න හොති තථාගතො පරම්මරණා'. ඒ විධියේ එකක්වත් පිළිගන්න බැරි විධියේ තත්ත්වයක් ප්‍රකාශ කරනව. නමුත් මෙතෙන්දි පළමුවෙන්ම බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නෙ ඒ සියල්ල මම දනිමි. ඊළඟට එය වඩා විශේෂ වශයෙන් දැන ගතිමි. නමුත්, ඒ තේරුම් ගත්ත නිසාම ඒව පිළිබඳව දෘෂ්ටිග්‍රාහයෙන් ගන්නෙ නැහැ. මෙන්න මෙතන ලොකු ගැටලුවක් තියෙනව. මෙතෙන්දි අපට හිතාගන්න තියෙන්නෙ අර මූල පරියාය සූත්‍රයේ - අපි කලින් අවසථාවක විග්‍රහකළ මූල පරියාය සූත්‍රයේ - දැනීම් මට්ටම් දෙකක් සඳහන් කරල තියෙනව. 'සඤ්ජානාති, අභිජානාති' කියල. ඒකට නිදසුනක් කියනවනම් 'අස්සුතවා පුථුජ්ජනො පඨවිං පඨවිතො සඤ්ජානාති, පඨවිං පඨවිතො සඤ්ඤත්වා, පඨවිං මඤ්ඤති. පඨවියා මඤ්ඤති. පඨවිං මෙති මඤ්ඤති. පඨවිං අභිනන්දති, අශ්‍රැතවත් පෘථග්ජනය පඨවිය පිළිබඳව සඤ්ඤා වශයෙනුයි දැන ගන්නෙ - 'සඤ්ජානාති' ඒකත් එක්තරා දැනගැනීමක් තමයි. දැනීම් මට්ටම් වලින් ඉතාම පහත්ම එක තමයි මේ සංඥා වලින් දැන ගන්න එක. එච්චරයි තියෙන්නෙ අශ්‍රැතවත් පෘථග්ජනයට. එහෙම සංඥාවෙන් දැනගත්තට පස්සෙ ඒ තැනැත්ත මොකද කරන්නෙ. පඨවිය පඨවියමයි කියල හිතාගෙන පඨවිය ඇත්ත වශයෙන්ම තියෙන දෙයක් හැටියට මඤ්ඤනා කරනව තණ්හා, මාන, දිට්ඨි වශයෙන්. 'පඨවියා මඤ්ඤති.' ඊළඟට අර ව්‍යාකරණ රටාව අනුව 'පඨවියෙහි' යයි හඟියි, 'පඨවියෙන්' යයි හඟියි, 'පඨවිය මගේ' යයි හඟියි, පඨවිය පිළිබඳව අභිනන්දනය ඇතිකර ගනියි. අන්න ඒක එක්තරා පහළ දැනීම් මට්ටමක්. ඊළඟට තථාගතයන් වහන්සේ පිළිබඳව මූල පරියාය සූත්‍රයේ ප්‍රකාශ කෙරෙන්නෙ 'පඨවිං පඨවිතො අභිජානාති පඨවිං පඨවිතො අභිඤ්ඤාය පඨවිං න මඤ්ඤති පඨවියා න මඤ්ඤති, පඨවිතො න මඤ්ඤති පඨවිං

මෙති න මඤ්ඤති, පඨවිං නාභිනන්දති. අර අභිජානාති කියන පදයෙන් කියවෙන විධියෙ විශිෂ්ට ඤාණයකින් අවබෝධ කරගත් තථාගතයන් වහන්සේ ඒ පඨවිය පිළිබඳව මඤ්ඤනාවක් ඇතිකර ගන්න නැහැ. ඒ වගේම අර ව්‍යාකරණ රටාවට වහල්ව 'පඨවියෙහි' 'පඨවියෙන්' ආදී වශයෙන් හිතන්නෙ නැහැ. ඔය වෙනසයි මෙතනත් දක්වල තියෙන්නෙ. තථාගතයන් වහන්සේ ඉස්සෙල්ල ප්‍රකාශ කරනව 'මම ඒව දන්නව,' මම ඒව දන්නව පමණක් නොවේ, මම ඒව හොඳටම තේරුම් ගත්ත. මම ඒව හොඳටම තේරුම්ගත්ත **නිසාම** මම ඒවාට හේත්තු වෙන්නෙ නැහැ. ඒව පිළිබඳව ස්ථාවරයක් ගන්නෙ නැහැ. අන්න ඒ විධියටයි අපට ගන්න තියෙන්නෙ මුල් කොටස. මේක මහ ගැටළු විදියටයි, තේරුම් ගන්න බැරි විධියටයි පෙන්නුම් කරල තියෙන්නෙ මේ සූත්‍රයෙ.

**එතකොට අන්න ඒ විධියේ තත්ත්වයක් නිසාම තමයි** දෙවනුව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නෙ යම්කිසි විධියකින් මම කිව්වොත් මේ ලෝකයා විසින් දක්නා ලද අසන ලද මේ සියල්ලම නොදනිමියි කියල ඒක මගේ බොරුවක් වනු ඇත. එතකොට නොදනිමි කියලත් කියන්න බැහැ. තථාගතයන් වහන්සේ මේව දෘෂ්ටි වශයෙන් අල්ල ගන්නෙ නැත්තෙ මේව නොදන්න නිසාද කියල කෙනෙක් ඇහුවොත් ඒකටත් ඔව්ය කියල කියන්න බැහැ. අන්න ඒ විධියෙ තත්ත්වයක් තියෙන්නෙ. ඇත්ත වශයෙන්ම **ඒව තේරුම් ගත්තු නිසාමයි**. ඒව අල්ල ගන්නෙ නැත්තෙ. ඒකයි එය නොදනිමියි කියලත් තථාගතයන් වහන්සේට කියන්න බැරි. ලෝකයා අසන ප්‍රශ්නයට ඒ විධියේ පිළිතුරු දෙන්න බැරි. නමුත් ලෝකයා කල්පනා කරන්නෙ ඒව දන්නව නම් ඒව අල්ල ගන්න ඕනෙයි කියල. ඒව පිළිබඳව දෘෂ්ටිග්‍රාහයෙන් ගතයුතුය කියන එකයි ලෝකයාගේ අදහස. ඒ වගේම 'තමහං ජානාමි ච න ජානාමි' මම ඒව දන්නව සහ නොදන්නව කියල කීවොත් ඒකත් අර වගේම බොරුවක් වෙනව. ඊළඟට 'නෙව ජානාමි න න ජානාමි.' 'දන්නෙත් නැත නොදන්නෙත් නැත'. කිව්වොත් ඒකත් අර වගේම දෝෂයක් වෙනව. ඔන්න ඔය විධියටයි මුල් කොටස අපට තේරුම් ගන්න පුළුවන් වෙන්නෙ.

අටුවාවෙ දක්වනව ඇත්ත වශයෙන්ම පොළොව කම්පාවුනා කියල. අවස්ථා පහක් එතන දක්වනව. බුදුරජාණන් වහන්සේ 'ජානාමි, අබ්භඤ්ඤාසිං, විදිතං' යන පද තුනෙන් දක්වන තමන්ගේ ඒ බුද්ධඥානයෙන් ඒව සියල්ල අවබෝධ කරගත්තු බව ප්‍රකාශ කරන පද තුනට අටුවාව සඳහන් කරනව ඒක 'සබ්බඤ්ඤුතභූමිය ය' කියල. බුදුරජාණන් වහන්සේගේ සර්වඥතාඥානය ප්‍රකාශ කෙරෙන කොටසයි, 'සබ්බඤ්ඤුතභූමි' කියල කිව්වෙ. දනිමි, වෙසෙසා දනිමි ඒවා තේරුම් ගන්නා ලදී, කියන පද තුන

සබ්බඤ්ඤුතභූමි නමින් අටුවාවෙ පෙන්නුම් කරනව. ඒ කොටස ප්‍රකාශ කරල ඉවරවෙනකොටමත් පොළව කම්පා උනා කියල දක්වනව.

ඊළඟට 'න උපට්ඨාසි' කියන එක අටුවාවෙ තෝරන්නෙ 'ඛීණාසව භූමි' හැටියට. ඒව දෘෂ්ටි ග්‍රාහයෙන් අල්ල ගන්නෙ නැත්තෙ මක්නිසාද, තථාගතයන් වහන්සේට ආශ්‍රවයන් නැති නිසයි. තණ්හා, මාන, දිට්ඨි වශයෙන් ඒව අල්ල ගන්නෙ නැහැ. ඒක ප්‍රකාශ කෙරෙන්නෙ 'න උපට්ඨාසි' කියන පදයෙන්. දිට්ඨ සුත මුත ආදිය පිළිබඳව ස්ථාවරයක් ගන්නෙ නැහැ. ඒවට හේත්තු වෙන්නෙ නැහැ. එල්බ ගන්නෙ නැහැ කියන එකයි......

# අධෝලිපි

1. සං.නි. IV බු.ජ. 16-148
2. සං.නි. III බු.ජ. 15-266 පිට
3. අං.නි. I බු.ජ. 18-18 පිටුව.
4. අං.නි. II බු.ජ. 19-50 පිටුව.